**2021දෙසැම්බර් මස 02 වන දින පෙරවරු 9.30**
**ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී**
**පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ**
**මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දූ නිරෝෂණ මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |

26. මහා නගර සභා මන්ත්‍රී - එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - ජී.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය
28. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
29. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා
30. මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා
31. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
32. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා
33. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
34. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා
35. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ජී.දෝන දිලාශිනී මහත්මිය
36. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
37. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා
38. මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය
39. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
40. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
41. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
42. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
43. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය
44. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
45. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
46. මහා නගර සභා මන්ත්‍රී - ජී.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
47. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2021.12.02 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනීම හා සළකා බැලීම.</u>

2021.11.05 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී,ජී.සුරංග එන් අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2021.11.05 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව පිළිගතයුතු යැයි මා යෝජනා කර සිටිනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,පසුගිය මහ සභාවේ වාර්තාව පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණේ අපට බරපතල විවේචනයක් සහ ඒ වාර්තාව පිලිබඳව අපි අපේ විරෝධය පල කරනවා. පසුගිය සභාවේ ඔබතුමා විසින් සභාව අවසානයේදී ප්‍රකාශයක් නිකුත් කලා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් විසින් කරනු ලැබූ සියලු ප්‍රකාශයන් සහ ජන්ද ප්‍රකාශ කිරීම් අවලංගු කරන්න එයට හේතුව ලෙස ඔබ දැක්වූයේ අප නියමිත අසුන් වල නොසිටිය බව. එනමුත් සභාව අවසානයේ මේ පිලිබඳ නියෝගයක් නිකුත් කිරීම බරපතල වංචා සහගත කරණයක් බව අපි ප්‍රකාශ කරනවා ඔබ මේ සභාවේ මුලසුනේ සිටින ප්‍රධානියා ලෙස අපෙන් එවැනි රෙගුලාසි උල්ලංඝනය වීමක් වෙනවා නම් ඒ පිලිබඳව ඔබට මුලින්ම දැනුවත් කරන්න තිබුනා. හැබැයි ඔබ එසේ කලේ නැහැ. ඒ විතරක් නොවෙයි ගරු නගරාධිපතිතුමනි මේ සභාවේ අසුන් පනවන්නේ ජ්‍යෝෂ්ඨත්වය මත. හැබැයි අපි සභාවේ ඒකමතිකව සභාවේ එකඟතාවය මත අපි කාලාන්තරයක් තිස්සේ මේ සභාවේ පක්ෂ විදියට අසුන් ගත්තා ඒ සභාවේ එකඟතාවය. එවැනි තත්වයක් තිබියදී ඔබ මෙවැනි ප්‍රකාශයක් සභාව අවසානයේ කිරීම යුක්ති සහගත නැහැ. ඒ විතරක් නොවෙයි මීට අවස්ථා දෙකකදී නිශාන්ත ප්‍රදිනාන්දු අපේ කණ්ඩායම් නායක සහෝදරයා සභාවට නොපැමිනි අවස්ථා දෙකකදීත් අපි මේ ආකාරයෙන්ම අසුන් වල වාඩිවුනා. මම ඔහුගේ අසුනේ අසුන් ගත්තා ප්‍රභාෂිනි මන්ත්‍රීතුමිය මා අසුනේ අසුන් ගත්තා. හැබැයි ඒ අවස්ථාවලදී කිසිදු ගැටලුවක් මතුවුනෙක් නැහැ සභාවට මතු වුනෙත් නැහැ. දැන් ගරු නගරාධිපතිතුමනි මේ වාර්තාවට අනුව ජනතා විමුක්ති පෙරමුණේ සියලු ප්‍රකාශයන් ජන්ද ප්‍රකාශ කිරීම් අවලංගු කරලා. මට එහා පැත්තේ ඉන්නේ රංගන මන්ත්‍රීතුමා ඔහු හිටියේ ඔහුගේ අසුනේ. ඔබ ඔය කියන තර්කය ගොඩනගනවා නම් හැබැයි ඔහුගේ ජන්දය විමසීමත් අහෝසි කරලා. මේකෙන් පෙන්නුම් කරන්නේ ඔබේ තියෙන වංචා සහගත කම සහ ඒකාධිපතිකම කියන එක තමයි අපට පේන්නේ. ඒ නිසා තවදුරටත් මෙවැනි කටයුතු වලින් ජනතා විමුක්ති පෙරමුණේ හඬ ඔබට නවත්වන්න බැහැ. අපි අපේ හඬ දිගටම ගෙනියනවා. මේ වාර්තාවට ජනතා විමුක්ති පෙරමුණ විදියට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා ඒකට අදාල පැමිණිල්ලක් ලිඛිතව මා විසින් පලාත්පාලන කොමසාරිස්තුමාට මේ සිද්දිය සිදුවූ වහාම ඉදිරිපත් කලා හැබැයි අද වෙනකම් කිසිදු විමර්ෂණයක් සිදුවුනේ නැහැ. නිලධාරිනුත් අසරණ වෙලා තියෙන්නේ. අපේ සභාවේ සිටින නිලධාරින් වගේම ඒ නිලධාරිනුත් අසරණ වෙලා සිටින්නේ මේ දේශපාලන යාන්ත්‍රණයට යටවෙලා.ඒ නිසා අපි නැවතත් මේ වාර්තාවට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිණී පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගිය සභා වාර්තාවේ මගේ කථාවේ අඩුවක් සිදු වෙලා තියෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, පසුගිය වාර්තාවේ මා විසින් ඉදිරිපත් කරන ලද යම්කිසි කොටසක් අඩුවෙන් තමයි වාර්තා ගත වෙලා තියෙන්නේ.හැමදාම අපිට ඔබ තත්වය තිබෙනවා අපි කථා කරන එක් විඩියෝ ගත කරලා තබා ගන්නවා අපි කථා කරන දේ හැන්සාඩ් වෙන්නේ නැහැ. ඒක තත්වය ඉදිරියේදි වෙනස් විය යුතුයි කියන යෝජනාවත් එක්කම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා සංශෝධනය කරන ලෙස.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, මහ සභා වාර්තාවට ජන්ද විමසීමක් නැහැ , විරුද්ධ විමක් කාටවත් වෙන්න බැහැ සංශෝධන විතරයි කරන්න පුලුවන්. ඒ වගේම මහ සභා වාර්තාව කියන්නේ තමන් කියපු දෙයක් සඳහන් වෙලා නැත්නම්, නොකියපු දෙයක් සඳහන් වෙලා තියෙනවා නම් නිවැරදිව ඉදිරිපත් කල යුතුයි. වාර්තාවක සම්පූර්ණ විස්තරය දෙන්න ගියොත් මේ මහ සභා වාර්තාව ලොකු වාර්තාවක් වෙයි. ඒක නිසා මෙය පාර්ලිමේන්තුවේ, පලාත් සභාවේ හැමතැනම ක්‍රියාත්මක වෙනවා මොරටුව මහ නගර සභාවේ විතරක් නොවෙයි ලංකාවේම සම්පින්ඩනයක් අවශ්‍ය වෙන්නාවූ දේ පමණක් පමණයි දෙන්නේ. අවශ්‍ය දේට ඇරෙන්න වෙන මුකුත් වාර්තාවට ඇතුලත් කරනන් බැහැ යම් විදියටකට අවශ්‍යම වෙන දෙයක් තියෙනවා නම් ඒක ඇතුලත් නොවි තිබෙනවා නම් අවශ්‍යතාවය මොකක්ද කියලා කිව්වම සභාවට අදාල වෙනවා නම් සංශෝධනය කරන්න පුලුවන් ඒ ඇරෙන්න සියලුම දේ ඇතුලත් කරන්න වාර්තාවක් නිකුත් කරන්න මම නොවෙයි කවුරු නගරාධිපති වුනත් ඒක කරන්න බැහැ අපිට සභාවල් පවත්වන්න දිලා තියෙන උපදෙස් අනුව අපිට එස් 5 ක්‍රියාත්මක කිරිම තුලම කියලා තියෙනවා සමහර වෙලාවට අදාල වෙන්නාවූ වාර්තාවල් සභාවකට අවශ්‍ය වෙන්නාවූ දේ පමණක් ඇතුලත් කරමින් ඒ කටයුත්ත කරන්න කියලා. ඔබතුමියගේ කථාවේදි ඒකට අඩුපාඩුවක් වෙලා තියෙනවා නම් සංශෝධනය කරන්න.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම යම් ඉල්ලිමක් කලා ඔබතුමාගෙන් නමක් අයින් කිරිම සම්බන්ධයෙන් ඔබතුමා නියෝගයක් දුන්නා ඒක අයින් කරන්න කියලා ඒක සඳහන් වෙලා නැහැ ගරු නගරාධිපතිතුමා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, එය නිවැරදි කිරිම කරන්න නියෝගයක් කලා.

මහා නගර සභා මන්ත්‍රි එච්.ප්‍රදීප් ශ්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021.11.05 දින පැවති මහ සභා වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u>

### 2(1) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, විශේෂයෙන්ම මේ මොහොත වෙද්දි පලාත් පාලන කොමසාරිස්, සහකාර කොමසාරිස් දේශපාලනයට නතු වෙලාද කියන එක පැහැදිලි වෙනවා ඔබගේ ටේබල් කරලා තියෙන ලේඛණයත් එක්ක නතු වෙලාද කියලා පේනවා. එමනිසා මේ පිලිබදව මම විදිමත් විදියට කටයුතු කිරිම සඳහා පැමිණි නිලධාරින් ගෙන් මම ලබාගත් ලේඛණ ඔබ ඉදිරියේ තබලා තියෙනවා ඒක නිවේදන යටතේ මම ඉදිරිපත් කරනවා.

## 03. <u>සභාව අමතා ඒවන ලද ආයාචනා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

### 03(1) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රී, පලමුව මම සියලු දෙනාගෙන් අවසර ඉල්ලනවා මෙය ඉදිරිපත් කිරිම සඳහා හේතුව 2021.07.13 වන දින ඔබ ඉදිරියේ තිබෙන ඔය ලියවිල්ල අතිගරු ජනාධිපතිතුමා, ජනාධිපති ලේකම් කාර්යාලය,කොළඹ. කියලා නීතිඥ ප්‍රේමනාත් සී දොලවත්ත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා කොළඹ දිස්ත්‍රික්කය එතුමා ලියන ලිපියේ පැහැදිලිවම මොරටුව මහ නගර සභාවට අයත් මාතෘ ආදාහනාගාර මෙහෙයවන විට ඉතාමත්ම විශාල අක්‍රමිකතා රැසක් මැද සිදුවන බව මොරටුව මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ඩී.සමන්ත සිල්වා මහතා විසින් දැනුම් දෙන ලද කියන කාරණය අනුව මේ සඳහා

විමර්ෂණයකට නිලධාරින් පැමිණියා. මේ පැමිණුන මොහොතේ ඒ නිලධාරියාගේ සන්තකයේ තිබෙන්නාවූ ඒ ලේඛණ අනුව තමයි මම මේක සභාවට ඉදිරිපත් කිරිම සිදු කරන්නේ. මම මව්තයට පත්වෙනවා හේතුව අක්‍රමිකතා වෙන එක මොකක්ද? එහෙම නැත්නම් ඒ අක්‍රමිකතා එක්කම සිදු වෙන්නාවූ කාරණය මොකක්ද? කියන එක මට පොඩි අපැහැදිලි කමක් තියෙනවා. ඒ නිසාම මම පොඩි විස්තරයක් ගත්තා මේ අක්‍රමිකතා සිදු වෙනවායි කියන අදාහනාගාරයන් සඳහා මෙන්න මේ ආකාරයෙන් දේහයන් ආදාහන කටයුතු සිදු කරලා තියෙනවා අදාල වෙන්නාවූ මැෂින් තුලින්. ජනවාරි මාසයේ රාවතාවත්ත සාමාන්‍ය 29 යි, පෙබරවාරි මාසේ 35යි, මාර්තු මාසේ 23 යි, අප්‍රේල් මාසේ 37 යි, මැයි මාසේ 30 යි, ජුනි මාසේ 20 යි, ජුලි මාසේ 34, අගෝස්තු මාසේ 38,සැප්තැම්බර් මාසේ 33, ඔක්තෝම්බර් මාසේ 27 යි, නොවැම්බර් මාසේ 17 යි, ඒ අනුව නොවැම්බර් මාසයට අනුව 323 ත් රාවතාවත්තෙත් මැයි මාසේ කොවිඩ් මරණ 28 යි, ජුනි මාසේ 48 යි, ජුලි මාසේ 18 යි, අගෝස්තු මාසේ 118 යි, සැප්තැම්බර් මාසේ 57යි, ඔක්තෝම්බර් මාසේ 06, නොවැම්බර් මාසේ 03 යි ඒ අනුව 278 යි. කොරලවැල්ල සාමාන්‍ය මරණ ජනවාරි 02 යි, පෙබරවාරි 05 යි, මාර්තු 06 යි, අප්‍රේල් 03, මැයි 05 යි, ජුනි 05 යි, ජුලි 02 යි, අගෝස්තු 06 යි, සැප්තැම්බර් 03 යි, ඔක්තෝම්බර් 05,නොවැම්බර් 02, කොවිඩ් අගෝස්තු මාසේ 03 යි, එගොඩඋයනේ ජනවාරි 02 යි, පෙබරවාරි 02, මාර්තු 03, අප්‍රේල් 03,මැයි 4,ජුනි 03, අගෝස්තු 03, සැප්තැම්බර් 05, ඔක්තෝම්බර් 02, නොවැම්බර් 03, 31 යි කොවිඩ් මරණ අගෝස්තු 38 යි, සැප්තැම්බර් 13, ඔක්තෝම්බර් 3, 54 යි. කොරළවැල්ලේ කොවිඩ් මරණ 03 , සාමාන්‍ය මරණ 44 යි, එගොඩඋයන සාමාන්‍ය මරණ 31,මේ අනුව සාමාන්‍ය මරණ 398 ක් කරන කොට කොවිඩ් මරණ නොමිළයේම 335 ක් කරලා තියෙනවා. අක්‍රමිකතාවල් තියෙනවා නම්, ආදාහනාගාරවල ප්‍රශ්ණ තියෙනවා නම්, ලංකාවේ රෝහලක් නැතුව දේහයන් ආදාහනාගාර තියෙන වැඩිම පලාත් පාලන ආයතනය මොරටුව මහ නගර සභාව කියලා ඉතිහාසයට එකතු වෙලා තියෙනවා.සමහර වෙලාවට අපි එක පැත්තකින් ගත්තොත් මේ සියලු කාර්යයන් කිරිම සඳහා ප්‍රධාන වූ දායකත්වයක් ලබා ගැනිමට හැකි වෙලා තිබුනේ වෙන කවුරුත් නිසා නොවෙයි විශේෂයෙන්ම අපේ ගරු බේසර රවින්ද්‍ර ප්‍රනාන්දු නාගරික මන්ත්‍රිතුමා නිසා. අපි ඕන තරම් අත් විදලා තියෙනවා මේ සභාවල් විතරක් නොවෙයි ඕනතරම් සභාවල මෙහෙම වෙලා තියෙනවා. අපිට කෙසෙල් වත්ත ප්‍රාදේශිය සභාවෙන් මෙ එගොඩඋයන තියෙන මෘත දේහ 31 න් අඩුම තරමින් පානදුරෙන් 7-8 ක් මෙතන තියෙනවා. අවුරුදු 1-2-3 කැඩිලා තිබුනම අපි ලගට තමයි ඒවාත් එන්නේ. අපි ඒවා එකක්වත් බැහැ කියන්නේ නැහැ. පානදුර, දකුණු කොළඹ

මහ රෝහලේ මේ වගේ කොවිඩ් වලට ලක් වෙලා මරණයට පත් වුන අයගේ දේහයන් ගොඩ ගහලා තියෙනකොට වෛද්‍ය වරු අපිට පනිවිඩ එවනකොට කරුනාකරලා අද 6 ක් එවනවා, අද 8 ක් එවනවා, අද 10 ක් එවනවා කියලා කියනකොට ඒ සියලු දේ අපි එපා කියන්නේ නැතුව භාර අරගෙන ඒ කටයුතු කලා. අපේ අගුලාන ආදාහනාගාරය අවුරුදු 3-4 ක් විතර අක්‍රිය වෙලා තියෙනකොට අපි කල්පනා කලා කොවිඩ් වගේ මරණ වලදී මේ වගේ ආසාධිත තත්වයන් ඇති වුනාම හොඳම තැන අඟුලාන කියලා ඒකට මේ පෙත්සමත් සමඟම පැමිණි නිලධාරියා පැවසුවේ එතනට ගියාම පැනල් බෝඩ් එක හදලා ඒක මේ වෙනකොට බොඩියක් දාලා පුච්චන්න පුලුවන් තත්වයට පත් කලත් ඉස්සර දේහය තියන්න තැන හදන නිසා ඒක නවත්තලා තියෙනවා ඇරෙන්න ඒ නිලධාරියා කිව්වේ මේක මන්ත්‍රිතුමා කරාද අහලා ප්‍රසංශාවට ලක් කලා විතරක් නොවෙයි මේක ලංකාවේ මේ විදියට ස්විච් එකක් දාපු ගමන් සියලුම දේවල් ස්වංක්‍රියව එක එක එක දේවල් පත්තු වෙච් ක්‍රමවත්ව සිදුවෙන එයා දැකපු එකම පැනල් බෝඩ් එක මේක කියලා ප්‍රකාශයකුත් කරලා ගියේ. මම හිතනවා මේ ආදාහනාගාර හදා ගැනිම සඳහා කටයුතු කිරිමේදි ලියන්න ඕන වචන කීපයක් තිබ්බා. ඒ වචන කීපය ලිවිමේදි මම හිතනවා ලියන දේයි, කියන දේයි, දකින දේයි,ඇහෙන දේයි මහ බරපතලයි එකට එකක් වෙනස් වුනොත්. දකින දේ කිව්වේ නැත්නම් ඇහෙන දේ ප්‍රකාශ කලේ නැත්නම්, ලියන දේ නිවැරදිව ලිව්වේ නැත්නම් ඒවා මහා බරපතල ප්‍රශ්ණ වෙනවා. උදාහරණයක් ගත්තොත් මට කියන්නට පුලුවන් සයිමන් හොඳ මිනිහා එතකොට සයිමන් හරි හොඳයි. සයිමන් හොඳ මිනිහා කිව්වොත් සයිමන් නරකයි. එම නිසා මේවා ලියනකොට මේවා ලියන විදිය තියෙනවා. මම දන්නවා නගර සභා ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා අපේ ජ්‍යෂ්ඨ මන්ත්‍රිවරු සියලු දෙනාම අවුරුදු 16 ක් තිස්සේ අපිත් එක්ක ඉන්න කොට අපිට මේක කර ගන්න බැරි වෙන එක නොවෙයි තිබුනේ. අපි මේක භාර ගන්න කාලේ වෙනකොට ලංකාවේම ආදාහනාගාර හදන්න තිබුනේ ආයතන දෙකයි. රවිනාත් මහත්මයා සාක්ෂි දරනවා ඇති. ඒ ආයතන දෙක අපි එනකොට නොකඩවාම රාවතාවත්ත දුවන්නේ නැතිව තනි මැෂින් එකක් තිබුනේ. ඊට පස්සේ අපි මොකද කලේ බොහොම අමාරුවෙන් මහත්මයෙක්ගෙන් දාලා ඒ මැෂින් හදා ගෙන් පසුව සභා සේවකයන්ව දාලා අපි ඒ මැෂින් හදන්න ගත්තා. ඒකට රවිනාත් මහත්මයා කුහක නොවි ඔව් කියයි. අපි ආදාහනාගාර බාරගන්නකොට තිබුනේ දෙකයි. රාවතාවත්ත එකයි. එගොඩඋයන එකයි.ඊට පස්සේ අපි ආදාහනාගාර වැඩි කලා රාවතාවත්තට එකයි කොරළවැල්ලට එකයි අඟුලානට එකයි. දෙක පහ කරලා අපි තියෙන්නේ.ඒක

නිසා අක්‍රමිකතා නොවෙයි මෙතන වෙලා තියෙන්නේ ඕනම දෙයක් ඕනම වෙලාවක එහෙම වෙනවා. එක විදියටම තියෙන්න පුලුවන් කමක් නැහැ. ලෝකේ මෙහෙම පැවතිල්ලක් නැහැ. සාන්තුවරයන් පවා එහෙම කියලා නැහැ.එම නිසා මගේ බලවත් වූ විරෝධතාවය ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා කිවුවා කියලා මේකේ ලියලා තියෙනවා අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා මම හිතනවා එතුමා මේක නිවැරදි කරයි එතුමාගේ මට්ටමෙන් කොහොමද කියලා මේවාගේ දේවල් ලිවිම තුල අපි කවදාවත් ගරු රවිනාත් ගුණසේකර මැතිතුමා නගරාධිපති වෙලා ඉන්න කාලේ ආණ්ඩුව අපිට තිබුනා කියලා අපි එතුමාට ආදාහනාගාරය හදාගන්න උදව්වක් වෙනවා ඇරෙන්න කවදාවත් අපි අතනට මෙතනට ලියලා නැහැ. මම එනකොට අවුරුද්දයි මාස හතරක් රාවතාවත්ත දුවන්නේ නැහැ එගොඩඋයනත් කැඩි කැඩි දුවන්නේ අපි අපිට ආණ්ඩුවක් තියෙනවා කියලා එතනට මෙතනට පෙත්සම් ගහ ගහ මේවා හදන්නේ නැහැ හදන්නේ නැහැ අපි කවදාවත් අත්අකුරු පාවිච්චි කරලා නැහැ. අපි සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට අපි ඉන්නකොට හැම තිස්සෙම අපි හිතුවේ මේක මගේ නගර සභාව ඒකේ නගරාධිපති රවිනාත් ජේ ගුණසේකර ඒකේ නියෝජ්‍ය නගරාධිපති ධම්මික චන්ද්‍රනාත් කියලා නොවෙයි අපි කල්පනා කලේ මේකේ අපි කොටස් කාරයෝ මේ කුණු මගේ කුණු එහෙම කරලා අපි ශ්‍රමදාන කරලා ඕන තරම් ඒවා අපි කරලා තියෙනවා. ඒක නිසා මම හිතනවා වචන ලිවිමේ මේ අක්‍රමිකතා කියන එක මොකක්ද කියන එක නියෝජ්‍ය නගරාධිපතිතුමා තමයි දන්නේ. අපි දන්නේ නැහැ අක්‍රමිකතාවක් වෙලා තියෙනවද කැඩුනද කියන එක වරින් වර කැඩිලා තියෙනවා ආදාහනාගාර හතරක් පවත්වාගෙන ගිහිල්ලා තියෙනවා.එකක් වුනාට ආදාහනාගාර දෙකක් තියෙනවා. ඒක නිසා තමයි දවසකට කොවිඩ් මරණ 10-12 එතන කලේ සමහර දවස් වලට උදේ 9 ට පටන් ගන්නවා රාත්‍රී 9 වෙනකම් කරනවා. ලංකාවේ අපි ප්‍රසංශාවට ලක් වුනා අපි 200 කට ආසන්න ප්‍රමාණයක් අපි පෙට්ටියත් දිලා අපි ඒ කටයුතු කලා පක්ෂ භේදයකින් තොරව සියලුම ගරු මන්ත්‍රීවරු සාපේක්ෂව ඒකට කැමති වුනා. රවි මන්ත්‍රීතුමාට කොවිඩ් හැදෙන්න ප්‍රධාන හේතුවක් බවට පත්වෙලා තිබුනා එතුමා ඒ සෙමෙට්‍රියේ වැඩ කිරිම අද දිනයේදි මම හිතන්නේ එන්න බැරි තත්වයක හිටියත් මේ තත්වය මතම සභාවට ආවා කියලා මට කියන්න පුලුවන් එතුමාගේ දයාබර මෑණියන් මේ වෙනකොට අසනීප තත්වයෙන් කලුබෝවිල රෝහලේ නම වන වාට්ටුවේ අට වෙනි ඇඳේ ප්‍රථිකාර ලබමින් ඉන්නවා. ඒ තරම් සුලුපටු රෝගයක් නොවෙයි ඒ තත්වය නමුත් එතුමා මේකත් එක්ක තිබෙන බැදිම. මම එතුමාට කථා කරලා අම්මාගේ රෝගි තත්වය අහනකොට අනේ

නගරාධිපතිතුමා ඔය දූම ගහන එකත් හදාගන්න ඉවර කරන්න සිමෙන්ති ගෙනල්ල තියෙන්නේ ඒක මමම බදින්න ඕන, කුහර වහන්න ඕන, ඒක අහන්නද කථා කලේ කියලා ඇහුවම මම කිවුවා නැහැ ගරු මන්ත්‍රීතුමා අම්මාගේ විස්තරය අහන්නයි කථා කලේ. අහන අහන හැම තිස්සෙම මොකද සෙමෙට්‍රියේ ප්‍රශ්ණයක්ද කියලා අහන තරමටම එතුමා මම හිතන්නේ තමන්ගේ ජීවිකාවේ එකකොටසක් බවට මේ සේමෙට්‍රිවල තියන ප්‍රශ්ණ හඳුනාගත්ත වාසනාවන්ත අපේ සභාවට ලොකු භාග්‍යක් ලබපු මන්ත්‍රිවරයෙක් විදියට එතුමා මේ සියලු දේ කරනවා. ඒ අතරතුර අක්‍රමිකතා වෙනවා නම් මම කියන්නේ අක්‍රමිකතාවයක් කියන්නේ දෝශදර්ෂකයක් කියන්නේ දෙකක්. අක්‍රමිකතාවක් කියන්නේ රවි මන්ත්‍රතුමා හදන්න කියලා බඩු ගෙන්න යොමු කරලා ඒ මුදල් හදන්නේ නැහැ බොරුවට තිය තියා ඉන්නවා වගෙයි.මගේ ජීවිතයේ මේ 16 වන අවුරුද්ද ගත කරන්නේ නගරාධිපතිවරයකු වශයෙන් 14 වන අවුරුද්දත් දෙක්ක නැතුව තිබුනා. සමහර වෙලාවට මම සමහර අය ඒක දන්නවා ඇති කියලා මම විශ්වාස කරනවා සමහර අය දැනගෙන ඒක නොන්නවා සේ ඉන්නවා ඇති කියලත් විශ්වාස කරනවා. සමහර අය නොදන්නා කමටම යම්යම් දේවල් කියවනාත් ඇති. සැපයුම් අංශයේ යම් යම් දේවල් සැපයුම් කරන අය කලුද-සුදුද උසද-මිටිද කියන එක මම තාම දන්නේ නැත. මම නමින් කිව්වම විමල් මෝටර්ස් විමල් අංකල් අපේ හිත මිත්‍රයෙක් ඒ නිසා දන්නවා ප්‍රවින් කියන්නේ කවුද කියලා දන්නවා ඒ ඇරෙන්න ඔය කවුරුත් කාගේ කවුද කියන එක මම දන්නේ නැහැ. මට මතකයි මම මේක කිව යුතුම දෙයක් එදා මම කොමසාරිස් ජානකි මහත්මිය මෙතනින් යනකොට සෙමෙට්‍රියේ ප්‍රශ්ණයක් වෙලා ඒ අතරේදි පරික්ෂණයක් පවත්වන්න කියලා පලාත් සභාවෙන් ඇවිල්ලා පරික්ෂණයක් කලා. එතකොට නමලක්ෂ අසූදාහක් ඇස්තමේන්තුවක් තිබුනා කොන්ත්‍රාත් කරුවෙකුට දීලා කරන්න අපි අපේ සේවකයන්ගෙන් සභාවේ සල්ලි නොගෙන මගේ අතින් වියදම් කරලා හැදුවා.මට තේරෙන්නේ නැහැ. ඒක නිසා මම හිතනවා මේ වගේ ලියුම් ලිව්මේදි ගරු නීතිඥ මහත්මයා මම අසූදාහකින් ඒක ඉවර කලා.පරික්ෂණය අවසානයේදි වාර්තා තාම තියෙනවා විමර්ෂණ නිලධාරි විමර්ෂන වාර්තා එව්වා මේක කිසි ප්‍රශ්ණයක් වෙලා නැහැ නරාධිපතිතුමා වියදම් දරපු මුදල් නගරාධිපති තුමාට ගන්න පුලුවන් කියලා.මම ඒ අසූදාහම අරගෙන මේ වගේ සභා රැස්විමක් වෙලාවෙදි මහලියන,තිලකසිරි,සුබෝද,ඒවගේම දිවංගත මිල්ටන් ද මැල් මන්ත්‍රිතුමාගේ බෑණනුවන් ඒවගේම මේ උදුන් වල වැඩ කරනවා නවලෝක රෝහලේ හෝ වැඩ කරන එතුමාගේ තාක්ෂණික දැනුමත් එක්ක අපි ඒක

කලා අසුදාහෙන් රුපියල් දහදාහ ගානේ ඔවුන්ට පරිත්‍යාග කරලා සම්මාන දුන්නා අපි එහෙමයි කලේ.

ගරු මන්ත්‍රීවරුනි, මේ අක්‍රමිකතා කියන එක ලොකු අපහැදිලි කමක් තියෙනවා මොකක්ද මේ කියලා මට තේරෙන්නේ නැහැ. ඒක නිසා මම හිතනවා මේ වගේ ලියුම් ලිවිමේදි ගරු නීතිඥ මහත්මයා මේක ලියලා තියෙන්නේ මොන අදහසකින්ද කියන එක ලොකු ප්‍රශ්ණයක් වෙලා තියෙනවා මේක නිවැරදි කර ගැනිමට දැන් ඔහුට අවස්ථාව නැහැ මේකේ විමර්ශණය කරලා ගිහිල්ලත් ඉවරයි පලාත් සභාවෙන් ඇවිල්ලා. මේ තියෙන්නේ පලාත් සභාවෙන් එවපු බස්නාහිර පලාත් සභාව පලාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය කොළඹ. සුහසිංහ මහත්මයා ලියනවා ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි පවත්වන්න කියලා සමික්ෂණ. පලාත් පාලන ආර්ථික ප්‍රවර්ධනය පිලිබඳ බලශක්ති පරිසර ජල සම්පාදන ජලප්‍රවාහන සංචාරක කටයුතු බස්නාහිර පලාත කියලා තව එකක් එවනවා මේ අනුව පරික්ෂණය පවත්වන විදිය විමර්ෂණය කරන්න තවත් එනවා නම් මම හිතන්නේ වඩාත් ප්‍රායෝගිකයි කියලා අපිටත් යම් යම් ප්‍රශ්ණ ටිකක් තිබුනා සෙමෙට්‍රි වල මම හිතනවා මේ වෙනකොට ඒ ප්‍රශ්ණ නිරාකරණය වෙන්න ට අපේ ගරු මන්ත්‍රතුමාගේ අම්මාගේ මේ අසනිප තත්වය නොවුනානම් මම හිතනවා දුම කියන එකත් රාවතාවත්තේ නැත්තටම නැති වෙන තත්වයට පත් වුනා ඔබට පුදුමා කාර හිතෙනවා මට පුදුමාකර හිතෙනවා අපිට අඩි 20 ක් නැග ගන්න බැහැ කකුල් දෙක වෙවුලනවා නමුත් ලංකාවේ තියෙන ලොකුම දුම් බටය තියෙන්නේ අපිටයි. ඒ දුම්බටය අඩි 106 ක් උසයි. ඒ 106 අවසාන ඇණයත් තද කලේ ගරු බේසර රවින්ද්‍ර මන්ත්‍රිතුමා ඇරෙන්න කොන්ත්‍රාත් කරුවෙක් නොවෙයි. එතනට වෙනකම් ඔහු ගිහිල්ලා අවසාන ඇණයත් තද කරනකොට අඩි එක සියක් හරියටම ගිහිල්ලා තමයි ඒ අණයතද කලේ එතනින් එහාට තමයි ඉතුරු හය ඉස්සුනේ.මේ වගේ දැවැන්ත කාර්යභාරයක් කරමින් මම හිතනවා අපි ලබපු ලොකු වාසනාවන්ත කමක් අපේ නගර සභාවට විශේෂයෙන්ම එතුමා නිසාම මම හිතනවා සමන්ලාල් මේක මොකක් හරි කලා කියලා කිවුවා නම් අක්‍රමිකතාවක් සිදු කලා කිව්වානම් ඒ තරම් ලොකුවට මට මේක දැනෙන්නේ නැහැ. නමුත් මේකට නොදැනුවත්වම බේසර රවින්ද්‍ර මන්ත්‍රතුමා ඇතුලත් වෙලා ඉවරයි මේ අක්‍රමිකතා කියන වචනය දාපු නිසා එතුමා ඒකට හවුල් කාරයෙක් වෙන්න ඕන. මම හිතනවා අතින් කාලා ගෙදරින් තේ එක බිලා බිම ටික කඩෙන් බිලා කලා ඇරෙන්න මේ මහ නගර සභාව අඩුම වශයෙන් එතුමා වැඩ කරන වෙලාවක කැමවේලක් වත් ඇරලා නැතුව තමයි මේ සියලු

දේවල් කලේ. ඒක මම හොඳාකාරවම දන්නවා. ඒක නිසා මම හිතනවා මේ වගේ දේවල් ලියනකොට මේවා බොහොම ප්‍රවේසමෙන් ලියන්න ඕන දේවල්. මෙවා නියෝජ්‍ය නගරාධිපතිතුමා මෙහෙම ලිව්වද මම දන්නේ නැහැ එතුමා නොලිව්වා නම් එතුමා කියයි නොලිව්වා කියලා. මම හිතනවා එතුමා කිව්වට පස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකුගේ වගකීම වෙන්නට ඕන එසේ ලිව්වත් එකේ සුල-මුල සොයලා බලලා ලියන්න ඕන තැනට ලියන්නට ඕන. එතුමා ලියුවා නම්. එතුමා ලියලා තියෙන එක සත්‍යයක්. ඒ ලියලා තියෙන එකේ පිටපත පාර්ලිමේන්තු ලිපි ශිර්ෂයක් එක්කම ලියලා තියෙන්නේ ඔබේ අතට පත්වෙලා තියෙනවා. ඒ නිසා මම හිතනවා මේවා සභාවල් වලට නොවෙයි මරණාධාර සමිතියකට වත් නොගැලපෙන ලිපි කියලයි මම විශ්වාස කරන්නේ. ඔබේ කාරුණික අවධානයට මෙය පත්කරනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම පලමුවෙන්ම ඉතාම අගය කොට සලකනවා සියයට දහස්වාරයක් අපේ කේසර රවින්ද්‍ර මන්ත්‍රිතුමා මේ සඳහා මේ ආදාහනාගාර ටික මේ ආකාරයෙන් පවත්වාගෙන යන්නට ඔහු දරණ වෙහෙස මහන්සිය පිලිබඳව. මම මීට කලිනුත් ඉතාම අගය කොට සලකලා කථා කලා ස්තුති කලා ඒවගේම නැවත වතාවක් මේ අවස්ථාවේදි ස්තුතිවන්ත වෙනවා. ඊළඟට මම නිවැරදි කරනවා මේ අක්‍රමිකතා කියන එක ඔබතුමා සඳහන් කරන පරිදි ඒක සඳහන් කල යුතු දෙයක් නොවෙයි. මම හිතන්නේ මොන ආකාරයෙන් කලාද කියලා? ටිරෝන් ප්‍රනාන්දු මහත්මයාගේ කාලේ ස්ථාපනය කරපු මැෂින් එකක් තියෙන්නේ ඉංලන් එකක්. මේ ගෙන්න ගන්න තියෙනවා නම් ඒක අපිට වටිනවා. සභාවේ සල්ලි තියෙනවානම් අපි දන්නවා ලබා දෙනවා. මේකේ අඩුවක් සිදු වෙන්නේ නැහැ. නමුත් අපි දන්නවා අපහසුතා ඇතිවෙනවා. හොඳ මැෂින් ටිකක් ගෙනල්ලා අපහසුතාවයක් නැතිව මේක කරගෙන යන්න කියන ඉල්ලීම තමයි මම කලේ. සභාවේ සියලු මන්ත්‍රිවරු දන්නවා ආදාහනාගාර ගත්තම ගැටලුත් එක්ක තමයි අපිට යන්න සිද්ද වෙන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරනි, බාධා කිරිමක් කරන්වා නොවෙයි ඒ හැම එකේදිම ගරු නගරාධිපති රවිනාත් ජේ ගුණසේකර මැතිතුමාගේ අවසරය මත තමයි ඒ සියලුම මුදල් ගෙනල්ලා වැඩ කලේ. නැතුව මට ඇස්තමේන්තුවක් හදන්න බැහැ එතුමාගේ අවසරය නැතුව, එතුමාගේ අනුදැනුම මත, ආශිර්වාදය මත තමයි මම ඒ

සියලුම වැඩ කටයුතු කලේ. එකක් වත් කලේ නැහැ නගරාධිපතිතුමාගෙන් පරිබාහිරව.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මම ඒක පිලිගන්නවා. මේ වෙලාවේ මම නිවැරදි වෙන්නම්. අපිට වඩා පරිනත භාවයක් තිබෙනවා ඔබතුමා ට, හිටපු නගරාධිපතිතුමාට. මම මේ සභාව හරහා කෙරෙන මුදලක් නොවෙයි ඉල්ලන්නෙ. වෙනත් ප්‍රතිපාදනයක් තමයි මෙහෙට ගේන්න ඉල්ලන්නේ. ඒ අවස්ථාවේ ප්‍රතිපාදනයක් ගන්න පුලුවන් වෙයි කියලා කවුරු හරි කිව්වම ඒක ලියනවා. අපේ මන්ත්‍රිවරු කවුරුත් ඒක කරයි මම විශ්වාස කරනවා. මොකද එතුමන්ලාගේ වැඩ කොටසක් කරන්න එතුමන්ලත් ආසයිනේ. ඒ නිසා එහෙම වචනයට මේක කලා මිසක් සභාව අපහසුතාවයට පත් කරන්න මන්ත්‍රතුමාව අපහසුතාවයට පත් කරන්න වත්,ඔබතුමාව අපහසුතාවයට පත් කරන්න වත්, මට ප්‍රේමනාත් සී දොලවත්ත මන්ත්‍රිතුමාට වඩා ලඟින් ඉන්නේ ඔබතුමා. මොනවා හරි අවශ්‍යතාවයක් ඇති වුනොත්. එහෙම චේතනාවකින් කරපු දෙයක් නොවෙයි. පැහැදිලිවම අවංකවම මොනවා හරි දෙයක් කර ගන්න පුලුවන් නම් හොඳට ස්ථාපනය කරලා, සංවර්ධනය කටයුතු කරලා ඒ ආදාහනාගාර ටික නිසිආකාරව ගැටලුවකින් තොරව කරගෙන යන්න පුලුවන් නම් ඒ මත ඉදගෙන ඉල්ලුවා මිසක් මේක අක්‍රමිකතාවන් සිදුවෙනවා කියලා සභාවේ මන්ත්‍රිවරුන්ව, සභාව, සභාවේ නිලධාරින්ව අපහසුතාවයකට පත් කරන්න මම කිසි දිනක ඉල්ලිමක් කරල නැහැ. මම හිතන්නේ මේක එගොල්ලෝ ලියනකොට එක වැරදි විදියට ලියලා ඇති, වැරදි චේතනාවෙන් ලිව්වද නැත්නම් හොඳ චෙතනාවෙන් ලියලා මේක කොහොම හරි මෙතන තියෙන තත්වයන් පෙන්නලා ප්‍රතිපාදන ගන්න ඒගොල්ලො උත්සහ ගත්තද කියලා මම විශ්වාශ කරන්නේ නැහැ. ඒ නිසා මේ පිලිබදව අක්‍රමිකතාවන් සිදුවෙනවා කියන එක පිලිබදව මම නම් ලිව්වෙත් නැහැ. ඒක ලියලා තිබුනානම් මම එක අනුමත කරන්නෙත් නැහැ කියන එකත් සඳහන් කරනවා. විශේෂයෙන්ම නගරාධිපතිතුමා අපේ නාගරික මන්ත්‍රි රවින්ද්‍ර මහතාත් , ඔබතුමාත්, මේ සභාවේ සියලුම මන්ත්‍රිවරුන්වත්,මේ සඳහා මහන්සිවන සියලුම නිලධාරි මහත්ම/මහත්මින්වත් ඉතාම අගය කොට සලකනවා. මේකෙන් වරදක් සිද්ධ වුනානම් මම දැනුවත්ව හෝ නොදැනුවත්ව ඒක මම සමාව අයදිනවා.

<u>මහ නගර සභා මන්ත්‍රි - එච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුලින්ම ස්තුතිවන්ත වෙන්නෑ ඔබතුමාට මෙහෙම කාරණයක් ආවාම ඒක එලිපිට කථා කිරීම සම්බන්ධව නැත්නම් අපි නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ පැහැදිලි කිරීමත් එක්ක අපිට දැනෙන්නේ මේක පැහැදිලි කිරීමක් නොකර ගත්තානම් අපි වුනත් මේ ලිපිය බැලූ බැල්මට එතුමා සම්බන්ධයෙන් වැරදි අවබෝධයක් ඇති වෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි එතුමා පැහැදිලිව කිව්වා අපි එතුමා කියපු කාරණයත් මම පෞද්ගලිකව අනුමත කරනවා.මහජන නියෝජිතයෝ විදියට අපේ කාර්යබාරය තමයි කාගෙන් හරි උදව්වක් අරගෙන මොරටුව සංවර්ධනය කරන්න තියෙනවා නම් අපි ඒ කාර්යභාරය කරනවා. එතුමා ඒ වෙනුවෙන් යම් මැදිහත් වීමක් කරලා තියෙනවා එතුමා පැහැදිලිවම කියනවා එහෙම අක්‍රමිකතාවයක් ගැන සඳහන් කලේ නැහැ මේකේ තියෙන අඩුපාඩු තියෙන එකක් හදා ගන්න උදවුවක් විතරයි ඉල්ලුවේ කියලා ඒක නිසා ගරු නගරාධිපතිතුමනි අපේ මේ සභාවේ දැඩි අප්‍රසාදය ප්‍රේමනාත් සී දොලවත්ත මන්ත්‍රීතුමාට මොකද එතුමට කියන්න බැහැනේ එතුමා අත්සන් කරපු ලියුමක් වැරදිලා අක්‍රමිකතාවය කියන වචනය මම දැම්මා කියලා. අක්‍රමිකතා කියන වචනය කාටවත් වැරදිලා දාන්න පුලුවන් වචනයක් නොවෙයි. ඒක නිසා අපි ඉතාම ගෞරවයෙන් මතක් කරනවා ඉතාම දැඩිව පිළිකුලෙන් යුතුව මේ ක්‍රියාව හෙලා දකිනවා ඒ නිසා විශේෂයෙන්ම නැවත වතාවක් ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා කිව්වා වගේ කේසර රවීන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා මේ වෙනුවෙන් කරන කාර්යභාරය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විදියට අපි අගය කරනවා. සභාවේ කවුරුත් අගය කරනවා. ඔබතුමාට අපි ස්තුතිවන්ත වෙන ගමන්ම මම ඔබතුමන්ට යෝජනා කරනවා පුලුවන් නම් මේ පාර්ලිමෙන්තු මන්ත්‍රී නීතිඥ ප්‍රේමනාත් ශ්‍රී දොලවත්ත එතුමා කරලා තියෙන මේ බොහොම බාල පහත් වැඩේ පිළිබඳව එතුමන්ට ලිඛිතව දන්වලා අපේ අප්‍රසාදය පල කරන්න කියලා ඉල්ලනවා.

**3(2)** <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, පැමිණිලි සංදේශ අයිතමය යටතේ මට තිබෙනවා පෙත්සමක් ඉදිරිපත් කරන්න. ඊට පෙර ගරු නගරාධිපතිතුමනි කිව යුතුයි අපි කවුරුත් යම් නීතිරාමුවක් ඇතුලේ වැඩ කරන්නේ . ඔබ දිගින් දිගටම පුනපුනා කියන්නේ මේ නීතියට අනුගතව වැඩ කල යුතුයි යන්න. නමුත් මේ පෙත්සම් අයිතමය ක්‍රියාත්මක වෙච්ච විදිය ගත්තම ප්‍රශ්ණයක් තියෙනවා. පෙත්සම් පැමිනිලි ඉදිරිපත් කිරීමේදි හරි අපි මොන දෙයක් කිරීමේදි හරි

ඔබට හොඳයි නම් ඉඩ ඔබට හොඳ නැත්නම් ඉඩ නැහැ. ඒකතමයි ස්වභාවය කමක් නැහැ. මගේ පෙත්සම මොරටුව නගර සභාවේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් ලෙස ඉන්ධන දිමනාවක් සම්බන්ධව විගණකාධිපති විසින් අධිභාර නිකුත් කර ඇති මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛණයේ මගේ නම සඳහන් කොට තිබ්මත් ඒ සම්බන්ධව කොමසාරිතුමා විසින් මා හට ලිපියක් යොමු කොට අදාල මුදල බෙදි යන ආකාරය දක්වා තිබ්මත් කියන කාරණාව පදනම් කරගෙන ඒ වගේම මේ කාරණාව පදනම් කරගෙන පහුගිය සභාවේ පෙත්සම් පැමිණිලි අයිතමයම පාවිච්චි කරලා ඔබතුමත් ඒ වගේම සුජිත් පුෂ්ප කුමාර මන්ත්‍රීතුමාත් විසින් ඉදිරිපත් කරන කරුනු ඇතුලේ ඔබ උත්සහ කරනවා මට දැනිච්ච ආකාරය තමයි මමද වංචනිකයෙක්, කොමිස්කාරයෙක් බොරු කාරයෙක්, දේශපාලන අනාතයෙක්, දේශපාලන ගණිකාවක් බවට පත් වී ඇති බවට ඒත්තු ගන්වන්න දරන උත්සහායක් ඒ ප්‍රකාශ දෙක ඇතුලේ තියෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි ජනතා විමුක්ති පෙරමුණේ මේ සභාව නියෝජනය කරපු දිර්ඝ කාලයක් මන්ත්‍රීවරයා විදියට මගේ ආදාර්ශය මගේ පක්ෂයේ මන්ත්‍රීවරු වගේම අනිත් කාටත් ලබා දෙන්න හැම විටම කටයුතු කරන මන්ත්‍රීවරයෙක් ලෙස ගරු නගරාධිපතිතුමනි පලමුව කිවයුතුයි විගණනකාධිපති යනු මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පවරා දි ඇති බලතල ප්‍රකාරව මේ ආයතනයේ වියදම් අධික්ෂණය කොට නිරික්ෂන ඉදිරිපත් කරන අධිභාරයට ලක් කරන නිසා අපි එය කැමති වුනත් අකමැති වුනත් ඔහු ඉදිරිපත් කරන කාරණාව පිලිගත යුතුයි. ගරු නගරාධිපතිතුමනි ඒ පිලිගන්නේ අප මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රකින බවට,සුරකින බවට, එය කඩ නොකරන බවට, දිවුරුම් දිපු අය අපේ කැමැත්ත අකමැත්ත වෙන එකක්. හැබැයි අපි දිවුරුම් දිලා තියෙනවා. ඒ නිසා විගණකාධිපතිට මේ බලය පවරලා තියෙන්නේ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. ඒ නිසා ඔහු ඉදිරිපත් කරන මේ ඉන්ධන දීමනා අධිභාරයට අදාලව 1997-2004 ත් අතර කථන්දරයක් මෙය ගරු නගරාධිපතිතුමනි ඉතිහාසය යම් මොහොතක හොඳම අවබෝධයක් නොතිබුන කාලෙක අනවබෝධය මත සිද්ධ වෙච්ච නීතියට එකඟ නොවන ඉන්ධන දීමනාවක් ලබා ගැනිම පෙරලා ප්‍රශ්ණ කරන පලවෙනි පැයේ එය නැවත ගෙවුවා. අවුරුදු 3 කට වැඩි කාලයක් මාසික දීමනාව නොගෙන ඒ මාසික දීමනාව කපා ගන්න ඉඩ හැරලා මට නියමිතව තිබුන මුදලකුත් එක්ක ඒ ගෙවිම සම්පූර්ණ කලා. ඒ නිසා මේ සකච්ජාව, මේ සංවාදය ආවේ මම හිතන්නේ මාසයක් නැහැ. ඉතාම වගකීමෙන් මම ඔබට කියනවා මේ ඉන්ධන දීමනාව මේ නීතියට පිටින් අරගෙන තියෙන්නේ නම් යයි ඔප්පු වෙන ඔප්පු කරන පලවෙනි පැයේ අපි ඒකට අදාලව කටයුතු කරනවා. ජනතා විමුක්ති

පෙරමුනේ අපි ගරු නගරාධිපතිතුමනි ඒ මුදල ගෙවනවා. මහජනයාගේ තඹ සතයක් අප නිතියට පිටින් කිසි දිනක අරගන්න සුදානම් නැති බව බොහොම වගකිමෙන් කියනවා. දැන් ගරු කොමසාරිස්තුමනි ඉතාමත් ඕනෑ කමින් ඉල්ලනවා දැන් ඔබ එවන මෙම ලිපිය ඔබ මුදල වෙන් කරලා පංගුවක් දාලා එවන්නේ. ඒ නිසා ඔබෙන් ඉතා ඕනකමින් ඉල්ලනවා. මීට අදාල බොහෝ ලිපි ලේඛන මේ සිද්ධියට අදාල තියෙනවා ඔබ දන්නවා. මුදල් ගත්ත මන්ත්‍රිවරුන්ව නිදහන් කරලා තියෙනවා ඔවුන් මේ ජන්දය දීමට ඉදලා නැහැ. මුදල් නොගත්ත රවිනාත් ගරු මන්ත්‍රිතුමා අධිභාරයට ලක් කරලා තියෙනවා. ඔහු ජන්දයට ඉදලා. එවැනි අපට සාකච්ජා කොට තේරුම් ගත යුතු කරුනු කාරනා අවබෝධ කර ගත යුතු කරුණු කාරණා ගොඩක් තියෙනවා. ඒ නිසා කරුණාකරලා මේ ලිපිය සමඟ අපට එවන්න මේ අදාල කාල වකවාණුව නිවැදිව අප ලබාගත්තා නම් ලබාගත්ත බවට සනාථ කරන ලේඛණ අපට ලබාදෙන්න. ඒ කවුරු නොගෙවුවත් කවුරු ඒ අධිභාරයෙන් නිදහස් වෙන්න උත්සහ කලත් ජනතා විමුක්ති පෙරමුණේ අපි ඒක හෘද සාක්ෂියට එකඟවම අපි ඒක ගෙවන්න හෙට සුදානම්. ගරු කොමසාරිස්තුමනි අප ඒ අවස්ථාව විගණකාධිපතිතුමා එක්කත් මේ සාකච්ජාව කරන්න පටන් ගත්තා. එනිසා එය වැරදි ගෙවිමක් ලෙස තහවුරු වන පලමු මොහොතේ ගෙවනවා. එනිසා මෙය පදනම් කරගෙන අභූත චෝදනා කරන්න එපා කියන ඉල්ලිම කරනවා. ඔබ දන්නවා, කවුරුත් දන්නවා, රටත් දන්නවා ජනතා විමුක්ති පෙරමුණේ අපිට මොන චෝදනා තිබුනත් අපි හොරු නොවන බව, වංචනිකයෝ නොවන බව. දේශපාලන අනාතයෝ නොවන බව. ඕනම කෙනෙකුට අභියෝග කරනවා ඒ අභියෝග කරන්නේ කා එක්කවත් ගරු නගරාධිපතිතුමනි පෞද්ගලික විවාදයක් නැහැ. හැබැයි දේශපාලනය ඔබ අපි දන්නවා කවුරුත් නිශාන්ත 97 මෙතනට ආපු මොහොතේ ඉදලා මේ වෙනකම් නිශාන්තගේ ස්වභාවයන් වෙනස් වෙලා නැහැ ගත් ලක්ෂණ වෙනස් වෙලා නැහැ අත්දැකිම් ලබලා තියෙනවා. ඊට පෙර නිශාන්ත ගෙවපු ජීවිතයත් 97 න් පස්සේ ගෙවපු ජිවිතයත් තඹ ශත පහක් මහජන නියෝජිතයෙක් ලෙස අරගෙන පුද්ගලික වියහියදම් කරලා නැහැ කියන එක බොහොම වගකීමෙන් කියනවා. දේශපාලනයට ආවේ හම්බකර ගන්න නොවෙයි. දේශපාලනයෙන් ජීවත් වෙන්න නොවෙයි. අදත් අප අවංකව නිවැරදිව වැඩ කරන බව තේරුම් ගත්තු සමාජය මිනිස්සු අපව ආරක්ෂා කරනවා. ඒ නිසා ඒ ප්‍රකාශ දෙක ඔබෙයි හිටපු උප නගරාධිපතිවරයාගෙයි ප්‍රකාශ දෙක කියවා ගත්තම අවංක දූකක් කණගාටුවක් ආවා සහ අභියෝගයක් ආවා. භාරගත්තේ අභියෝගය ඒ නිසා ඒ අභියෝගය හෙට නිරවුල් කර යුතුමයි. කොමසාරිස්තුමනි ඔබ උදවු

කරන්න. ඔබ මට කියනවා මේක විධිමත් කරන්න මේක ගෙවල උදවු කරන්න. මෙය ගෙවන්න නිවැරදි ලෙස වාර්තා ලබා දෙන්න ඔබ උදවු කරන්න. මට සාමුහිකව ඒ අය එක්ක එකතු වෙලා මේකෙන් නිදොස් කරන්න නිදහස් කරන්න කියලා ආපු අදාල වගකිවයුතු අයගේ ලිපිත් මගේ ලග තියෙනවා.මට ඒක එපා. මම අරගෙන තියෙනවා නම් මාව නිදහස් කරන්න එපා. මේ ලිපිගොනුවේ තිබෙනවා අධිභාරය නිදහස් කරන්න වගකිය යුතු අමාත්‍යාංශ ලේකම් වරයෙකුත් ලියනවා. ඒක අපිට එපා. අපි වැරදි ලෙස අරගෙන තියෙනවා නම් මහජනයාගේ සල්ලි අපි ගෙවන්න සුදානම්. ඒ වගේම මේ වාර්තාව කියෝගෙන ඒ අබුත චෝදනා වලට උත්තර දෙන්න ගියොත් සභාවේ කාලය අපරාදේ. නමුත් ගරු නගරාධිපතිතුමනි මතක තියා ගන්න පාස්කු ප්‍රහාරයේ මහ මොලකරුවා වගේම එගොඩඋයන පන්සලේ හාමුදුරුවන්ගේ ඝාතනයේ මහ මොලකරුවා නැහැ හෙට මාධ්‍ය හමුවක් තියනවා තියලා කියනවා නරක වැඩ කැත වැඩ අවලං වැඩ ආඡුත වැඩ පෙරේත වැඩ කරපු මිනිස්සු ඔබේ නගරාධිපති කබායට මුවා වෙලා අපිට කියනවා තත්පුලනවාලු. මට කියන්න තියෙන්නේ පව්. දුකයි.කණගාටුයි. ඔවැනි මට්ටමට හැසිරෙනවා නම් අපි සුදානම්. අපිට එවැනි චෝදනා නැහැ. තමන්ගේ ගිණුම් වලට මුදල දාපු බවට ඔප්පු කරන ලේඛණ සහිතව අපි කථා කරන්න සුදානම්. මේ ආයතනයට සේවයට ගත්තු සේවිකාවගේ. මතක තියා ගන්න ඉතාම වගකිමෙන් කියන්නේ.පෞද්ගලික කිසි කෙනෙක් එක්ක ආරවුලක් නුනත් ඔබ ඔබේ එල්ලුම් ගහ පෙනි පෙනි එයට මුවා වෙන්න මේ ධූරය පාවිච්චි කරන්න හදන බව හරි පැහැදිලියි. මේ හදන්නේ තමන්ගේ ස්වමියා ආදරේට නොවෙයි ඔබට ගහන තරමක් ගැහැවුවා රාජපක්ෂලට ගහන තරමක් ගැහැවුවා මාධ්‍ය හමු තියලා ගැහැවුවේ. ඒ නිසා මේ දේශපාලන අනාතයක්. දේශපාලන අනාතයා අද උත්සහ කරනවා නම් සුජාත අපිට අපි බොහොම වගකිමෙන් කියනවා නගරාධිපතිතුමනි මම විශ්වාස කරනවා මම මට හොඳ කියා ගන්න එක හොඳ නැහැ. මගේ හොඳ ඔබේ හොඳ ඔබ කියා ගන්න එක හොඳ නැහැ. අපේ හොඳ කියන්න ඕන සමාජය මිනිසුන් වේදනාව නිසා දේශපාලනය හරියට කියන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්ණයක් යොමු කරනවා. ඔබතුමා ආරම්භයේදිම සභාව දෝෂ දර්ශයට ලක් කලා කියලා විමර්ෂණයකට ලක් කරපු එකක් සභාගත කරලා ඒක මට ඕන විදියට හසුරුවනවා කියලා ඔබතුමා ආරම්භ කරලා මට දෝෂාරෝපණය කරලා ආරම්භ කරාම ඔබතුමා අද ආයාචනා

පෙත්සම් වලින් මොකක්ද කරන්නේ කියලා මේ මන්ත්‍රීවරු 48 ම බලාගෙන ඉන්නවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඔබ කරන දේම මමත් කරනවා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා,මම කරන දේ ඔබට කරන්න බැහැ.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඔබ කරන දේම මම කරනවා කිව්වොත් වැරදියි. හැබැයි ඔබ වැරදියට කරන දේ මම හරියට කරනවා. ඔබ අක්‍රමිකතාවයක් ගැන කථා කරද්දි ඒකට අදාල ලක් වෙච්ච උප නගරාධිපතිතුමත් ඒකට අදහස් පල කරනවා. ප්‍රදීප් ශ්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාත් කථා කරනවා. අපි නිහඬව අහගෙන ඉන්නවා. ඒක නිවැරදි නැහැ. ඔබ පහුගිය හැන්සාඩ් එකේ ජනතා විමුක්ති පෙරමුනේ මන්ත්‍රීවරින්ගේ ප්‍රකාශ ඉවත් කරනකොට ඔබ පාවිච්චි කරන්නේ පුටුවේ නොහිටියා කියලා. හැබැයි පුටුවේ හිටපු කෙනාගෙත් නැහැ. අපි ඉන්නවා. ඒ ඔබේ කැමැත්ත. වැරදියි. වැරදි වුනත් අපිට සමහර ඒවා පිලිගන්න සිද්ධ වෙලා තියෙනවා ඒ ඔබේ බලය. අපි එකඟ නොවන බවයි මේ කියන්නේ. අපේ කැමැත්ත අකමැත්ත කොයි හැටි වෙතත් සිදුවීම් සිද්ධ වෙනවා. හැබැයි නගරාධිපතිතුමනි ඒ සිදුවීම් වලින් හඩා වැටෙන්නෙත් නැහැ. කම්පනයට ලක් වෙන්නෙත් නැහැ. ඔලුව බදාගෙන අඩන්නෙත් නැහැ ඒවට මුහුණ දෙනවා. ඒ නිසා මම අනතුරු හැඩෙවුවේ මගේ දේශපාලන අත්දැකිම් ඇතුලේ ඔබ සමග දේශපාලන ගැටුමක් තියෙනවා ඒක හරි දේශපාලන මත වාදය හැබැයි මේ සුනඛ පෝතකයෝ තමන්ගේ ඉතිහාසයේ සිද්ධ කරපු නීච වැඩ යටපත් කර ගන්න ගරු නගරාධිපති ධුරයට වසන් වෙන්න හදනවා නම් හෙට සුදානම් හෙලි දරව් කරන්න. මතක තියා ගන්න මාධ්‍ය සාකච්ජාවක් එනවා හෙට. කියනවා මෙච්චර මෙහෙම කැත වැඩ කර-කර ඉන්න මිනිස්සු කොහොමද අනිත් මිනිහට කොහොමද එහෙම ඇගිල්ල දික් කරන්නේ. අපි එවැනි චෝදනා වලට ලක් වෙච්ච මිනිස්සු නොවෙයි. ඒකයි ඔබට කිව්වේ මාව අයින් කරන්න එපා මට ගෙවලා තියෙනවා නම් නීත්‍යානුකුල නොවන ගෙවීම මට හරියට කියන්න හෙට ඇවිල්ලා ගෙවනවා. අපි පුද්ගලිකව මුදල් අරගෙන නැහැ. ගරු නගරාධිපතිතුමනි බොහොම ස්තුතියි. අපි සුදානම් අභියෝග කරනවා ඒ හැන්සාඩ් වාර්තාවේ තිබෙන ප්‍රකාශන කරපු මහත්තයට කරුණාකරලා අපි අභියෝග කරනවා. ඕනම දේකට අපි සුදානම්. ඒවගේම එක රටක් එක නීතියක් ජනාධිපති කොමිෂන්

එකේ ඥාණසාර හාමුදුරුවෝ අද ඔබ වහන්සේට මේ භූමියේ සාධාරණය යුක්තිය මේ මිනීමරුවට එරෙහිව දෙවනත් කලා. එක රටක් එක නීතියක් ඥාණසාර හාමුදුරුවෝ මෙතනින් බැහැලා ඒ භූමිකාව දැක්කානේ. අර අහිංසක මිනිස්සුන්ගේ ගෙවල් කඩලා මිනීමැරුම් 3 ක් වුනානේ. අපිට අයිතියක් තියෙනවනේ මේ බිමේ සිද්ධ වෙච්ච මිනිමැරුම් 3 කට අදාල සිද්ධ වෙච්ච අවසාන විනිශ්වය දැනගන්න ඒ නිසා ඒවා උස්සලා ඒවාත් එක්ක හැප්පෙන්න කවුරු හරි සුදානම් නම් අපි සුදානම්.ඇත්ත වැරදියි. අධිභාරයක් වුනොත් ඔබට මට ගෙවලා නිදහස් වෙන්න පුලුවන්. හැබැයි මිනීමැරුම් කරලා ගෙවලා නිදහස් වෙන්න හැංගලා නිදහස් වෙන්න එහෙම බැහැ මතක තියා ගන්න.

- සභා ඝෝෂා -

**3(3)** <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි, නිරෝන් මන්ත්‍රීතුමා, කරුනාකරලා අදින් පසුව මෙම සභාවට දූරකථන ගෙන ඒම සම්පූර්ණයෙන්ම තහනම්. දූරකථන ගෙන ඒම තුල මේ සභාවේ මූල ධර්ම වලට සම්පූර්ණවම විරුද්ධයි. මන්ත්‍රීවරයෙකුට නොගැලපෙන දෙයක් මම මේ ප්‍රශ්ණය විසදන්නම්. ගරු විපක්ෂ නායකතුමා, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා ප්‍රධාන සියලුම ගරු මන්ත්‍රීවරුනි අදින් පසුව දූරකථන ගෙන ඒම තහනම්.

<u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සභාවේ මේ විදියට හැසිරෙන්න හොඳයි අපිට වීඩියෝ කරන්න බැරි නම් ඇති වැඩක් තියෙනවද.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

මේ සභාවේ මාධ්‍යවේදින්ට මේ කෙරෙන නිවේදනය. කරුණාකරලා මේ රූගත කරපු සියලුම දේවල් ඉවත් කර ගන්න. ඒ වගේම ගරු මන්ත්‍රීවරුන් මේ රූගත කිරිම කරුණාකරලා ඉවත් කර ගන්න. මී ලඟ සභාවේ සිට ජංගම දූරකථනය මේ සභාව තුලට ගේන්න බැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, යම්කිසි සිද්ධියක් සිදු වුනානම් අපි ඒ සම්බන්ධව සමාව බජනය කරනවා.

**3(4)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, බුදුහාමුදුරුවො කියලා තියෙනවා

නව හු නව බවිස්සති - තක තරිච් විච්චති
ඒතංතං නිද්දිතෝ කෝසෝ - ඒතං නා පසංසතෝ

බුදුහාමුදුරුවෝ දේශනා කරනවා යම් මනුෂ්‍යයෙක් මේ ලෝකේ ජීවත් වෙනකොට ඒ ජීවත් වන කාල සීමාව තුල ඒ මනුෂ්‍යාට කොපමණ යහපත් කල්කිරියාවෙන් ජිවත් වුනත් යම් යම් කාල වකවානුතුලදි යම් යම් දේවල් සිදු වෙන්නට පුලුවන්. නින්දා අපහාස එන්න පුලුවන් ප්‍රසන්සා එන්න පුලුවන් අෂ්ඨලෝක ධර්මයට අනුව ඒවා තියෙනවා. බුදුරජානන් වහන්සේ වැඩ ඉන්න කාලෙත් උන්වහන්සේටත් ආවා ගණිකාවක් පාවිච්චි කරලා ගණිකාව මරලා මල් අසුනේ හන්ගලා එහෙම චෝදනාවක් ආවා දෙව්දත්තෙරගේ පාර්ශවයෙන්. ඒගොල්ලෝ කලේ ගිහිල්ලා ජනතාව උසිගැන්නුවා බුදුහාමුදුරුවෝ මෙහෙම කෙනෙක්ව මරලා මල් අසුන අස්සේ හංගලා තියෙනවා කියලා. ගමේමිනිස්සු කලබල වෙලා ඇවිල්ලා බලනකොට මල් අයින් කරන ස්ථානයේ ඝාතනය කරලා තියෙනවා. බුදුහාමුදුරුවෝ කලබල වුනේ නැහැ. මොකද හේතුව බුදුහාමුදුරුවෝ දැනගෙන හිටියා මේක පෙර සංසාරේ කරපු කරුමයක් නිසා තමයි මේ වගේ චෝදනාවක් ආවේ ඒ නිසා ඒ චෝදනාව චොදනාව කරපු පිරිස විසින්ම අනිත් පැත්තට වරද පිලිගන්නවා කියන බලාපොරොත්තුවෙන් බුදුහාමුදුරුවෝ නිශ්ශබ්දව හිටියා. අවසානයේ මිනිස්සු අවබෝධ කර ගත්තා මේක ප්‍රචාරය කරපු මිනිස්සුන්ගේ කුමන්ත්‍රණයක් නිසා තමයි මේක සිද්ධ වුනෙ කියලා. ඒ වගේ ගරු නගරාධිපතිතුමනි අපිට මොන විදියට නින්දා - අපහාස කලත් අපිව වට්ටන්න හරිම අමාරුයි. හැබැයි ඔය කොයි කොයි මහත්වරුන්ගෙත් පැටිකිරිය අපි ගාව තිබෙනවා.හැබැයි අපි ඒවා බොහොම සදාචාරාත්මක බවක් අපිට තියෙන නිසා අපි බොහොම වැදගත් විදියට මේ සමාජය තුල අපි ජීවත්වෙලා තියෙන නිසා යම් යම් තැන් වල කෙරෙන ප්‍රකාශයන්හිදි අපි ලඟ තියෙන සාක්ෂි අපි ඉදිරිපත් කරන්නේ ගරු නගරාධිපතිතුමනි යම් සීමාවකට යටත් වෙලා. හේතුව මම විශ්වාස කරනවා මට යම් අපහසුතාවයක් දැනෙනවා යම් කරුණක් නිසා ඒ අපහසු තාවය අනිත් පුද්ගලයාටත් ඒ ආකාරයෙන්ම දැනෙනවා කියලා. මා සතුටු වෙනවා මුලින් කථා කරපු ජනතා විමුක්ති පෙරමුනේ මහත්මයා කථා කරපු දේවල් සම්බන්ධව.එයා කථා කලේ ත්‍රිත්ව ඝාතනයක් සම්බන්ධව. මම ඒ සම්බන්ධව කථා කරන්නේ නැහැ හේතුව අධිකාරණමය ක්‍රියාදාමයක් ක්‍රියාත්මක වෙනකොට කථා කරන්නේ නැහැ. හැබැයි ඔබතුමාගෙන්

ඉල්ලීමක් කරනවා ගරු ලේකම්තුමනි මේවා සංශෝධනය වෙන්න බැහැ. මේ කථා කරපු දේවල් සියල්ල ඒ ආදාරයෙන්ම හැන්සාඩ් ගත වෙන්නට ඕන. හේතුව කුමන්ත්‍රණය හෙලිවෙලා තියෙන්නේ දැන්. ඒක මම විශ්වාස කරන පරිදි උඩ ඉන්න කෙනා විසින් මනස අවුල් කරවලා කරපු ප්‍රකාශ ටිකක්. ඒ නිසා මම ස්තුතිවන්ත වෙනවා එතුමට ඒ ප්‍රකාශය සම්බන්ධව

ප්‍රකාශය නොවෙයි මට තරහා ගියේ ඒ ප්‍රකාශයට මම බොහොම කැමතියි. ඒ එතුමාගේ අයිතිය. එතුමා වියරුවෙන් ප්‍රකාශ කරන්නේ එතුමාගේ හදවතේ කැකැරෙමින් හංගගන තිබුන දේ. ඒ ප්‍රකාශ කරපු දේට අවශ්‍ය කටයුතු කරන්න අපිටත් අයිතියක් තියෙනවානේ. ඒ නිසා එතුමා කිවුවා වගේමේ රටේ එක රටක් එක නීතියක් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙනම කොමිෂන් එකකුත් පත් කරලා තියෙනවා අපි බලමු. ඒවා බලාගන්න පුලුවන්.එතුමා කිව්වු අභියෝග කරනවා කියලා. මමත් අභියෝග වලට හරි කැමති කෙනෙක්. ඕනෑම අභියෝගයකට මුණ දෙන්නට ඕනෑම වෙලාවක සූදානම්. ඒ නිසා ඒ මහත්මයාට මම කියනවා කවුද සේවිකාවකගේ එකවුන්ට් එකකට දාපු කථාවක් පුලුවන් නම් ඔප්පු කරන්න දැන් යනවා මන්ත්‍රිකම්න්. කථා කලා නම් ඔප්පු කරලා පෙන්නන්න. උත්තර දෙන්න බැහැ ගරු නගරාධිපතිතුමනි නමුත් මන්ත්‍රි වරප්‍රසාද යටතේ මට මේක ප්‍රකාශ කරන්න පුලුවන් මටනේ එල්ල කලේ. ඔබතුමා සද්ද නැතුව හිටියානම් මේ අයිතමය යටතේ ගරු නිශාන්ත ප්‍රදීනාන්දු මන්ත්‍රීතුමා කියපු කිසිම දෙයක් කියන්න බැහැ. හැබැයි ඔබතුමා මූලසුන හැටියට ඒ ඔක්කොම කියන්න ඉඩ දුන්නානේ ඒක නිසා ඔබතුමාගෙන් සමාව අයදිනවා ඔබතුමා අපිටත් කථා කරන්න අයිතිය දෙයි කියලා හිතනවා ඒනිසා.ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මම අභියෝගයක් කරනා පුලුවන් නම් එහෙම සල්ලියක් කාගේ හරි එකවුන්ට් එහෙකට දාලා තියෙනවා කියලා එතුමට ඔප්පු කරන්න පුලුවන් නම් මම දැන් හිස් කොලයකට අත්සන් කරලා දෙන්නම් ඔබතුමාට මේ මන්ත්‍රිකම්න් යන්න අපි සූදානම්. එහෙම අභියෝගයක් අපිත් කරනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි අපි පැහැදිලිව කියන්න ඕන දේශපාලනයෙන් අනාථ වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ මහපොලව තුල අනිත් මිනිස්සු වගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කලු පැල්ලම් නැහැ දේශපාලනයේ. මෙ අපි ඔක්කොම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාක්ෂිකයෝ. ඒ කලු පැල්ලම්

තියෙන මිනිස්සු ඉන්නවා අයිඩින්ටිකාඩ් එකතු කරපු, කැලෑ පැන්න මිනිස්සු, රටේ ඉන්න වැදගත් මිනිස්සුන්ව ඝාතනය කරපු මිනිස්සු, රටේ තියෙන මහා සම්පත් විනාශ කරපු මිනිස්සු, එහෙම කලු පැල්ලම් තියෙන මිනිස්සු ඉන්නවා. හැබැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එහෙම කලු පැල්ලම්

නැහැ.සුජීත් පුෂ්පකුමාරට එහෙම කලු පැල්ලම් නැහැ. පැල්ලම් දාන්න සමහරු උත්සහ කරනවා. ඒ පැල්ලම් ගහන්න උත්සහ කරන කට්ටිය උඩ ඉන්න කෙනා විසින් යම් යම් අවස්ථාවල දි ඔප්පු කරලා පෙන්නනවා. මේ කට්ටිය තමයි මෙහෙම කරන්නේ කියලා. ඒනිසා අපි පැහැදිලිව කියනවා
ඕනවට වඩා මේ ගැන කථා කරන්න බලාපොරොත්තුවක් නැහැ. මම කියන්න ඕන සියලුම දේවල් ටික එතුමා කිව්වා. ඒ නිසා මම ඉල්ලිමක් කරනවා ඔබතුමාගෙන් මේක හැන්සාඩ්ගත කරලා ඔබතුමා අපිට ලබන සභාවේදි වාර්තාව ලැබෙන්න සැලැස්සුවාම ඇති. ඒ නිසා මේ සම්බන්ධයෙන් කියන්න තියෙන්නේ එක දෙයයි මේ වාර්තාවේ පහුගිය සභාවාරයේදි කියපු සියලුම දේ ඇත්ත. මේ සභාව තුල හිටගෙන කරන සියලුම ප්‍රකාශ වල වගකිම අපට ගන්න පුලුවන් කම තියෙනවා. ඒ වගකිම් අරගෙන තමයි අපි කථා කරන්නේ. එහෙම නැතුව කටට එන පලියට අපි කියවන්න සුදානම් නැහැ.ඕනැම කෙනෙක් එක්ක ඕනැම තර්කයක් ගොඩ නගන්න පුලුවන් අයිතමයකදි කථා කරනවා නම් ඕනැම කෙනෙක් ගොඩනගන තර්කයකට පිලිතුරු දිමේ හැකියාව දෙයියන්ගේ පිහිටෙන් අපි ඉගෙන ගත්ත පාසැලේ ගුරුවරු දිලා තියෙනවා. එතුමා කියපු අනවශ්‍ය දේවල් වලට උත්තර දෙන්න යන්නේ නැහැ.එතුමට මම ස්තුතිවන්ත වෙනවා නැවත වරක් ඒ සම්බන්ධයෙන් කථා කිරිම සම්බන්ධව. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි එක දෙයයි කියන්න තියෙන්නේ ඔබ තුමාට මන්ත්‍රිවරුන්ගේ දේ මට උනාට කමක් නැහැ. මාව වට්ටන්න ටිකක් අමාරුයි. ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා මන්ත්‍රවරයෙක් සම්බන්ධයෙන් ඒ මන්ත්‍රිවරයාගේ ආත්මය විනාශ කරන්න ඉතා ද්වේශ සහගත විදියට ඒ මන්ත්‍රවරයාගේ චරිතය විනාශ කරන්න එහෙම කරන ප්‍රකාශයන් වලදි පිස්සෝ වගේ කථා කරන උදවියට , පිස්සෙක් ඇවිල්ලා මෙතන මොළය පොඩ්ඩක් අවුල් වුනාට පස්සේ ඒ කියවන කියවිලිවලට මුලසුන ඉදගෙන ඔබතුමා ඉඩ දෙන්න එපා කියන ගෞරවනිය ඉල්ලිම ඔබතුමාගෙන් ඉල්ලනවා. හේතුව ඒ කියපු වචන නැවත ඇදල ගන්න බැහැ. ඒ වචන එහෙමම මේ වා තලයට මුදා හරිනවා. මේක හැන්සාඩ් ගත වෙනවා. මේක අපිට වාසියක් උනාට අලුත් මන්ත්‍රිවරයෙකුට මේ වගේ ප්‍රශ්ණයක් වුනා නම් එහෙම දරා ගැනිමේ අපහසුවක් වෙන්න පුලුවන්. වෙන වෙන ගැටලු මතු වෙන්න පුලුවන්. අපි ජනතා විමුක්ති පෙරමුනේ ගරු මන්ත්‍රිවරුන්ට කියන්න ඕන මේ සුජිත් පුෂ්ප කුමාරලත් ඕනැම දේකට ඕනැම විදියකට පිලිතුරු දෙන්න ලැස්තියි.මේ අවුරුදු 15 ක් දේශපාලනයේ මන්ත්‍රිකම් කලේ, උපනගරාධිපතිකම් කලේ කාටවත් බයේ නම් නොවෙයි. ඒ නිසා බොහොම ගෞරවයෙන් කියනවා ඔබතුමාලා ඉදිරිපත් කරන ඕනැම විදියකට අපිත් ලැස්තියි.ඒක ප්‍රශ්ණයක් නැහැ ගරු

මැතිතුමා. ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ අසාධාරණය තවත් මන්ත්‍රීවරයෙකුට වෙන් ඉඩ දෙන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම කරමින් නැවත වරක් පෙර දවසේ කියපු ප්‍රකාශය සනාථ කරමින් මේ සියලු ප්‍රකාශයන් හැන්සාඩ් ගත කරලා අපට නැවත වරක් ලැබීමට සලස්වන්න කියලා. අයිතමය නොවුනත් ඔබතුමා ලබාදුන් අවස්ථාවට ස්තුති කරමින් නිහඬ වෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ අයිතමය යටතේ කථා නොකල යුතු වුවත් මේ දේ කියන්න ඕන. මේ සභාවේ බොහෝ අය මාව දන්නවා. මම මේ සභාවට ගොඩක් ආදරෙයි. මා පෞද්ගලිකව කාගෙවත් හිත් රිද්දන්න කටයුතු කරන්නේ නැහැ.හැම තිස්සෙම සභාවේ යහපත වෙනුවෙන් හැප්පෙන එක කරනවා. මගේ චර්යාවන්ගේ යම් මට නොගැලපෙන දෙයක් සිද්ද වුනා. හැමෝම සමාවෙන්න ඕන. මම සාමාන්‍යයෙන් එහෙම කෙනෙක් නොවෙයි. නමුත් එය මගේ පැත්තෙන් වෙච්ච වරදක් ලෙස දකිනවා. ගරු නගරාධිපතිතුමනි අභියෝග කරන අයට සිංහයෙකුට ඌරෙක් අභියෝග කලාට සිංහයා ඌරාත් එක්ක පැටලෙන්න යන්නේ නැහැ ජරාව නාන්න වෙනවනේ. එනිසා අපි මේ මහජනයාගේ දේපල ඔබ හොඳින්ම දන්නවා ඔබ කරන කියන ඒවායේ වඩාත්ම කිව්ය යුතු නොකිව්ය යුතු ඔබත් එක්ක හැප්පෙන්නේ ගැටෙන්නේ මේ ආයතනය මේ මහජනයාගේ දේ ආරක්ෂා කර ගන්න මිසක් පුද්ගලිකව හිත් නොහොඳ කම් ඇති කර ගන්න නොවෙයි. ඒ නිසා හැම තිස්සෙම බලනවා මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් සපයමින් මගේ වැඩ කටයුතු කරන්න මේ වෙලාවේ ඇති වෙච්ච ඒ තත්වය නම් හොඳ එකක් නොවෙයි. අපේ ඉවසීම පිලිබඳ ප්‍රශ්ණයේදී මම හිතනවා මගේ පැත්තෙන් අඩුවක් වුනා වරදක් වුනා සියලු දෙනා සමාවෙන්න කියන ඉල්ලීම කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජේ ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මමත් මේ අවස්ථාව ඔබතුමාගෙන් ඉල්ලනවා වරප්‍රසාදයක් හැටියට මට කථා කරන්න ස්වල්ප මොහොතක් දෙන්න කියලා අයිතමයට අදාල නුනත්. මම විශේෂයෙන් මේ ප්‍රකාශය කරන්නේ විපක්ෂ නායකයා හැටියට. මම ඉතාමත්ම කණගාටු වෙනවා අද දවසේ දැකපු මේ සිද්ධිය සම්බන්ධව. මේක පලවෙනි වතාවට සිද්ධ වෙච්ච දෙයක් නොවෙයි ගරු නගරාධිපතිතුමනි. මීට පෙර 3-4 වතාවක් මෙවැනි සිදුවීම් සිදුවුනා. මගේ හැඟීම නම් මෙවැනි දේවල් මේ ගරු සභාව තුල සිදු නොවිය යුතුයි. අපි

මහ නගර සභාවක්. අපි පුංචි ප්‍රාදේශීය සභාවක් නොවෙයි. අපි මහ නගර සභාවක් නිසා තමයි මේ ඔක්කොම ලස්සනට ඇඳගෙන පිලිවෙලක් ඇතිව මේ ස්ථානයට ඇවිල්ලා වාද-විවාද කරන්නේ. අපි වාද-විවාද කරනකොට අපිට පුලුවන් කමක් තියෙන්න ඕන අපට එල්ල වෙන යම් චෝදනා තියෙනවා නම් ඒවා ඒ ආකාරයට අරගෙන පිලිතුරු දීමේ හැකියාවක් අපිට තියෙන්න ඕන. ගරු නගරාධිපතිතුමනි ඔබතුමා අද යම් තැනකට ඔබතුමාව තල්ලු කෙරුවා මේ ගරු සභාව. මෙතෙක් දවසක් ඔබතුතමා ගත්ත නැති තීන්දු තීරන ගන්න ඔබතුමා අද පෙළඹුනා. මම හිතන්නේ මේ ගරු මන්ත්‍රීතුමන්ලාගේම ක්‍රියාකාලාපය නිසාම සිදුවුන දෙයක්. ලබන රැස්වීමේ සිට ඔබතුමා කිවුවා දුරකථන මේ සභාගර්භයට ගේන්න එපා කියලා. ඒක සාධාරණද අසාධාරණද කියන එක ගැන නොවෙයි මම තර්ක කරන්නේ නමුත් ඒක කිරීමේ බලය ඔබතුමාට තියෙනවා. ඔබතුමා ඒ තින්දුව දුන්නේ අද වෙච්ච යම් සිදුවීමක් නිසා. මෙන්න මේවා ගැන අපේ ගරු මන්ත්‍රීවරුන් අවබෝධයෙන් සිටිය යුතුයි. තව දෙයක් තමයි ගරු නගරාධිපතිතුමනි අපි මේ කාරණාවා නිසාම සමහරක් වෙලාවට ඉදිරියට ඔබතුමාට අපේ ආඥාපනත්,අතුරු ව්‍යවස්ථා බොහොම තදින් ක්‍රියාත්මක කරන්න වෙයි. බයිලෝස් අතුරු ව්‍යවස්ථා වල තියෙනවානම් මේ කටයුත්ත පමණයි මේ වෙලාවේදි කථා කරන්න පුලුවන් කියලා ඔබතුමා බොහොම අවස්ථාවන්වලදි බොහොම ප්‍රජාතන්ත්‍රී ලෙස ඉඩ දුන්නා අපට යමක් කියන්න. සමහර වෙලාවට ඔබතුමා දැඩි තීන්දුවක් අරගෙන කියන්න පුලුවන් මේ රාමුව ඇතුලේ විතරයි කථා කරන්න පුලුවන් එතනින් එහාට බැහැ කියලා. ඒක අපේ මන්ත්‍රීවරුන්ගේ තියෙන වැරදි ක්‍රියාකලාපයන් නිසා සිදුවුනා කියලා මේ ගරු සභාවේදි මම මතක් කරන්න ඕන. මම කියන්නේ මම ජ්‍යෙෂ්ඨ පුද්ගලයෙක් නිසා එකක් මන්ත්‍රීවරයෙක් වශයෙන් වැඩි කාලයක් හිටපු නිසා වයසින් වැඩි පුද්ගලයෙක් හැටියටත් අපි ආදාර්ශයක් දෙනවා මේ ගරු සභාවට ගරු නගරාධිපතිතුමනි අපේ මේ ගරු මන්ත්‍රීවරු දැනගන්න ඕන මේක තමයි පුංචි පාර්ලිමේන්තුව මේකේ අපි ලබන ආභාෂය අත්දැකීම් අරගෙන තමයි පලාත් සභාවට යන්නේ එතන තව ටිකක් පොලිෂ් වෙලා තමයි පාර්ලිමේන්තුවට යන්නේ. නමුත් අපි හරියට මෙතනද අපේ ෆවුන්ඩේෂන් එක දමා ගත්තේ නැත්නම් අද පාර්ලිමේන්තුවේ වෙන සමහර සිද්ධින් සිද්ධ වෙන්නෙත් මෙවැනි ස්ථානයක කෙනෙක් හරියාකාරව ඉගෙන ගත්තේ නැති නිසා. ඒක තමයි අද පාර්ලිමේන්තුව සැහැල්ලුවට ලක් වෙලා තියෙන්නේ. ගරු නගරාධිපතිතුමනි අපි මෙතෙක් කාලයක් මේ සභාව ඉතාමත්ම ගරුත්වයක් තියෙන ආකාරයට අපි හැසිරුනා. ඒක නිසා ඉල්ලිමක් කරනවා 2002-2006 කාලයේදි මම නගරාධිපති

වශයෙන් සිටියදි මට සිද්ධ වුනා මේ සභාවේ යම් මන්ත්‍රවරයෙක් හෝ දෙදෙනෙක් මුලාසනය කියන දේ අහන්නේ නැතුව දිගින් දිගටම ප්‍රශ්ණ ඇති කරපු වෙලාවේදි සභාවෙන් උස්සලා එලියට ගෙනියන්න. එතුමගේ නම කියන්නේ නැහැ. පොලිසියෙන් කැඳවලා එලියට දැම්මා. ඔබතුමාට මතක ඇති. මම හිතන්නේ මෙවැනි දේකට අපි යන්න ඕන. මම කියන්නේ අපි මෙවැනි විනයක් ඇති කරමු. මම ඔබතුමා සමඟ ඉන්නවා. ඒක අපි මේ සභාවේ කෙරුවේ නැත්නම් මේ සිටින ගොඩක් දෙනෙක්ගේ බලාපොරොත්තුව එතනින් එහාට යන්න. මම උඩ ඉඳලා පල්ලෙහාට ආපු කෙනෙක්. පලාත් සභාවේ අවුරුදු 9 ක් ඉඳලා විශාල අත්දැකිම් අරගෙන මෙතනට ආපු කෙනෙක්. මේ අත්දැකිම් මම බෙදා ගන්නවා අපේ තරුණ නවක මන්ත්‍රිවරුන් සමඟ අපි මේ සභාවක හැසිරෙන්න ඕන ආකාරය පිලිවෙල අපි දැනගත යුතුයි.

ගරු නගරාධිපතිතුමනි, ගිය බජට් රැස්විමේදි මම කාරණා කීපයක් විවෘතව ඉදිරිපත් කෙරුවා. එකක් ඉංග්‍රිසි පරිවර්ථනයේ තිබුන දූර්වලතාවයක් සම්බන්ධව. මම ඉතාමත්ම සංතෝෂයි ඊයේ මට ගරු ලේකම් තාරක මුණසිංහ මහත්මයා ටෙලිපෝන් කරලා කිව්වා ගරු මන්ත්‍රතුමා අඩුපාඩු වගයක් කිව්වා කරුණාකරලා උදව් කරන්න පුලුවන්ද ඒවා නිවැරදි කර ගන්න. මම ඉතාමත්ම සංතෝෂයෙන් කිව්වා ඒ දේ කරන්නම් කියලා. ඒ වගේම ඊයේ රාත්‍රියේ මට ටෙලිපෝන් කෝල් එකක් එනවා දූල්සිරි මහත්මයාගෙන් ගරු මන්ත්‍රිතුමා පාරවල් පිලිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් අපට උපදෙස් ලැබිලා තිබෙනවා ගරු නගරාධිපතිතුමාගෙන් ඒ ටික අපි කරන්න හදනවා කියලා. මම මේ කියන්න හදන්නේ පලමුවෙන්ම ඒ නිලධාරි දෙන්නට ස්තුතිවන්ත වෙනවා ගිය සභාවේදි කථා වුණු දේවල් වහාම ඒ නිලධාරින්ගේ විෂය පථයට අදාල දේවල් පිලිබඳ එතුමන්ලා ක්‍රියාත්මක විම පිලිබඳවත් මම හිතනවා ඔබතුමාගේ උපදෙස් මත ඒ නිලධාරින් දෙදෙනාට ප්‍රසංශා කිරිමට මේ සභාව තුලත් ඔබතුමාට ප්‍රසංශා කිරිමටත් එවැනි දෙයක් කටයුතු කිරිමට ගත්ත උනන්දුව පිලිබඳව. මා ඉල්ලා සිටිනවා අපි මෙවැනි දේවල් ආයාචනා පෙත්සම් හෝ වේවා සභාවේදි මින් ඉදිරියේදි ගන්නකොට ඊලඟ රැස්විමේදි ඔබතුමාට එකේ ප්‍රෝගෙස් එක කෙටියෙන් හෝ අපිට කියන්න පුලුවන්නම් මම හිතන්නේ හොඳ ගමනක් ඔබතුමා අඩියක් ඉදිරියට තියලා තියෙනවා. අපි ප්‍රාර්ථනා කරනවා අපිට ලබන අවුරුද්දේ අපිට මේ දේ කරන්න පුලුවන් වෙයි කියලා.

**3(5)** **<u>මහා නගර සභා මන්ත්‍රී,රවිනාත් ජේ.ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මා ඔබතුමාට යොමු කරන පෙත්සම තමයි ගිය ඉරිදා 9.30 දිනපොලට මම ගිය වෙලාවේ මගේ කාරෙක ඇතුල් කර ගන්න බැරි ප්‍රශ්ණයක් තිබුනා වාහන රාශියක් ඒ පාර දිගේ නවත්වලා. බොහොම අමාරුවෙන් නවත්තලා පොලට ගියා බඩු ටිකක් ගන්න. එතන කුරුලු කූඩු ඒ වගේ දේවල් වෙළඳාම් කරනවා ඒ ස්ථානයේ. මගේ අදුනන අය හමුවුනා ඒ අයත් පැමිණිලි කෙරුවා ඉරිදට ඇවිත් අපේ මස්,මාලු,එලවලු ගන්න ස්ථානය කාරෙක ගන්න විදියක් නැහැ තවත් අය පොලිසිය ඉදිරිපිට නවත්තලා පයින් ආවේ.මේ වගේ ප්‍රශ්ණ මට දැනගන්න ලැබුනා. මම කඩවල කීප දෙනෙක්ගෙන් ඇහුවා ඒ අය කියනවා අපි මාසිකව නගර සභාවට කුලිය ගෙවනවා ඉරිදා දිනට තමයි විශාල වශයෙන් සෙනග එන්නේ නමුත් මේ කුරුලු කූඩු විකිනිම තුලින් මෙතන බ්ලෝක් වෙන නිසා ජනතාව එන්නේ නැහැ කියලා. ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේ ප්‍රශ්ණය සම්බන්ධව ඔවුන්ට විකල්ප ස්ථානයක් ලෙසලබන ඉරිදා සිට සභාව ඉදිරිපිට බාලදක්ෂ මාවත ඔබතුමාට බලයක් තියෙනවා ඒක වහලා යම් වේලාවක් දිලා ඒක විවෘත කරන්න ඒ අයට දුන්නොත් පොළට යන අයට ඒ අයගේ වෙළඳාම් කර ගන්න පුලුවන්. ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා ගත හැකි ක්‍රියා මාර්ගයක් ගන්නයි කියලා ඉල්ලා සිටිනවා.

### 3(6) මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, පෙත්සම් අයිතමය යටතේ මට කරුණු 3 ක් තියෙනවා ඉදිරිපත් කරන්න.ඊට ප්‍රථමයෙන් ඔබතුමාගෙන් අවසරය ඉල්ලනවා ඇති වෙච්ච සිදුවිමේදි මා අතිනුත් යම් කිසි අඩුපාඩුවක් සිදුවුවා නම් සමාවෙන්න කියලා. අපිත් නවක මන්ත්‍රිවරු ලෙස යම් අවස්ථාවලදි ආවේගශිලි තත්වයන් වලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. අපි කවුරුත් බලාපොරොත්තු විය යුතු දේවල් නොවෙයි සභාවක් ඇතුලේ අපේ ආදාර්ශයන් මීට වඩා ලැබෙන්න ඕන කියලා විශ්වාස කරනවා. එම නිසා මා අතිනුත් කිසියම් වු නොගැලපෙන ආකාරයෙන් වු වචන හුවමාරුවක් සිදුවුනා නම් ඒ පිලිබඳව මගේ කණගාටුව හා සමාව ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් අයිතමය යටතේ මා මේ ලිපිය 2020 අගෝස්තු මාසේ නම වනිදා ඉදිරිපත් කරපු ලිපියක් බෝධිරුක්ඛාරාම සෞම්‍ය පෙදෙසේ ජනතාව විසින් ඉදිරිපත් කරපු ලිපියක් ඔවුන්ගේ පාර ප්‍රතිසංස්කර දිම සම්බන්ධයෙන් ඒ කටයුත්ත මේ වෙනතෙක් සිදුවි නොමැති බව තමයි ඔවුන්ගෙන් අපිට දැනගන්න ලැබුනේ හැකිතාක් ඉක්මනින් මේ කටයුතු සිදු කරන්න ඕන කියන ඉල්ලිම මත අපි ඉන්නේ. ප්‍රතිපාදන නොමැති නම් ඒ බව

ජනතාවට ඒ ජනතාවට සඳහන් කරන්න ඕන. අපට ඒ ජනතාව කියන්නේ හෙට කරන්නම් කිය කිය ඉන්නවා වැඩේ කෙරෙන්නේ නැහැ කියලා.එය ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**3(7) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මම ගිය සභාවේදී ඉදිරිපත් කලා සොයිසා පුර ප්‍රධාන මාර්ගයේ පැති කාණුව ස්ලැබ් ටික ඉවත් කරලා කාණුව පිරිසිදු කරලා දෙන්න කියලා. මේ වෙනතෙක් කිසිදු ක්‍රියා මාර්ගයක් සිදු වෙලා නැහැ. මහජන නියෝජිතයෝ ලෙස ජනතාවගේ ඉල්ලීම් පක්ෂ භේදයෙන් තොරව කරන්නේ.

**3(8) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඒ වගේම ගිය සභාවේදී ලක්ෂපතියේ නාම පුවරු සවිකර දෙන්න කියන ඉල්ලීම අනස්ට් පටුමග ඒ සම්බන්ධවත් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ වෙනතුරුත් අරගෙන නැහැ. මේ කටයුතු තුනම හැකිතාක් ඉක්මනින් කර දෙන ලෙස ඉල්ලීම කරනවා.

**3(9) <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවති ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, එගොඩඋයන දියවරපුර නිවාස ලාභින් ඉදිරිපත් කරන කරුනු දෙකක් මුල්කරගෙන මම මේ සංදේශය ඉදිරිපත් කරනවා. එගොඩඋයන දියවර පුර නිවාස යෝජනා ක්‍රමයේ නිවාස 64 ක් තිබෙන මුත් මෙතෙක් නිසි ඔප්පු ලබා දිමක් හෝ අයිතියක් තහවුරු කර නොමැත. එම නිසා මෙම නිවාස වල ඔප්පු අප වෙත අයිතියක් හෝ තහවුරු කිරිමක් කර නොමැති එම නිසා මෙම නිවාස වල ඔප්පු අප වෙත ලැබි නොමැති හෙයින් අපගේ පෞද්ගලික වැඩ කටයුතු වලදී ඉතා අසරණ භාවයට පත් වූ වාර අනන්ත බවත් එම නිසා අප නිවසේ හිමි කරුවන් වෙත ලබා දෙනලෙස ඉල්ලා සිටිනවා.

**3(10) <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවති ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, දෙවන කරුන මෙම නිවාස සංකිර්ණය තුලට පිටස්තර පුද්ගලයන් පැමිණ නොයෙක් නොයෙක් අනවශ්‍ය කටයුතු වල නියැලෙස බවත්, කුඩා දරුවන්ගේ ආරක්ෂාව ගිලිහි යන බවත්, තවත් කරුණු හේතු කරගෙනත් නිවාස යෝජනාකරුවන්ගෙන් පිටස්තර අය අපිට ප්‍රජාශාලාව අසලට පැමිණ කණ්ඩායම් සාකච්ජා කරන බවත් නිසියාකාර බිම් ප්‍රමාණයක් වෙන් කර නොතිබිම හේතුවෙන් විවිධ ගැටලු වලට අප හට සිදුවන බවත් පවසා සිටින අතර අප නිවාස භූමිය වටේට ආරක්ෂිත වැටක්

ඉදිකරමින් නිවාස භූමියේ පිට දෙපැත්තේ සිටින අයට ඔවුන්ගේ අඩිපාරවල් හරියට මැන සකස් කරදීමටත් කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ගරු නගරාධිපතිතුමනි, මේවා නිසිආකාරයෙන් නොමැති බැවින් නිතරම අඩදබර ඇති වෙනවා මටත් පොලිසි වලට මැදිහත් වෙලා සමථයකට පත් කරන්න වෙලා තියෙනවා එමනිසා මේ සම්බන්ධව නිසා වැඩපිළිවෙලක් යොදන මෙන් ඉල්ලා සිටින අතර ලබන්නාවූ නත්තල සහ අලුත් අවුරුද්ද වාසනාවන්ත වේවා කියා ප්‍රාර්ථනා කරමින් නිහඩ වෙනවා.

**3(11) <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, මා හට ලැබී ඇති ආයාචනයක් සභාව හමුවේ තබනවා. ප්‍රවීන ගායිකා ලාංකිකා පෙරේරා මහත්මිය වෙනුවෙන් අභිමන් දැක්වීමක් පිලිබදව කලාවට බොහෝ දස්කම් ඇති අපේ ගම වන මොරටුව කලා ජීවිතයේ වසර 50 ක් වෙනුවෙන් ඇගයීම් 3 ක් සම්බන්ධකර තිබෙනවා එම ලිපිය මම සභාගත කරනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, මම නිතරම කියනවා ඒ වගෙම මම පොඩි උපදෙසක් දුන්නා අප වෙත එවන හැම එකම සභාවේ කිව යුතුද කියන එක කල්පනා කරන්න. එහෙම් කලා නම් ආයාචනා පෙත්සම් යටතේ 2002-2006 දි හැමදාම පෙත්සම් ඉදිරිපත් කරන්න 50-60 ත් අපේ අතට ආවම අපි ඒවායින් ඕන කරන එක විතරයි කථා කරන්නේ. මේකෙදි පලවෙනි එක තමයි අපිට කරන්න බැරි දෙකක් තියෙනවා එකක් සම්මාන අපිට දෙන්න බැහැ අපි කරන වෙලාවක ඇගයීමකට ලක් කරන්න පුලුවන්. සති දෙකකට කලින් අතිගරු ජනාධිපති තුමා විශේෂ වු ගැසට් එකක් නිකුත් කලා ජීවත්ව සිටින කිසිම කෙනෙකුගේ නමින් මාර්ග නම් කරන්න බැහැ කියලා. මහජන නියෝජිතයේ වන අපිට ආවාම කියන්න ඕන ඔබත් බේරිලා අපි ඔක්කොම බේරිලා අපි කියන්න ඕන මේ යෝජනාවට මේ වෙනකොට ඉඩකඩක් නැහැ ඒක නිසා මේක ඉදිරිපත් කරන්න බැහැ කියලා. සමහර වෙලාවට ඔබතුමියත් අපහසුවට පත් වෙනවා කිව්වා කියලා ප්‍රසාදයක් ගත්තා වුනාට, මේක දන්නේ නැද්ද කියලා අප්‍රසාදයකුත් ලැබෙන්න පුලුවන්. ඒවත් අවබෝධය ඇති කර ගතයුතු වෙනවා. උදාහරණයක් කිව්වොත් කුරුස හන්දියේ බුදු පිල්ම වහන්සේ නමක් තියන්න ආවා ආගම් භේදය බොහෝ සෙයින් සහජීවනය තියෙන නගරයක් නිසා පාන්දර 2.10 ට මම බුදුපිල්ම වහන්සේ මෙතනට ගෙනාව ඒකට හේතුව කියන්න බැහැ එහෙම එකක් නැති නිසා මේ වගේ දේවල් කරනකොට මහජන නියෝජිතයෝ මීට වඩා පොඩ්ඩක් සැලකිලිමත් වෙන්නට ඕන.

**3(12)** <u>මහ නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, පෙරේදා රාත්‍රියේ සිද්ධියක් සිදු වුනා ලුනාව පාරේ රිය අනතුරක් ඒ පාරේ මෝටර් සයිකල් ට්‍රේල් බයිසිකස් කොල්ලෝ සෙට් එකක් ඉන්නවා වේගයෙන් යන්නේ. ඒ බයික් එකක් වෙන්න ඕන බයිසිකලයකින් එන පුද්ගලයෙක්ව හප්පලා දාලා ගිහිල්ලා. සෙනග පිරිලා වාහන නවත්තලා මමත් හිටියේ ට්‍රැපික් එකේ කවුරුවත් මේ ලෙඩාව ගෙනියන්නේ නැහැ. බැරිම තැන මගේ ජීප් එකේ දාගත්තා අරගෙන ගියා ලෙඩා මැරිලා. ලුනාවෙන් භාර ගත්තේ නැහැ. 1990 ට කථා කරන්න කිව්වා.නිරෝෂන් ගරු මන්ත්‍රීතුමත් ආවා එතනට. පොලීසියෙන් ඇවිල්ලා මට යන්න කිව්වා පානදුර රෝහලට. එතනදි මම ඒ කටයුතු ටික කලා. මම කියන්නේ ගරු නගරාධිපතිතුමා පොලිසිය දැනුවත් කරන්න ලුනාව පාරේ එහෙම බයිසිකල් පදින සෙට් එකක් ඉන්නවා ඉරිදාට ඒක නවත්වන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

**3(13)** <u>මහ නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනි මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මේ දිනවල වයස 60 ට වැඩි පුද්ගලයින් සඳහා එන්නත් කරනවා.ඒ වගේම 20 ට වැඩි පුද්ගලයින් සඳහාත් කරනවා. එන්නත් කරනය පටන් ගත් දා සිට සොයිසා පුර ප්‍රජා ශාලාව ලබා දුන්නා ඒ වැඩසටහන සඳහා. ගරු නගරාධිපතිතුමනි වයසක අය ඉන්නවා ගුරු පල්ලියට වත් යන්නට බැරි අය. ඒ අය අහලා ඇයි ප්‍රජා ශාලාව නොගන්නේ කියලා. එම් ඕ එච් කියලා තියෙනවා ප්‍රජා ශාලාව නගර සභාවෙන් නොදෙන බව මේ පිලිබඳ සත්‍ය අසත්‍ය තාවය දැන ගන්න කැමතියි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, සමාවෙන්න මේ ස්ථානයේ මාධ්‍යවේදින් සිටින නිසා එන්නත් කරණය සඳහා ප්‍රජා ශාලාව නොදෙනවා කියන එක මහ බරපතල විදියට ඒක හුවා දැක්විමක් මාධ්‍යතුල වෙන්නට පුලුවන් විශේෂයෙන්ම ඒ කටයුත්තට අපට සිද්ධ වුනේ වෙන මුකුත් නිසා නොවෙයි ගරු මන්ත්‍රීතුමිය අපේ ගරු කොමසාරිස් තුමාට එම්ඕඑච් කාර්යාලයක ඒක ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා අදාල වෙන්නාවු ලිපියකින් ඉල්ලීම කලා. එතන සිටින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනිය ඒ ඉල්ලීම කරනවා කොමසාරිස්ට එතුමා ඉල්ලීම කරනවා මට. මේ දෙකම කරන අතරතුරේදි මෙතුමියත් අපිට කරපු

අවස්ථාවන් වලදී දිගින් දිගටම අපි දුන්නා අවසානයේදී කොමසාරිස්තුමත් එක්ක ගස්ටනයකට ගිහිල්ලා එහෙම කරන්න පුලුවන්ද එයා කවුද ඒ තැන ට පත්වෙලාමම ලියන්නේ නැහැ කියලා. මේ ධූරධාරිත්වය පණතේ තියෙනවා පැහැදිලිවම විධායක නිලධාරියා බවට පත් වෙන්නේ නගරාධිපතිවරයා කියලා ඒ නිසා ඇති වෙච්ච දෙයක් නිසා නැත්නම් නොදෙනවා නොවෙයි ආමන්ත්‍රණය කල යුතු විදියට ආමන්ත්‍රණය කරන්න ඕන. හෙට මට ඔබතුමියට ලිපියක් එවනකොට දිලාශිනී රාජකාරුනා කියලා මට ලියුම් ලියන්න බැහැ. මහ නගර සභා මන්ත්‍රී දිලාශිනි රාජකරුනා කියලා මට ලියන්න පුලුවන් සභාවෙන් ලියනකොට ඒ වගේ ලියන්න ඕන එක ලියන්න ඕනෑ. විදියට ලියන්නේ නැති නිසා නැත්නම් මේක මාධ්‍යට යන්න පුලුවන් නගර සභාව ස්ථානය දුන්නේ නැහැ කියලා. ස්ථානය නොදීම නොවෙයි ප්‍රශ්ණය තියෙන්නේ අපි එන්නත් කිරිමේ වැඩ සටහනට දිගින් දිගටම ජනතා විමුක්ති පෙරමුණ පවා ටෙන්ට් දිලා තිබුනා අපි පුටු දුන්නා ස්ථානය නොනවත්වාම මුකුත් වැඩක් නැතුව මේක දෙන එක නොවෙයි ප්‍රශ්නය තියෙන්නේ මේ පිලිබදව තියෙනවා පොඩි අපහැදලි තත්වයක් මොකද අධිකරණ ක්‍රියාවලියක් තියෙනවා ඒ වෙලාවේදි යම් යම් විධියට ඒක හසුරුවා ගැනිම සඳහා යම් කිසි විදියකට ඒක එක පැත්තකට අද දවසේදි මම මේක පොඩි අවස්ථාවක් කර ගන්නවා මේ සිදුවිමත් මගේ පෙර සිදුවිමත් අතර මම හිතනවා මේ සිදුවිමත් යම් විදියකට පොඩි ප්ලෑන් එකක් ක්‍රියාත්මක වෙලා ඒ ක්‍රියාත්මක විම තුල ඇති වෙච්චාවූ සිදුවිම ඒ සිද්ධියත් එක්ක වෙලා ඒක වීඩියෝ කරපු විදිය පවා දැන් මට ඇවිල්ලා තියෙනවා. මගේ සිද්දියේදි. මේකත් ඒ විදියේ සිද්ධියක්දෝ කියලා මට පොඩි සැකයක් මතු වෙනවා මේක නිශාන්ත මන්ත්‍රිතුමා ජීවිතේටවත් ඒ වගේ දෙයක් කරන්නේ නැහැ කියලා පුන-පුනා නොවෙයි ඒක සියයට දහස් වාරයක් නොවෙයි ලක්ෂවාරයක් ඒ දක්වා මට හිතන්න පුලුවන් එහෙම හිතා මතා කරනවා නම් සමාව ගන්න ඕන නැහැ. නමුත් ඒ වගේ කුමන්ත්‍රණ සිදුවිමේදි මේක තවත් ක්‍රමන්ත්‍රණයක් මේ වෛද්‍යවරිය ආමන්ත්‍රණය කරන්න ඕන විදියට ආමන්ත්‍රණය නොකිරිම මත සිදු වෙන්නාවූ දේම තමයි එදා වුනෙත් ඒක නැවත වතාවක් මගේ හෙට නඩුව අද මේක ඔබතුතමිය කියලා පත්තෙරේට අරගෙන හෙට නඩුවට මේක පාදක කර ගන්න පුලුවන්

ඒක නිසා මම ගෞරවයෙන් කියනවා මේ මාධ්‍ය වේදින් මේක ලිවිමේදි මේක ලොකු අපහසුවකට ලක් නොවන විදියට මෙය ආවරණය කරන්න මේක මෙතන කියපු ගමන් එක පාරටම දෙන්නේ නැහැ. මෙන්න නගරාධිපතිවරයාගේ ක්‍රියා කලාපය කියන එක හෙට උසාවියට යන තැනට පත් කරන්න එපා කියන එක කාරුණිකව ඉල්ලා සිටිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනි මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, ස්තුතිය ඔබතුමාගේ පැහැදිලි කිරිම පිලිබඳව. ඒ පිලිබඳව වැරදි අවබෝධයකින් ඉන්නේ ජනතාව පැවසුවා. මෙතෙක් කල් ලබාදුන් නගර සභාව ඉදිරියටත් ලබා දෙන්න නගර සභාව බැදි සිටින බව ඒ පැහැදිලි කිරිම පිලිබදව නැවත ස්තුති කරනවා.

**3(14) <u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඔබතුමාට ලිපියක් ඉදිරිපත් වෙලා තියෙනවා එස්.ඩී.පීඩී.සත්කුමාර මහතා විශ්‍රාම යනවා ලබන අවුරුද්දේ අපි කිවුවානේ පරික්ෂණයක් පටන් ගන්න කියලා ඒක කරන්න අරගෙනත් නැහැ ගරු නගරාධිපතිතුමා එතුමා ඉල්ලිමක් කරනවා ඔබතුමාගෙන් මේ සම්බන්ධයෙන් නැවත වරක් සලකා බලන්න කියලා. ඒ නිසා බොහොම ගෞරවයෙන් ඉල්ලනවා විශ්‍රාම යන්න කලින් එහි තියෙන අනුව අවුරුදු 56 න් පසුව දීලා තියෙන නියෝගය අනුව දීර්ඝ කර ගන්නත් බැහැ. ඒ නිසා ඉල්ලිමක් කරනවා මේ සම්බන්ධව නැවත වරක් සලකා බලන්න කියලා.මේ ලිපිය සභාගත කරනවා.

**3(15) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අයිතමය යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න තියෙනවා. ඊට ප්‍රථම අපි කවුරුත් ඉතාමත් කණගාටු වෙනවා අද උදේ සිදුවිම සම්බන්ධව. අපි තේරුම් ගන්න ඕන මහජතාව අපිව පත් කරලා එවන්නේ සභාවල් වලට මහජන ආයතන වලට මතවාදීමය වශයෙන් හැප්පෙන්න මිසක් අතින් පයින් හැප්පෙන්න නොවෙයි.නමුත් මගේ ගෞරව ප්‍රණාමය පුද කරනවා විශේෂයෙන්ම දේශපාලන වෙනස් කම් තිබුනට නිශාන්ත ගරු මන්ත්‍රීතුමාට එතුමා බොහොම නිහතමානි වෙලා සංවේදි වෙලා සමාව ඉල්ලිම ගැන ඒ මහත්මා ගුණය ගැන මම මගේ ප්‍රණාමය පල කරනවා. විශේෂයෙන්ම එතුමාටත් සුදේශ් මන්ත්‍රීතුමාටත් ඒවගේම උපනගරාධිපතිතුමාටත් වචනයක වෙනසක් නිසා විශාල ප්‍රශ්ණයක් වෙන්න ගිහිල්ලා එතුමාත් නිවැරදි කිරිමක් කරා. ඒවා තමයි මහජන නියෝජිතයෙකුගේ පොලිටික්ස් කියන්නේ එතකොට තමයි මනුෂ්‍යයෙක් විදියට කටයුතු කරන්න ලැබෙන්නේ.ගරු නගරාධිපතිතුමනි මගේ පැමිණිල්ල තමයි මොරටුවේ මහා පරිමාණයේ අවන්හල් වලට වඩා කුඩා පරිමාණයේ අවන්හල් තියෙනවා. ඒවාගේ ආහාර ගන්න කොළඹ අහනවා වේටර් ඔබතුමාට අවශ්‍ය දේ විතරක් කියන්න. තෝසේ එකක් නම් එකක්. අපි දන්නවා කොවිඩ් වලට කලින් ලොකු බත්දේසියකට සියලුම දේවල්

තියලා තමයි ගේන්නේ. අපි එකයිනේ කන්නේ.නැවත ඒක අරගෙන ගිහිල්ලා ඊලග මේසයට තියෙනවා. නමුත් මේ වෙලාවේ ඒ ක්‍රමය හරියන්නේ නැහැ. අනිත් ස්ථාන වල ඒවා පාලනය වෙලා තියෙනවා මොරටුවේ තමයි තවම නැත්තේ ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක තුමා මෙතුමා කියපු කාරණය සඳහා අදාල වෙන්නාවූ අත් පත්‍රිකාව අද සභාවෙන් පසුව පිලියෙල කරලා ආහාර ලබාදෙන සියලුම හෝටල් සඳහා ඒ කටයුත්ත කරන්න. මේ සභාවටත් තනි තනි අයට ආහාර අනුභව කරන්න කියන වෙලාවක මෙතුමා තාක්ෂණික කාරණයක් මතු කලේ. ඒ විතරක් නොවෙයි සමහර වෙලාවට අපි කෑම දෙකක් ඇණවුම් කරලා එකක් අනුභව කරලා එකක් ඉතුරු වුනොත් ඒ අවස්ථාවේදිම කුණු කූඩයට දාල පෙන්නනත් එහෙම නැත්නම් අරගෙන යන්න පුලුවන් විදියට අත් පත්‍රිකාව හදන්න. ලබන සතිය වෙනකොට ඒ අනුව සියලුම හෝටල් වල ඒ අනුව කරන විදියට කටයුතු කරන්න.

3(16) <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට ඩෙංගු රෝගීන්ගේ වැඩි වීමක් සිදුවෙනවා. මීට කලින් ඔබතුමාගේ නායකත්වය යටතේ නිවෙස් පරික්ෂා කරනකොට මහජනතාවට තේරුම් ගියා අපේ නිවෙසේ මදුරුවන් බෝවෙන ස්ථාන නිරන්තරයෙන් පිරිසිදු කරගෙන ගියා. කොවිඩ් වසංගතයත් එක්ක එය ජනතාව අතරින් ගිලිහිලා තියෙනවා. නගර සභාවේ සේවකයන් නිවසේ ගේට්ටුව ලඟට ගිහිල්ලා විස්තර දැනගන්නවා විතරයි කරන්නේ. එම නිසා සේවකයන්ව දැනුවත් කරන්න නිවසට ගිහිල්ලා මේ සම්බන්ධව නීතිමය කටයුතු කරනවා කියලා එහෙම නැති වුනොත් වෙන්නේ කොවිඩ් වගේම විනාශයක් මේ තුලින් වෙන්න පුලුවන්. එම නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියන ඉල්ලිම කරනවා.

3(17) <u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ අයිතමයට ඇතුලත් නුනත් මම ගිය සභාවේදි ඉදිරිපත් කලේ සැලිනා විද්‍යාලය කියන වචනය සහිරා විද්‍යාලය කියලා සංශෝධනය කරන්න කියන ඉල්ලිම කරනවා. ගරු නගරාධිපතිතුමනි 2021 වර්ෂයේ අප සභාවේ අවසාන වාරය. අපි බදු ගෙවන කොළයේ පිටුපස කරුණු 10 ක් සඳහන් කරනවා. අංක 1 නාගරික බල ප්‍රදේශයේ මාර්ග අලුත්වැඩියාව හා නඩත්තු කිරිම. අංක 2 ඔබේ නගර සභාව පිරිසිදු කර ගැනිම. අංක 3 පොදු

වෙළඳ පොලවල් පවත්වාගෙන යාම. මේ වගේ තියෙනවා ඒවායින් අපි 25% ක් කරලා තියෙනවද 50% ක් කරලා තියෙනවද 75% අපි ගත්තොත් මාස 12 තුල අඩුපාඩු රැසක් තියෙනවා ගරු නගරාධිපතිතුමනි විපක්ෂයේ මන්ත්‍රිවරු මේ මාස 12 තුල කථා කරපු දේවල් ඔබතුමා කරලා තියෙනවද. රවිනාත් ගරු හිටපු නගරාධිපතිතුමා ගේ කාලයේ සෑම බල ප්‍රදේශයකටම පක්ෂයක් නොබලා ප්‍රිමික්ස් යවලා තියෙනවා. 2022 වර්ෂයටත් මේක වෙන්න එපා ආණ්ඩු පක්ෂය විපක්ෂයද කියලා බලන්න එපා කියන ඉල්ලීම කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපේ නගර සභාවේ සියලුම දෙපාර්තමේන්තුවල හොඳ නිලධාරි කණ්ඩායමක් ඉන්නවා. හිටපු නගරාධිපතිතුමාගේ පාලන කාලයේදි මේ නිලධාරින්ට වැඩ කටයුතු භාර දිලා තිබුනා නගරාධිපති විදියට ඔක්කොම පුරෝ ගත්තේ නැහැ. නිලධාරින්ගේ වැඩත් නගරාධිපතිතුමා භාර ගත්තේ නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා බාධා කරනවා නොවෙයි. මෙතුමාගේ ස්ටයිල් එක ඉතාමත්ම හොඳයි නරක එකක් නොවෙයි. ස්ටයිල් එකට එම නිලධාරින් හිටියා නම් මම 2006 නගරාධිපති වෙන්නේ නැත. මගේ ස්ටයිල් එකට නිලධාරි නතු නොවුනොත් මට 2011 ත් නැහැ 2018 ත් නැහැ ඊලඟ එකේ 2023 ත් මගේ කර ගන්න ඕන නිසා ජනතාවගේ බලාපොරොත්තු මම මූලිකත්වය අරගෙන කරනවා ඒක නවත්වන්නේ නැහැ. ඔබතුමා කරන්න හදන්නේ මෙතුමාට වෙච්ච දේම මට කරන්නද.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඒක නොවෙයි කියන්නේ අපේ වැඩේ කෙරෙන්නේ නැහැනේ ගරු නගරාධිපතිතුමා ඔබතුමා අතට අරගෙන හරි විපක්ෂයේ වැඩේ කෙරෙනවා නම් කමක් නැහැ. ලබන්නාවූ නත්තල සහ අලුත් අවුරුද්ද නිරෝගිමත් සහ සාමය සතුට පිරි වසරක් වේ කියා ප්‍රාර්ථනා කරනවා.

**3(18)** <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මෙම අයිතමය යටතේ කරුණු කිපයක් තියෙනවා. එකක් අපේ සේවා ස්ථාන වල තියෙන සමහර තත්වය හොඳ නැහැ. මම දැක්කා පහුගිය දිනයක අපේ සේවා ස්ථානයකට පොලිසියෙන් පැන්නා ඒ

අවස්ථාවේ පැන නැගුනේ මත් ද්‍රව්‍ය පිලිබඳ තත්ත්වයක්. මම කොමසාරිස්තුමාට ඒ වෙලාවේ කථා කරලා කිවුවා. නමුත් ඊයේ-පෙරේදා නැවත අදාල සේවකයන්ගෙන් පොලිසියෙන් ප්‍රශ්ණ කරන්න ගත්තා ඒ වෙලාවේ හිටියේ එකඟ නොවන සමහර කටයුත්තක් කරමින්. ඉතාම නරක විදියට මේ පොලිසිය පැත්තෙන් ඔවුන්ට දොස් පවරනවා. එනිසා මේ සේවා ස්ථාන වල ඇතිවෙලා තියෙන තත්ත්වය පිලිබඳව මීට වඩා වැඩියෙන් සොයා බලලා මේ තත්වය සුදු ක්‍රිඩාව වෙන්න පුලුවන්, අරක්කු බෙන එක වෙන්න පුලුවන් සමහර තැන් වලට මෙතෙක් ආපු නැති මත් ද්‍රව්‍ය එමින් තියෙනවා කියන ආරංචිය තියෙනවා එම නිසා මේවා වැඩි සැලකිල්ලට ලක් කරන්න ඕන මොකද මේවා අරක්ගත්තොත් අපිට අමාරු වෙනවා. අවධාරනය කරන්නේ ඇති නොවෙන්න වග බලා ගන්න කියලා තමයි ඉල්ලා සිටින්නේ.

## 3(19) <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, වාහන පාක් කරන්න තමයි මේ ස්ථානය හැදුවේ කියන එක මොරටුවේ සැලකිය යුතු පිරිස් දන්නවා. ඒ නිසා අපෙන් දිගින් දිගටම ප්‍රශ්ණ කරනවා මොරටුවට ආවාම වාහනය නවතා ගන්න තැනක් නැහැ. වාහන අංගනයක් හදලා තියෙනවා නමුත් ඒකට අවස්ථාව තාම නැහැ. ඔවුන්ගේ පැත්තෙන් ඉල්ලිමක් එනවා ඒ සඳහා අවස්ථාව දෙන්න කියන එක. ඒ පිලිබඳව යම් ක්‍රියා මාර්ගයක් ගන්න කියන ඉල්ලිම කරනවා.

## 3(20) <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ලුනාව රෝහල ඉදිරිපිට ඉතාම අනතුරු දායක වලක් තියෙනවා දැනට කීපදෙනෙක් වැටිලා තියෙනවා කියන ආරංචිය තියෙනවා. ප්‍රිමික්ස් ටිකක් දාලා හදා ගන්න පුලුවන් එකක් කියලා තමයි කියන්නේ. ඒ පිලිබඳව අවධානය යොමු කරන්න කියන ඉල්ලිම කරනවා.

## 3(21) <u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රිතුමා කථා කරපු දැන් දිගින් දිගටම අපේ ආයතන පරිශ්‍රය තුල ගංජා, කුඩු, අයිස් පාවිච්චි කරලා දැන් අපේ සේවකයෝ ප්‍රශ්ණයක් වෙලා තියෙන්නේ. කොමසාරිස්තුමාටත් මතක් කරන්න ඕන කුණු අදින සේවකයෝ කුඩු අයිස් බිලා තමයි සේවය කරන්නේ කලින් අපිත් එක්ක වැඩ කරපු කාණු වීම් එකේ කොල්ලෝදිගින් දිගටම කුඩු ගහනවා. කුඩු පැකට් එකක් දැන් 3000/- 4000/- ක් වෙනවා දවසට 3 න් පාරක්කුඩු ගහන්න ඕන නැත්නම් පෙති ගහනවා මේක අපේ නගර සභාව වහගෙන තියෙන්නේ. දැන් ඒ කට්ටිය අයින් කරලා අනිත් අය

බේර ගන්න ඕන. ලොරියක හතර දෙනෙක් යනවානම් අනිවාර්යයෙන්ම දෙන්නෙක් ගහනවා. මොනවා හරි හදිසි මෙහෙයුමක් කරලා නගර සභාව බේර ගන්නත්, කොල්ලෝ බේර ගන්නත් ඕන ඒ පිලිබඳ අවධානය යොමු කරන්න කියන ඉල්ලිම කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මම මේ එකින් එකට උත්තර දෙනවා නොවෙයි. මේ උත්තරයට ලංකාවේ ම මතවාදය ඒකම මතුවෙමින් මුලු ලෝකයටම අන්තර්ජාලය ඔස්සේ යන මේ කතිකාව තියෙනවා. ගරු නිශාන්ත මන්ත්‍රිතුමා,ගරු ඔසඳ හර්ෂන මන්ත්‍රිතුමා කියපු දේ පිලිබඳව විවාදයක් නැහැ. එහෙම තියෙන්නට පුලුවන්. හැබැයි එකම දේ තමයි කොවිඩ් වසංගතය එක්ක අපි අවුරුදු 1 ½ ක් හිටියා. ගරු අනුරසිරි මන්ත්‍රිතුමා කියපු එක තමයි මට මතක් වෙන්නේ. හැමදාම උදේ 7 ට විතර මෙතනට ඇවිල්ලා අද රෝහිත ආවද? මංජු ආවද? නාවද ?මොන වාහනේ රෝදයෙද හුලං ගියේ ඒක නැති වුනා  අවුරුද්දයි මාස 8 ක් තිස්සේ සන්නිවේදනය ඒ නැති කර ගැනිම තුල ඇති වුන මුලික සිද්ධාන්ත තුල එක කොටසක් ඔය ඇවිල්ලා තියෙන්නේ. මම අතින් අල්ලගෙන ගහල තියෙනවා. හදලා තියෙනවා ගෙවල් වල නෝනලාව ගෙනල්ල හදලා තියෙනවා හොරකම් වලදි හදලා නැවත සමාජයට අරගෙන තියෙනවා මෙ මේ අත්දැකිත් තියෙනවා. මේ අත්දැකිම් නැවත ඔවුන් එක්කම බෙදා ගන්න බැරි කාලකණ්නි ලෝකයකටම බෙදා ගත්ත කාල පරාජයක් නිසා පොඩ්ඩක් උස් වෙන්නට හේතුවුනා. අහිංසකයින්ව දැන් එලියට දාන්න පුලුවන් කමක් නැහැ. මේක ජීවිකාව කරගෙන පවුල් සංස්ථාවක් යැපෙන තත්වයකි පිරිසක් තමයි මේකේ ඉන්නේ. මේ පිරිස අපිව තුන් වතාවක්ම මේ තැනට ගේන්න මහන්සි වුන පිරිසක් නිසා පොල්ලකින් ගහලා හරි කමක් නැහැ දුවන්නට ඕන. මහත් සේ මේ ලංකාවටම ආදර්ශයක් වෙන්න වැඩ කරපු සේවක සංඛ්‍යාවක් ඉන්න නිසා ඔවුන්ව නැවත වතාවක් ඒ සේවාව ගන්නවා වගේම ඔවුන්ගේ ජීවිත වලට ලොකු වටිනාකමක් දෙන්න පුලුවන් වැඩ සටහනක් අපි සියලු දෙනාම එකතු වෙලා මෙතනදි ඔවුන්ට අවහිරයක් කරන්න නොවෙයි එලියට දාන්න නොවෙයි නමුත් ඔවුන්ව හදාගන්න ඕන නිසා කිසිම ප්‍රශ්ණයක් නැහැ. පැකිලිමකින් තොරව ඒ නම් දන්නා තරමින් ලබා දෙන්න.  නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රිතුමා ඔබතුමා ඔබ කියපු අපේ රථ ගාල මේ වෙනකොට අපි සැලසුම් කරලා තියෙන නව සුපර් මාර්කට් එකක් එක්ක හදන්න යන ඒ කට්ටියව ගේන්න සැලසුම් කරලා තියෙන තැන මෙතන නිසා අපිට ඒක කරගන්න බැරි වෙනවා නැත්නම් බලාගෙන ඉදිව් රථගාල විවෘත කරන්නේ නැත්තේ ඇයි කියන තැනට එන නිසා මේ වෙන

කොට සැලසුම් කරලා තියෙනවා මම විතරක් නොවෙයි පහුගිය වකවානුවේදි යූ.ඩී එකට තාමත් අත්පත් කරලා දුන්න කොටසක් තියෙනවා මේක සංවර්ධනය කිරිම ඒ තැන ඒක මම හිතන්නේ සජිත් දුමින්ද ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධව දන්නවා ඒ සඳහා ඔවුනුත් පාවිච්චි කරන්න හිටියේ මේ ස්ථානයම මොකද ඒ දවස්වල කඩ 38 ක් ද කොහෙද අපි දැන් සැලසුම් කලාම කඩ 78 ක් ද ඇවිල්ලා තියෙනවා ඒ ඔක්කොම ටික දාලා ඒක සැලසුම් කරන්න ඕන නිසා රථ ගාල හැදුවොත් අපිට ඒ සංවර්ධන කටයුත්ත කරන්න බැරි වෙනවා නැත්නම් මේක පත්තරේ ලියවෙන්න පුලුවන් රථ ගාල හදලා අවුරුදු තුනකට වැඩියි තාම විවෘත වෙන්නේ නැහැයි කියලා. ඒක නිසා මම මේක කිව්වේ වෙන මුකුත් නොවෙයි මේක නිවැරදි කර ගන්න ගියාම නිවරදි කර ගන්න වෙන්නේ තවත් මාසයකට පස්සේ එතකොට ඒක සභාවේ මුකුත්ම දන්නේ නැහැනේ නගරාධිපතිවරයා ආණ්ඩු පක්ෂය මුකුත් දන්නේ නැහැ නිලධාරි මුකුත් දන්නේ නැහැ කියලා මාධ්‍ය තුලය මේක යන්න පුලුවන් නිසයි මේක කිව්වේ.

**3(22)** <u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අයිතමයට කථා කරන්න කලින් උදේ ඇතිවුන සිද්ධිය සම්බන්ධව කථා කරන්න ඕන. මීට ඉහත දවසකදි නිශාන්ත මන්ත්‍රීතුමාට ගහ ගන්න කථා කලා එදා ඔබතුමා මේ විදියට මැදිහත් වුනා නම් මේ සිද්ධිය අද වෙන්නේ නැහැ. ඒ වගේම වීඩියෝ කරපු එකටත් මම කියන්න ඕන. අපිට මෙතන දොරටුව ලඟ යම්කිසි සිද්ධියක් වෙන වෙලාවේ ඒක වීඩියෝ කරලා මුහුණු පොතේ දාලා දිගින් දිගටම අපිට ප්‍රහාර එල්ල කලා. එතකොට වීඩියෝ කරන්න හොඳයි දැන් හොඳ නැහැ. ඔසඳ මන්ත්‍රීතුමාගේ අයවැය කථාවේදි එතුමාගේ මල්ලි මෙතන උඩ ඉඳගෙන වීඩියෝ කලා ඔබතුමා ඒක දැක්කා මුකුත් කථා කලේ නැහැ. අපිට ඒවා ගැනත් ගැටලුවක් තියෙනවා. මේවා ගැන සොයා බලන්නවා නම් ඒවා ගැනත් සොයා බලන්න. ඒවගේම සියලුම දෙනාට එකම නීතිය ක්‍රියාත්මක කරන්න. ගරු නගරාධිපතිතුමනි මම අසාගෙන හිටියා සියලුම කරුනු මේ රථ ගාල සම්බන්ධව මම කියන්නේ එතෙක් ඔබතුමාගේ වැඩේ පටන් ගන්නකම් ඉස්සරහට උත්සව කාලය එනවා වාහන නවත්වා ගන්න බැරි කාලයක් එන්නේ. එතකන් මේක වහලා තියෙන්න එපා අපරාදේ ජනතාවගේ මුදල්. මේ ලිපියේ ලියලා තියෙනවා කොමසාරිස්තුමාටත් අවධානය යොමු කරන්න කියලා. ගරු නගරාධිපතිතුමා, ඒවගේම ඔබතුමාගේ අවධානය යොමු කරනවා 13,14,15 මොරටුව රන් හටන පටන් ගන්නවා. ක්‍රිඩාංගනයේ සමහර තැන් වල අඩුපාඩු කම් අපි දැක්කා පුලුවන් තරමින් ඒවා හදලා දෙන්න මේ

ගහන්නේ ගිය අවුරුද්දේ මැච් එක ඊට පස්සේ මේ අවුරුද්දේ මැච් එකත් එනවා. දරුවන්ගේ කුසලතාවය පෙන්නන්න බැරි වෙලා තිබුනා කොරෝනා ප්‍රශ්ණය නිසා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, අඩුපාඩු කියන්නේ මොනවද කියන්න.

**මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා**

ගරු නගරාධිපතිතුමා, ලකුණු පුවරුව අබලන් තත්වයක පවතින්නේ.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, අහගන්න, කරන්න ඕන එක අපි දන්නවා. මේ වෙනකොට දරුවනුයි දෙමාපියනුයි ගුරුවරුත් නැතුව මැච් එක ගහනන අවසරයක් ඉල්ලන්න ඔක්කොම කටයුතු කරලා තියෙන්නේ. ඒ අවසරය දුන්නේ නැත්නම් මැච් එක පවත්වන්න බැහැ. සෞඛ්‍ය නීතිරීති වලට යටත්ව ඔය කියන එක ෆැමිලියන් එකක්වත් හදන්නේ නැහැ ස්කෝර් බෝඩ් ඔක්කොම මැච් එකක් ගහන්න පුලුවන් තත්වයට පවත්වලා ප්‍රිමිලි මැච් ගහලා දැනට ප්‍රිමිලියන් මැච් 30ක් බුක් කරලා තියෙනවා දැනට 12 ක් ගහලා ඉවරයි. ලංකාවේ තියෙන හොඳම විකට් එක බවට පත්වෙලා තියෙන මේ විකට් එක . කථා කරන්න ඕන එක කථා කරන්න මන්ත්‍රීතුමා කොමසාරිස්තුමාව ගිය සභාවෙදිත් ඔබතුමා ඕක කලා ඕක දිගින් දිගටම කරන්න මම ඉඩ තියන්නේ නැහැ. කොමසාරිස්තුමාව අභියෝගයට අවමානයට ලක්කරන්න මේ සභාවක් මේ තියෙන්නේ ඒ සභාවේ දෙපාර්තමේන්තුවල ප්‍රධානියා විදියට විතරයි කටයුතු කරන්න පුලුවන්. ඔබතුමා මන්ත්‍රීතුමා වෙලා තමයි සභාවක් තුල මන්ත්‍රී වෙලා තියෙන්නේ. ඔබතුමා සභාවක් නැතුව මන්ත්‍රී කෙනෙක් වෙලා නැහැ. සභාව තුල ඔබතුමාට යටින් තමයි මෙතුමා ඉන්නේ ඔබතුමා ඕකවත් තේරෙන්නේ නැහැනේ. ඔබතුමාට කියන්න ඕන තැන් වලට කියන්නේ නැතුව දේවල් වෙන්නේ නැහැ. එතුමාට කිව්වා කියලා එතුමාව අපහසුවට පත් කරන්න ගරු තිසර මන්ත්‍රීතුමන්ලා ඒ පැත්තේ නායකත්වය දරන නිසා විපක්ෂ නායක රවිනාත් මහත්මයා කිව්වානම් එතුමා ලස්සනට මේක කියලා දෙයි. ඒක නිසා කරුණාකරලා මේක කියලා දෙන්න මේක හොඳ නැහැ. මෙතුමා මේ ශිට් එකේ ඉන්නකොට අපිත් ඕන තරම් කථා කරලා තියෙනවා. අපි නිලධාරින්ව අභියෝගයට ලක් කරලා නිලධාරින්ට

අශෝභන විදියට කථා කරලා එහෙම අපේ නැහැ. අපි ඔය තැන් වල හිටියා. මේවා දිගින් දිගටම මේ විදියට කථා කරන්න යන්න එපා. ඒවා හොඳ නැහැ.

__මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා__

ගරු නගරාධිපතිතුමා, දේශපාලනයට වැඩ කරන නිලධාරි පිරිසකුත් ඉන්නවා හොඳ නිලධාරි පිරිසකුත් ඉන්නවා . ක්‍රිඩාංගනයට ඇතුල් වෙන තැන ලොකු මඩ වලක් තියෙනවා. මට විතරක් නොවෙයි සියලුම දෙනාට තියෙන ප්‍රශ්ණ මේවා ගැන සොයා බලන්න පොඩි දේවල් මේවා. ඉන්ඩෝ විකට් එක නවත්වල තියෙන්නේ ඒකේ ක්‍රිඩා කරන්න බැරි නිසා.

__නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා__

ගරු නගරාධිපතිතුමා, මේ කරුණට අදාලව කියන්නේ. අපි ආදර්ශයක් වෙන්න ඕන මොරටුවේ ජනතාවට සහ දූවා දරුවන්ට. මොකද මම දැකලා තියෙනවා යම් යම් අවස්ථාවල ප්‍රවෘති බලනකොට සභාවල් වල ගහගන්නවා රන්ඩු කරනවා මේව පෙන්නනකොට ගෙවල්වල ළමයි බලනවා. මේක හරි අශෝබන තත්වයක්. මාධ්‍ය අපට නවත්වන්න බැහැ. නමුත් අපි මන්ත්‍රිවරු වශයෙන් මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න ඕන. සභාවක් වශයෙන් නිරෝෂන් මන්ත්‍රිතුමා විඩියෝ කරනකොට මම නැවැත්තුවෙත් මම විශ්වාස කරනවා ඒක වැරදි වැඩක් ඒක මුහුණු පොතේ දැම්මම සභාවේ අශෝබන තත්වය තමයි පැහැදිලි වෙන්නේ. ඒක නිසා තමයි වීඩියෝකරන එක වලක්වන්න උත්සහ කලේ. මම දකින්නේ නැහැ හොඳ කාර්යක් වශයෙන් ඔබතුමා ඔබතුමාගේ අයවැය කථාවෙදි දාල තිබුනා ඒක ගැටලුවක් නැහැ නමුත් මේවා වීඩියෝ කරලා සමාජ මාධ්‍ය දැම්මම ඔබතුමාටත් හොඳ නැහැ සභාවටත් හොඳ නැහැ අපටත් හොඳ නැහැ ඒ නිසා තමයි මමත් ඒක අනුමත කරන්නේ නැහැ ගරු නගරාධිපතිතුමනි. ඒවගේම නිරෝෂන් ගරු මන්ත්‍රිතුමා කිවුවා සුපර් මාකට් එක, රථ ගාල කරන්න පටන් ගන්න කියලා මම විශ්වාස කරනවා රථගාල පටන් ගත්තොත් අපිට අවශ්‍ය වෙලාවේදි අපට ඒක ඉවත් කර ගෙන ඒ ක්‍රමයට යන්න බැරිවුනේ ඒක ගැටලුවක් වෙනවා. එතුමාගේ අදහසත් හොඳයි ක්‍රියාත්මක වුනොත් හොඳයි නමුත් ඊට වඩා ලොකු වැඩ පිලිවෙලක් අපි තුල තියෙන නිසා ඒක ක්‍රියාත්මක කර ගන්න ඔබතුමා ගේ සංකල්පය හොඳයි පුලුවන් නම් මම අදහසක් හැටියට ඉදිරිපත් කරනවා නත්තල් සමයේ කලබලකාරි තත්වයක් මතුවෙනවා එය පරික්ෂාවකට ලක්වෙන්නත් එක්ක වාහන තදබදය නැති වෙන්න ආදාර්ශයක් ගන්නත් එක්ක උත්සහයක් කරල බලමු කියල ඉල්ලිමක් කරනවා.

**3(23)** <u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා පෙත්සම් යටතේ කරුණු කීපයක් තියෙනවා ඉදිරිපත් කරන්න. එකක් තමයි මොරටුව නගර සභා සීමාව තුල තිබෙන මාර්ග වල නාමපුවරු වල ප්‍රශ්ණයක් තියෙනවා. මම යෝජනා කරන ගමන්ම මටත් ප්‍රායෝගිකව මේකට දායකත්වයක් දක්වන්න ලබා දෙන්න පුලුවන් කමක් වෙන්න නිසා මම ඉල්ලීමක් කලා නගර සභාවට උදවුවක් කරන්න මගේ හිත මිත්‍ර ඕපල් ජිඩිටල් ආයතනයේ තුෂාර සහෝදරයාගෙන් එතුමා බෝඩ් 30 ක් ගහලා දෙන්න කැමැත්ත ප්‍රකාශ කලා තවත් අවශ්‍ය පරිදි ඉදිරියේදි ලබා දෙන්න සූදානම් ඒ නිසා මම ප්‍රායෝගික වාදයෙක් වශයෙන් ඉදිරිපත් කරන අතර ඔබතුමාගේ අනුමැතිය ඉල්ලනවා මොරටුව නගර සභාවේ කොන්දේසි වලට යටත්ව ඒවගේම එතුමාගේ ආයතනයේ යම් අනුග්‍රහයක් දායකත්වයක් පෙනෙන අයුරින් ඒක අනුමැතිය ලබා දෙන්න කියලා. ත්‍රියිභාෂාවෙන්ම නම දාලා පහල කොටසේ ආයතනයේ දැන්වීමත් සමඟ සම්මත කර ගැනිමක් තියෙනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි,ඒවගේම මත්ද්‍රව්‍ය ගැටලුවට විසඳුමක් ලෙස සභාවෙන් ඇතුලතත් මානව සම්පත් කළමනාකරණය කියන විෂය යටතේ යම් විසඳුමක් කරන්න කියන ඉල්ලිම කරනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, වීරපුරන් අප්පු උද්‍යානය හදනකොට ඒකේ යෝජකයා විදියටත් එය ක්‍රියාත්මක භාවයට පත් කරන්න තදබදය අඩු කර ගැනිම සඳහාත් මේ කටයුතු ඉක්මනින් කරන්න කියන ඉල්ලිම කරනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කොවිඩ් වසංගතය තුලදි සමහර මිනිස්සු ස්වං රැකියා කරනවා නත්තල් කාලයට ඇවිල්ලා පොඩි කඩ දාගෙන ඉන්නවා ඉදිරියේයේ කොවිඩ් වලට යටත්ව කරන්න අවසර ලබා දෙන්න කියන ඉල්ලිම කරනවා. ඒවගේම ව්‍යාපාති කරලා ආණ්ඩුවට පැවරුවාට පසුව ඔවුන් ඒක සුරක්ෂිත කර ගන්නේ නැහැ මම යෝජනා කරන්නේ අපේ ප්‍රදේශයේ තියෙන මහල් නිවාස වලටත් පුනර්ජිවන වැඩ සටහන යටතේ කොහොමද ගයිඩ් ලයින් එකක් දෙන්නේ මේක ආරක්ෂා කර ගන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

**ඔබතුමා කථා කරපු එකේදි මම හිතනවා** ගරු කොමසාරිස් තුමා අපි දිගින් දිගටම යකඩත් එක්ක හදන මේ බෝඩ් තියෙන්නේ මාස 10 – 12 . ඒකට වැය වන මුදලත් එක්ක දෙකේ තුනේ කණු දෙකක් එක්ක අඟල් 6 ක් ලෑල්ලක් දාලා අකුරු කැටයමින් හෝ ලියලා අවුරුදු 20-25 ක් පාවිච්චි කරන්න පුලුවන් කියලා මම විශ්වාස කරනවා. දළදා මාලිගාවේ තාම තියෙනවා වියදම සමාන වෙනවා නම් මම හිතනවා යකඩ වලට වඩා පැවැත්ම තියෙනවා කියලා.අපිට පුලුවන් නම් කොමසාරිස්තුමා ස්ථිරවම කරලා බලමු පුලුවන් ද කියලා.

**3(24)** <u>මහ නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම අහගෙන හිටියා රවිනාත් ගරු මන්ත්‍රීතුමාගේ කථා කලේ සභාවේ ගෞරවය වෙනුවෙන්, ඒවගේම නිශාන්ත ගරු මන්ත්‍රීතුමා කථා කලේ එතුමා අතින් සිදුවුන වරද නිවැරදි කර ගත්තේ සභාවේ ගෞරවය නිසා අපේ සියලු මන්ත්‍රීවරු එහෙමයි. එවන් ගෞරවයක් තිබෙන වෙලාවක මගේ මැණියන් ගේ අසනීපයත් එක්ක මමත් හිතේ ලොකු වේදනාවක සිටින වෙලාවේ ආවාම මෙහෙම ලිපියක් ලැබුනා මට ඒ අවස්ථාවේ ඊටත් වැඩි වේදනාවක් ඇතිවුනා ගරු නගරාධිපතිතුමනි මේ සම්බන්ධව යමක් කියන්න කැමතියි. සභාව මගින් අක්‍රමිකතාවයක් සිදු වෙලා තියෙනවා කියලා ආදාහනාගාර කරද්දි. ඒ සම්බන්ධව මට යමක් කිය යුතුයි. මම මුලින් ම රාවතාවත්ත ආදාහනාගාරය හැදුවේ. එතනදි මට සම්මානයක් ලැබුනා ලක්ෂ 39 ක් ඉතිරි කරා කියලා. සභාවේ සිටින බොහෝ දෙනෙක් දන්නේ නැහැ ගරු නගරාධිපතිතුමනි ලක්ෂ 39 ක් ඇස්තමේන්තු කරලා තිබුනේ මම හදන්න අවුරුදු හතරකට කලින් ආදාහනාගාර යන්ත්‍රය අලුත්වැඩියා කරන්න නමුත් අපි හදද්දි ඉංජිනේරු තුමා මට කිව්වේ අලුත්වැඩියා කරන්න බැහැ අලුත් එකක් ගන්න වෙනවා ලක්ෂ 60 ක් යනවා කියලා. ඒ වගේ දෙයක් තමයි ගරු නගරාධිපතිතුමනි අපි ලක්ෂ 3 කට ආසන්න මුදලින් කලේ. අනිත් යන්ත්‍රය කවුරුවත් දන්නේ නැහැ කඩාගෙන වැටුනා. ඒකේ ලොකු අලුත්වැඩියාවක් කලා පිට ආයතනයකට භාර දුන්නා නමුත් ලක්ෂ 30 ඉක්ම යනවා. ඒක කලා කිසිම කෙනෙක් දන්නේ නැහැ. අඟුලාන ආදාහනාගාරය අලුත්වැඩියාව ඒක ලක්ෂ 10 ඉක්මවන අලුත්වැඩියා කටයුත්තක් ගරු නගරාධිපතිතුමනි ඒකත් කරලා දුන්නා. ඒවගේම එගොඩඋයන ලක්ෂ 30 ඉක්මවන අලුත්වැඩියාවක්. ඒකත් කරලා දුන්නා. අවසාන වශයෙන් අඟුලාන ආදාහනාගාරය කලා. මම කියන්නේ ගරුනගරාධිපතිතුමනි ආදාහනාගාර අක්‍රියව

තිබියදි මුලිකව කරපු කටයුතු මේ. ඒ අතරතුර සේවා කටයුතු අනන්තව කලා. කවුරුවත්දන්නේ නැතිව ඔබතුමා මට කියලා බොඩි එක ඇතුලේ තියලා මම උඩට නැගලා හදපු ඒවා ඕන තරම් තියෙනවා.

එවන් සේවාවක් කරපු මට මම මගේ ගෞරවය විතරක් නොවෙයි ගරු නගරාධිපතිතුමා, කොමසාරිස්තුමා,නිලධාරි වරුන් මම කරපු සේවය මේ සභාවම ඇගයිම් කලා. මම මෙයට නිහඩව හිටියොත් ගරු නගරාධිපතිතුමනි පක්ෂ/විපක්ෂ සියලුම මන්ත්‍රිවරුන්ට කරන අසාධාරණයක් මේ වගේ චෝදනාවකට මාව හෝ කාව හෝ ලක් වෙනවා කියන්නේ ඒ වෙනුවෙන් ගෞරවය දක්වපු සියලුම දෙනාට හොඳ නැහැ.මම මේ කියපු සියලුම ඒවාට වියදම් වෙනවා කෝටි 1 ½ ක් වැය වෙන වැයක් මම හිතන්නේ ලක්ෂ 25 කින් විතර. ගරු නගරාධිපතිතුමනි දුම සම්බන්ධව ගැටලුවක් තියෙනවා ඒක නිතරම කියනවා. මේ දිනවල වැඩිපුරම කොවිඩ් ආදාහනය කරන ඒවා තමයි අලුත්වැඩියා කටයුතු වෙන්නේ. මට දැන් නිතරම හතිය වගේ තියෙනවා ගරු නගරාධිපතිතුමනි. සාමාන්‍යයෙන් මිනිස්සුන්ගේ ශරිරවලින් යම් කිසි කිරණයක් පිට වෙනවා. ආදාහනාගාරයක් අතුලට ගිය කෙනෙක්ගේ ඒ කිරණ පිටවෙන්නේ නැහැ දින 6-7 ක් යනතුරු ඒයා හරි මුසලයි කියලා මාව දැක්කම කෙනෙකුට දිරවන්නේ නැහැ. ඒවා මගේ නෝනට,දරුවන්ටදිරවන්නේ නැහැ. ඔබතුමා ලඟට ආවාම ඔබතුමාටත් කේන්ති යනවා වැඩියි. මම ඒක අත්දකිනවා. ආදාහනාගාරයේ උඩට නැග්ගට පස්සේ මම අමුතුම මනුෂ්‍යයෙක් වෙනවා. එච්චර බාදක තියෙද්දිත් ගරු නගරාධිපතිතුමනි මම මේ කටයුත්ත කරන්නේ. කිසිම මන්ත්‍රිවරයෙක් මට කවදාවත් වචනයක් කියන්නේ නැහැ මට ගෞරවය දුන්නා. පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙක් අපේ සම්බන්ධිකරන සභාපතිතුමා ගරු ජනාධිපතිතුමාට ලියුමක් යවනවා මේකේ අක්‍රමිකතා සිදුවෙනවා කියලා. අපේ සියලුම දෙනා ගෞරවයෙන් කථා කරපු මගේ මන්ත්‍රිධුරයමට කවදාහරි ඔබතුමා හරි ගරු ජනාධිපතිතුමා ලගට ගිහිල්ලා කිව්වොත් මෙන්න මේ මන්ත්‍රතුමා තමයි මොරටුවේ අපේ ආදාහනාගාරය හදන්නේ කියලා. නිකංවත් කිව්වොත් මම දන්නවා තමුසෙලාගේ කෙරුවාව ගැන මම දන්නවා කියලා කිව්වොත් ජනාධිපතිතුමා එදාට. මේක දරුණු ප්‍රකාශයක් ජේ වී පී චේවා යු එන් පි චේවා මේක පක්ෂයට අදාල දෙයක් නොවෙයි මේක පොදුවේ මුලු සමස්ථ මොරටු ජනතාවටම. ඉතාමත්ම දරුණුයි. මම කිව්වේ මගේ හදවතට අම්මා මියගිය වේදනාව දරා ගන්න පුලුවන් නමුත් මට මේක දරා ගන්න බැහැ ගරු නගරාධිපතිතුමනි. එම නිසා ගරු නගරාධිපතිතුමනි ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු කොමසාරිස්තුමාගේ ප්‍රධානත්වයෙන් කල යුතු උපරිමයෙන් කල

යුතුයි. උපනගරාධිපතිතුමා එතුමාගේ ප්‍රකාශය කලා එතුමා මේ වගේ දෙයක් කලේ නැහැකියල. එතකොට මේක කරන්නේ කවුද? තව කියලා තියෙනවා දුම් බටයේ පහල කොටසේ ලොකු සිදුරු තියෙනවා කියලා මම දැකලා නැහැ එහෙම තියෙනවා. මොකක් හෝ තාක්ෂණික දැනුමක් ඇතිව ඕන ජනාධිපතිතුමාට ලියන්න.

**3(25) <u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමණි ඉතා කෙටියෙන් යමක් ප්‍රකාශ කරනවා. ඔසඳ මන්ත්‍රීතුමා ප්‍රකාශ කරා කුණු ලෝරිවල යන සේවකයන් අයිස් මත්ද්‍රව්‍ය පානය කරලා සේවයේ යෙදෙනවා කියලා.මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා එක ඉතා බරපතල ප්‍රකාශයක්.මොකද ආයතන සංග්‍රහයේ තියෙනවා රටේ නිතියෙත් තියෙනවා රජයේ සේවකයන් සේවයේ යෙදෙන කොට මොනවගේ විනය ක්‍රියාමාර්ගද ගන්න ඕන කටයුතු කල යුත්තේ කියලා.එවගේම මේවගේ දෙයක් හැන්සාඩ්ගතවීම ඔබතුමාටත් හොද නෑ සභාවටත් හොද නෑ.එ හින්දා මම ඉල්ලීමක් කරන්න කැමතියි එක සම්බන්ධයෙන් පරික්ෂණයක් කරලා නිසි පියවර ගන්න කියලා නැත්නම් එක මොරටුවේ ජනතාව දැන ගත්තෝත් කුණු ලොරිවල යන සේවකයන් මත්ද්‍රව්‍ය පානය කරලා තියෙනවා කියලා එක සභාවටත් මන්ත්‍රිවරුන්ගේ ගරුත්වයටත් හොද නෑ.මම ඔබතුමාගේ අවධානයට යොමුකරනවා එ සම්බන්ධයෙන්. ගරු නගරාධිපතිතුමණි අපි දැන් සභාවට ඇවිල්ලා අවුරුදු 04 ක් මේ කාන්තා මන්ත්‍රිවරියන් ගණනාවක් ඉන්නවා අපි මොරටුව නගරයේ තියෙන සමාජීය ප්‍රශ්ණ ගැන විටින් විට කථා කරලා තියෙනවා.අපි හඩ නගලා තියෙනවා කමිටු අවස්ථාවේදි. නමුත් මොරටුව නගරයේ නගර සභා සහ ඔබතුමාගේ අවධානය මූලික වශයෙන් යොමුවෙලා තියෙන්නේ එකක් කසල සම්බන්ධයෙන් දෙවෙනි එක මං මාවත් සම්බන්ධයේන් නමුත් සමාජීය ගැටලු සම්බන්ධයෙන් සාධනිය විසදුම් ලබාදිම අපි දකින්නේ නෑ.ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරන්න කැමතියි මන්ත්‍රිවරු ගණනාවක් ඉන්නවා යම් කිසි දැනුමක් තියෙනවා. අපිත් යම්කිසි දෙයක් කරන්න කැමතියි. එහින්දා අපෙත් මැදිහත්වීමෙන් ඔබතුමා සමාජීය ගැටලු විසදිමට විශේෂිත වු කමිටුවක් පත්කරන්න කියලා.මොරටුවේ ප්‍රදේශයේ තියෙන සමාජීය ගැටලු හදුනාගෙන එ සමාජීය ගැටලුවලට කොහොමද අපි විසදුම් දෙන්නේ කියලා.මම ඉල්ලීමක් කරන්න කැමතියි කමිටු තියෙනවා මේ සම්බන්ධයෙන් දායකත්වය ලබාදෙන්න අපි බැදි සිටිනවා.එය සම්බන්ධයෙන් ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා.

**3(26) <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි ඇත්තටම මේ සභාවේ මහජන නියෝජිතයෙක් වශයෙන් අපි හැමෝටම යුතුකමක් තියෙනවා යම් කිසි වගකිමක් තියෙනවා

මේ සභාවේ අයථා දෙයක් සිද්ධ වෙනවානම් මේ සේවකයෙක්ගේ අතින් වෙනවානම් එ සෙවකයා පිළිබද සොයා බැලිමේ අයිතිය පූර්ණ වශයෙන්ම අපි සියලු දෙනාටම තියෙනවා.නමුත් නගරාධිපතිතුමණි මේක ටෙන්ඩ් එකකට ගිහිල්ලා රෑ 12 එකවෙනකම් මත්ද්‍රව්‍ය පානය කරලා ඊට පස්සේ යනවා නගරාධිපතිතුමණි මේ සේවකයෝ ඉන්න තැන්වලට ගිහිල්ලා විරයෙක් වෙන්න ගියාම එ සේවකයන්ට ප්‍රශ්ණයක් වෙනවා.දැන් සමහරවිට කොමසාරිස්තුමාට ඔය විධියට එන්න ඇති දුරකථන ඇමතුම්.එනිසාමම ගරු සභාවෙන් ඔනෑකමින් ඉල්ලා සිටිනවා අපිට අයිතියක් තියෙනවා අපි ලක්ෂ 10 දිමනා වශයෙන් අරගෙන තියෙනවා.එනිසා යම් කිසි අයිතියක් හැමෝටම තියෙන නිසා එවා ගිහිල්ලා පියවි සිහියෙන් ඉන්න වෙලාවට ගිහිල්ලා හොයන්න.එකට අපිත් එන්නම් එහෙම නැතුව රෑට හොඳටම බිලා ගිහිල්ලා විරයෙක්වෙන්න සිකියුරිටි ඉන්න පුලුවන් නැතිවෙන්න පුලුවන් අරක්කුත් කියන්නේ මත්ද්‍රවයක්නේ කථා කරනවා අපි මත්ද්‍රව්‍ය ගැන අපෙ ඉන්න මන්ත්‍රිවරු ගිහිල්ලා එවගේ සෙවකයො ඉන්න තැන ගිහිල්ලා කියනවානම් තමන්ගේ ආත්ම අභිමානය වඩවා ගන්න මේ සභාවෙන් මම කාරුණිකව ඉල්ලා සිටිනවා මන්ත්‍රිවරුන්ගෙන් එහෙම දෙයක් කරන්න එපා කියලා.

**3(27)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිනී පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමණි ඇත්තටම ඔසඳ මන්ත්‍රිතුමා කථාකරපු කාරණය දිගින් දිගටම යනවා.සැබැවටම එතුමා කථා කලේ මොරටුව මහ නගර සභා සේවකයො ගැන ආයතන සංග්‍රහය අනුව ඇත්තටම මත්ද්‍රවයයක් භාවිතා කිරිම සේවය අතහැර දැම්මට සුදුසුකමක්ය.නුසුදුසු කමක්වෙනවා සෙවයේ රැදිසිටිමට.නමුත් එ සියලු දෙනාම අපරාධකරුවන් නෙමෙයි අසරණයන් එක නිසා මොකද ඔවුන් රොගින් විධියට තමයි සලකන්න වෙන්නේ.එනිසා ඔවුන්ගේ රැකියාව අහිමි කිරිම නොකරන බව විශ්වාසයි ඔවුන්ව රැක ගැනිමට වැඩ පිළිවෙලක් අවශ්‍ය නිසා නගරාධිපතිතුමණි අපි මොරටුව නගර සභාව විතරක් නෙමෙයි මම එ ක්ෂේත්‍රයේ රැකියාව කරන නිසා දන්නවා විවිධ රාජ්‍ය ආයතන වල සේවකයන් යොමුවෙනවා ප්‍රතිකාර සදහා මම අයවැය විවාදයෙදි ඉල්ලුවා වගේම මේක නගර සභා විෂය පතයට ඇතුල්වෙනවානම් අපිට යම් යම් තිරණ ගන්න පුලුවන් මේ සෙවකයන්ගේ පමණක් නෙමෙයි නගරයේ දරුවන්ගේ සුරක්ෂිත භාවය සම්බන්ධයෙන්.මේ පිළිබදව නැවත වතාවක් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි

04 <u>ප්‍රශ්න :-</u> නැත

05 <u>යෝජනා :-</u>

05(1) පරිසර,සෞඛ්‍ය හා සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුවේ සභාපති, මහා නගර සභා මන්ත්‍රී, එල් ඔසද එච් අබේකෝන් මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.

"මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය සඳහා මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය සමග කියවිය යුතු 267 වගන්තිය යටතේ මොරටුව මහා නගර සභාව විසින් සම්පාදනය කරන ලද "මස් හා ශීත කළ මස් විකිණීම විධිමත් කිරිම පාලනය කිරිම හා ගාස්තු අය කිරිම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව (ඇමුණුම 01 )මෙම මහා නගර සභාව විසින් අනුමත කළ යුතු බවට යෝජනා කර සිටින්නීය".

**<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි ඉහත අංක 05 (1) යෝජනාවේ පහත සංශෝධනයන් ඇතුලත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

එහි සඳහන් ඇමුණුමේ පිටු අංක 7 හි වෙළඳ බලපත්‍රය ලෙස සඳහන් විම "**මස් වෙළඳාම සඳහා වෙළඳ බලපත්‍රයක්**" ලෙස සංශෝධනය විය යුතුයි.

පිටු අංක 6 හි 41 (3) 'නාගරික කොමසාරිස්" යන්නේන් මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාද ලෙස සංශෝධනය විය යුතුයි.

පිටු අංක 6 හි අංක 8 අයිතමය ලෙස මෙය ඇතුලත් විය යුතුයි.

8. මහජන සෞඛ්‍ය පරික්ෂකයන්නෙන් මොරටුව මහා නගර සභාවේ නාගරික ජන සෞඛ්‍ය

දෙපාර්තමේන්තුවට අනුයුක්ත මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන්

ඉහත සංශෝධන සහිතව අංක 05(1) දරණ යෝජනාව මහ නගර සභා මන්ත්‍රී ජී සුරංග ඒන් අපොන්සු මහතා විසින් ස්ථිර කරන ලදි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිනී පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි ඇත්තටම අතුරු ව්‍යවස්ථාවක් මේ පිළිබඳව ඉදිරිපත්විම ගැන පෞද්ගලිකව මම සතුටු වෙනවා.මම මගේ පක්ෂයේ මතය නෙමෙයි පෞද්ගලික පුංචි අදහසක් විතරක් ප්‍රකාශ කරන්න බලාපොරෝත්තුවෙනවා ගරු නගරාධිපතිතුමණි අතුරු ව්‍යවස්ථාවට සියලුම පැති ආවරණය වෙන බව කියවා බැලිමේදි ඇත්තටම පෙනවා.නමුත් මම පුංචි ඉල්ලිමක් කරනවා මස් අනවශ්‍ය ලෙස ප්‍රදර්ශනය කිරිම කියන දේ මේකට ඇතුල්වුනානම් තව හොදයි කියලා මොකද මස් කඩයක් කියන්නේ ලගින් යද්දි දැනෙන එ දුගද සහ ප්‍රදර්ශනය සුන්දර දර්ශනයක් නෙමෙයි.පාසල් ආශ්‍රිතව එවගේ ස්ථාන තියෙනවා එවගේම විහාරස්ථාන ආශ්‍රිතවත් එවගේ ස්ථාන තියෙනවා.ගරු නගරාධිපතිතුමණි වාරණයක් නෙමෙයි යම්කිසි නියාමනයන් කොන්දේසි ඇතුලත්වෙනවානම් අනවශ්‍ය විදියේ ප්‍රදර්ශනයක් කුකුල් මස් ආශ්‍රිතව නොවුනාට හරක් මස් ඌරු මස් හා එලුමස් සම්බන්ධයෙන් ඇත්තටම සුන්දර නෑ.මට මතකයි අපි ඉස්කොලේ යන කාලේ එහෙම මස් ප්‍රධාන පාරට පෙනෙන ආකාරයෙන් නොතිබිය යුතුයි කියලා පාර්ලිමේන්තුවේ නියාමනයන් තිබුණා එවගේ ඔබතුමන්ගෙන් ඉල්ලනවා එහෙම දෙයක් පුලුවන්නම් අනවශ්‍ය ප්‍රදර්ශනය පිළිබදව මේක අපිට අනාගතයට සුභවාදි වෙයි කියලා.බොහෝම ස්තුතියි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි මෙම යොජනාව සම්බන්ධයෙන් අපට තිබෙන්නේ මෙහෙම අදහසක් එ කියන්නේ මස් ශිතකල මස් විකිණිම විධිමත් කිරිම පාලනය කිරිම ගාස්තු අය කිරිම එය පළාත් පාලන ආයතනය සතු බලයක් තමයි. පළාත් පාලන ආයතනය සතු බලයක් විධියට මෙක ගව ඝාථක පනත තියෙනවා.ඊට අමතරව අපි එ අයට අදාළ ශිතකල මස් විකිණිම විශේෂ බලපත්‍රයක් කියලා එකකුත් ක්‍රියාත්මක කලා.එතකොට ගරු නගරාධිපතිතුමණි දැන් අපිට දැනෙන දේ තමයි දැන් භූමියේ මස් විකුණන එ මස් කඩ ගත්තෝත් හරක් මස් කුකුල් මස් විශේෂයෙන් සහ අනෙකුත් ඌරු මස් වගේ කඩ එ මස් විකිණිම පිළිබද පාරිභෝගික ජනයාට වඩාත් සෞඛ්‍ය ආරක්ෂිත ලෙස මේ මස් විකිණිම සිද්ධවෙනවාද කියන එකේ ගැටලුව අපි ඉස්සරහා තියෙනවා.එක ප්‍රශ්ණයක් විධියට තියෙනවා වඩාත් පිරිසිදුව මේ ස්ථාන සෞඛ්‍ය ආරක්ෂිත විධියටද මේ වෙළදාම කරනනේ දැන් එසේනොවන්නේ නම් එය වළක්වන්න අපිට බලය තියෙනවා අපිට නිති තියෙනවා.අප තමයි එහි බලධාරි. ගරු නගරාධිපතිතුමණි මේ අතුරු ව්‍යවසථාව හැදිම නරක නෑ.හැබැයි එකේ අරමුණවෙන්නේ ගාස්තු අය කිරිම නම් ප්‍රශ්ණය තියෙන්නේ එතන එ කියන්නේ ගාස්තු අය කිරිමනම් ආන්න ගාස්තු අයකිරිම පදනම් කරගත්ත ගමන් එ විධිමත් කිරිමේ ක්‍රියාවලිය ආයි අර පරණ සිස්ටම් එකට යනවා.දැන් වුනත් මොරටුවේ මස්

විකිණීම පිළිබඳව අපි කොච්චර කිව්වත් නගරාධිපතිතුමණී මස් කන පාරිභෝගික ජනයා එහි සෞඛ්‍ය පැත්ත ගැන හිතන්නෑ කියලා නිකම් මට තියෙන අත්දැකීම්. සමහර තැන්වල මගේ උදාහරණයක් තියෙනවා එක කාලේක වැසිකිලිවලක් ගලාගෙන එනවා ඌරු මස් විකුණන ලැල්ලක් අයිනේන් හැබැයි ඉතින් කට්ටිය ඇවිල්ලා අරක දිහා බල බල කට්ටිය මස් අරගෙන යනවා.එ නිසා මම කියන්නේ විශේෂ දෙයක් මේක අපි ඉතාම හොඳින් පාලනය කරන්න ඕන.විධිමත් කරන්න ඕන.කළමණාකරනය කරන්න ඕන එම නිසා මම කියන්නේ මේ අතුරු ව්‍යවස්ථා ගොඩනැගීමේදි අපි මහන්සිගන්න ඕන දැන්මේ සිදුවෙන අප සතුව තිබුණා. මස් කඩ අපි දැනුත් බලපත්‍ර අයකරන මස් කඩ දැන් අතුරු ව්‍යවස්ථාවේ අඩංගු කරුණු ගත්තාම එක කඩයකවත් මේ මස් විකුණන්න බෑ.එ තරමට මේ කඩවල මස් විකිණීම තරම් සුදුසු නෑ. අතුරු ව්‍යවස්ථාවේ තියෙන වගන්ති ගොඩක් ගත්තාම මේවා ඔක්කොම වහන්න ඕන.එනිසා දැන් අපිට ගැටලුවක් ඇතිවෙනවා දැන් වෙළඳාම පවතිනවා. පවතින ස්ථාන අපි මේ අතුරු ව්‍යවස්ථාවට ඇතුලුකරන නිතිමය තත්වයට නෙමෙයි තියෙන්නේ.එහෙනම් අද මේක අනිවාර්යෙන් නිතියක් බවට පත්වුනාට පස්සේ ස්ථාන මේ නිතියට යටත්ව සිද්ධවෙන්න ඕන ප්‍රතිසංස්කරණ අලුත්වැඩියා කටයුතු ගොඩක් තියෙනවා.එනිසා ගරු නගරාධිපතිතුමණී එවා විධිමත් කරන එක හොඳයි.සියයට සියයක් එකගයි.ස්ථාන විධිමත් කරන්න ඕන එවා අදාළ සෞඛ්‍ය ආරක්ෂිත විධියට ජනයාට මස් දෙන්න එ සඳහා අපි කටයුතු කරද්දි අපිට මුදල අයවෙන්නත් ඕන තමයි ප්‍රතික්ෂෙපකරන්නෑ.හැබැයි මේ දැනට පවතින අයකිරීම් වලින් භාහිරව අපි සමහර උත්සාහයන් ගත්තා මම හිතන්නේ පළාත් පාලන කොමසාරිස්තුමා පැත්තේනුත් අපට ප්‍රතික්ෂෙප කිරීම් දිගටය ආවා.එවා අලුතින් කරන්න ගිය අයකිරීම් සම්බන්ධව එනිසා මේ සම්මත කරගන්න එක ඇතුලේ ඉල්ලා සිටින්නේ මුදල් කියන සාධකය උඩට ගන්නේ නැතිව විධිමත් කරමු.ඊට පස්සේ ඔවුන්ගේ පැත්තත් බලමු.එවුන්ට මේ තරම් ඉක්මණින් ඔවුන්ගේ ව්‍යාපාරකරන ස්ථානවල මේ කියන කොන්දේසිවලට යටත්ව පුලුවන්ද එ කටයුතු කරගන්න.මම හිතන්නේ මම කියව ගත්ත ප්‍රමාණය ඇතුලේ තියෙනවා සැහෙන කොන්දේසි ප්‍රමාණයක්.එතකොට වෙළඳාම කරගෙන යද්දි මේ වෙලාවේ එකපාරට එ ස්ථාන වල එ වෙනස්කම් ටික කරන්න පුලුවන්ද ඊළගට මම දන්නවා හරක් මස් විකුණන අය ප්‍රශ්ණ ගොඩකට මුහුණ දෙනවා.මස් සමහර වේලාවට එකොලහා දොලහා පනිනවා මොරටුවට එන්න සාමාන්‍ය මස් වෙළඳාම තියෙන්නේ එක වරුවයි හැබැයි අද සිද්ධවෙලා තියෙනවා මෙතෙක් නොතිබිච්ච නිතියක් මස් එල්ලගෙන හවස්වෙනකම් විකුණන්න බෑ.හැබැයි දැන් එක සිද්ධවෙනවා.එක කරන්න දෙන්න වෙනවා මොකද එකොලහා දොලහා පනිනවා මොරටුවට මස් ටික එන කොට එනිසා එවා වඩාත් හොඳින් අපේ පශුවෛද්‍යවරයාගේ හෝ වරියගේ අධික්ෂණයට ලක්වෙනවාද කියන සැකයකුත් තියෙනවා.ඊට අමතරව මේවා ඇතුලේ වෙන වෙන ගේම් ගහනවාද කියන සැකයකුත් තියෙනවා.මේ භූමිය ඇතුලේ කොහෙහරි හරකෙක් දෙන්නෙක් මරණවද කියන සැකයකුත් තියෙනවා.මොකද මස් එන විධිය ටිකක් හොඳින් බලාගෙන හිටියාම එහෙම හිතෙනවා.එ නිසා ගරු නගරාධිපතිතුමණී මේ කියන කාරණාවේදි අපි එකගයි විධිමත් කරනවාට වඩාත් සෞඛ්‍ය සම්පන්න විධියට

ජනතාවට මස් කන්න අවස්ථාව සලසලා දෙනවාට හැබැයි මේ මිලගණන් පිළිබඳ ප්‍රශ්ණයේදී අපි මිලගණන් බලාපොරෝත්තුව නම් වෙන්නේ අපිට එකග වෙන්න බෑ.එනිසා අපේ අදහස වෙන්නේමේ අතුරු ව්‍යවස්ථාවෙන් සිදිධවෙන්න ඔන අන්න අර කියන පදනමේ ඉදලා මේ කටයුත්තකරන්න එනිසා ඔවුන් සමගත් සාකච්ඡා කරන්න ඔවුන්වත් ගෙන්වන්න.වෙන වෙනම ඔවුන්ට මේක ලබා දෙන්න.ඔබේ මස් ව්‍යාපාරය කරන ස්ථානයේ පැවතියයුතු ආකාරය අපි අතුරු ව්‍යවස්ථාවක් හැදුවා මේ අතුරු ව්‍යවස්ථාවට අනුගතවෙන්න ඔන කියලා ඔවුන්ට අධ්‍යයනය කරලා යම් කාලයක් දිලා මේ විධිමත් කිරිම කරන්න.එතකොට එකට අපි එකගයි.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රිතුමාගේ අදහස ඇත්තටම බොහොම ගැබුරින් ගත්තාම ඉතා හොද අදහසක.එක පැත්තේ දෙපැත්තක් කියවෙනවා.මෙක නියාමනය කරන්න ඔන.නිවැරදි කරන්න ඔන අනුභව කිරිමේදි හරියට කරන්න. එන අනෙක් පැත්තෙන් ඉක්මණට කරන්න පුලුවන්ද කියලා අපි බලන්න ඔන.මේ සියලු දේ සභාවකට කරන්න මම හිතන්නේ මෙක අපි කවුරුත් දන්නවා යම් දෙයක් නිතියක් බවට පත්වුනාම එ නිතිය ක්‍රියාත්මක කිරිමේදි යම් කිසි විධයකට මම කියන්නේ නිළධාරින්ට අවශ්‍ය වන්නාවු උපදේසක් අවශ්‍ය කර්නාවු මගපෙන්විමත් නිතියත් එක්කම ආයතනගත කරලා මෙක මාස දෙකෙන් කරගන්න බැරි අය ඉන්න පුලුවන් දැනටත් කරලා තියෙන අය තියෙන්නත් පුලුවන් කොහොම වුනත් අවසානය අනුභව කරන්නාවු අයට සෞඛ්‍ය සම්පන්නව අනුභවකරන්න පුලුවන් වට පිටාව නිර්මාණය කිරිමේ ලියවිල්ල අපි අනිවාර්යෙන්ම එක නිතියක් බවට පත්කර නොගැනිම තුල සභාව යම් යම් අවස්ථාවල අතපසුවෙච්චාවු අපහසුවට පත්වෙච්චාවු තැන් තියෙනවා. සමහර විට අපට නිතිය ක්‍රියාත්මක කිරිමේදි එ නිතිය ක්‍රියාත්මක කිරිමට ඔබට ඇති නිතිය මොකක්ද කියලා අපෙන් අහපු අවස්ථා තියෙනවා.එක නිසා හැමතිස්සේම නිතිය අපේ කරන්න යන කාර්යයත් එක්ක ගැටෙන්නේ නැතිව අපි එක පවත්වාගෙන යන්න ඔන නිසා මම හිතන්නනේ හොද සාක්ෂියක් බවට මෙය පත්වෙනවා.ඊළග පැත්තෙන් අරපැත්තෙන් ගත්තාම ආදායම් ලබා ගැනිමට වඩා අර ඔබ කියපු මිනිස්සුන්ට අනුභව කිරිමට මස් සෞඛ්‍ය සම්පන්නව ලබා දිමේ කටයුත්ත මෙකෙන් විධිමත්වෙනවා. මේ තියෙන කොන්දේසි එ කොන්දේසිවල යම් කිසි දැන් පවත්වාගෙන අයට යම් කිසි අපහසුවක් ඇතිවෙන්න පුලුවන් එ අපහසුව තමයි ඔබ කියන හොද මස් අනුභව කිරිමට ඇති සාධකය එක තමයි ඔන කරන්නේ.එක නැතිඑක තමයි දැන් තියෙන ප්‍රශ්ණය එක එ විධියට ඇති කලොත් තමයි මුදල කියන එක පැත්තකට වෙන් කරලා ගත්තත් අනික් පැත්තෙන් නිතියෙන් එක පවත්වාගෙන යැම ඔහු දන්නවා ඔහු වරදක් කරන්නේ කියලා.එ වරදක් කරන්නේය කියන තැනේ ඉදලා ඔහුට පුලුවන් වෙනවා තමන්ගේ ස්ථානය පුලුවන් වන මට්ටමට එකට කාල පරාසයක් යයි. හැබැයි මේක දුන්නේ නැතිවුනානම් කාල පරාසයක් අපිට පෙන තෙක්මානයක නැතිවෙයි.නිශාන්ත මන්ත්‍රිතුමාගේ අදහස බෙහෝම පැහැදිලි එ අදහසත් එක්ක අපි එකතුවෙලා මේය ශක්තිමත් කරන්න පුලුවන් තැනකට අපි යමු.

අංක 05(1) දරණ යෝජනාව සංශෝධන සහිතව එකමතිකව සභා සම්මත විය.

06 **<u>2021 නොවැම්බර් මස ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලිම.</u>**

06(01) 2021.11.08 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ .අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි ආයතන හා නිතිය පිළිබද කමිටුවේ අපි 04 අයිතමයට විරුද්ධයි.මොකද එකේ තියෙනවා නියෝජ්‍ය නාගරික කොමසාරිස් විසින් (පිටු අංකය 9 අයිතමය 4)මෙකේ කියනවා නියොජ්‍ය නාගරික කොමසාරිස් ඉදිරිපත්කර ඇති ලුනාව කලපුවේ ව්‍යාපෘතිය නඩත්තු කරමින් පවත්වාගෙන යන ව්‍යාපෘතියේ කාලය දිර්ස කිරිම සම්බන්ධ වු පහත ලිපිනයේ සලකා බැලිම.මේ අයිතමයට විරුද්ධවෙන්නේ ගරු නගරාධිපතිතුමා ලුනාව කලපුවේ ව්‍යාපෘතිය නඩත්තු කරමින් පවත්වාගෙන යන ලුනාව කලපුවේ ව්‍යාපෘතිය සදහා බදවා ගනු ලබන අනු අංක 1 සිට 7 දක්වා සදහන් කර ඇති සේවකයන් සේවා කාලය 2021-09-10 දිනෙන් අවසන් වු බැවින් එ අනුව එම ව්‍යාපෘතියේ පවත්වාගෙන යැමට හා එහි සෙවයේ නියුතු සෙවකයන් සෙවා කාලය මාස 6 කින් දිර්ස කර ගැනිමට ආයතන කමිටුව නිර්දේශ කරමි.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා කියන්නේ සේවාව සිදු කරන්න ඔන නෑ කියලාද

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ .අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි සේවාව සිදු කරන්න ඔන. මේ කටයුත්ත තුල මේ පිරිසත් වැඩියි. නමුත් මේක කාලය දිර්ස කරන්නනේ යන්නේ එකට අපි විරුද්ධයි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි ආයතන කමිටුවේ 02(8) පිළිබදව අදහසක් කිවයුතුයි.ජනතාවිමුක්ති පෙරමුණ විධියට අපේ ප්‍රතිපත්තිය පැහැදිලි කරමින් තමයි මේක අදහස ඉදිරිපත් කරන්නේ.එ කියන්නේ හරියට ඉන්ධන වගේ තමයි.රක්ෂණය කියන්නේ ගරු නගරාධිපතිතුමණි

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නිශාන්ත මන්ත්‍රීතුමා පොඩි පැහැදිලි කිරීමක් ඔබතුමාට කරන්නම් මේ වෙනකොට පළාත් පාලන කොමසාරිස් විසින් නිර්දේශ කරලා මෙය සිදුකල යුතුයි මෙය පාර්ලිමේන්තුවෙත් පළාත් සභාවේත් වෙන දෙයක් කියලා ගරු ආණ්ඩුකාරතුමාට යවලා තියෙන්නේ ආණ්ඩුකාරතුමා එකේ අනුමැතිය ලැබෙන්නට විතරයි තියෙන්නේ මේවෙනකෙට එතුමා නිර්දේශ කරලා යවපු ලියුමත් අපිට ලැබිලා තියෙනවා.මම හිතන්නේ තව මාසයකට පෙර මේ රක්ෂණ ක්‍රමය හරියයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි මම අර මුලින් කිව්වේ.එ කියන්නේ අපේ රටේ පළාත් පාලන ආයතන වල තමයි මහජනයත් එක්ක ඉතා සමීපව වැඩ කරන මහන්සි වෙන ආර්ථික අතින් ඉතා දුෂ්කරතා තියෙන මන්ත්‍රීවරු ඉන්නේ එ නිසා ඉන්ධන දීමනාව කියන එකට අපි එකගයි.අපි එදා අධිහාරයට ලක්වෙන යෝජනාවට ඡන්දය දිලා නෑ.දුන්නේ නැත්තේ ඉතා පැහැදිලිව කිව්වා මෙවැනි දීමනාවක් දෙන්න ඔන හැබැයි නිත්‍යානුකූල නොවන විධියට තව දුරටත් මෙක පවතිත්දි එය ලබා ගැනිමට එකග නෑ.හෙට ඔබ මේක එකගතාවය ගන්න.අපි ව මේ රක්ෂණයට දාන්න එපා.මොකද අපි ස්වේච්ඡාවෙන් ප්‍රතිපත්තියක් ලෙස දේශපාලනයට ආවේ අරමුණක් එක්ක.එකෙන් අර මන්ත්‍රීවරු හැල්ලුකරන්නේ නෑ.ඔවුන්ට අවශ්‍යයි.අපේ පැහැදිලි කිරිම ඔතන දෙන්න.ඉන්ධන දීමනාව වගේ එකක් නිත්‍යානුකූල නිසා අපි ගන්නවා.මොකද අපේ රටේ පළාත් පාලන දේශපාලඥයා ශක්තිමත් කරන්න ඔන.එයා මහා ආර්ථිකමය ශක්තියක් තියෙන කෙනෙක් නෙමෙයි.එ නිසා අපි පැහැදිලි කරන්නේ මන්ත්‍රීවරයාට රක්ෂණය ලබා දිමේදි ජනතා විමුක්ති පෙරමුණේ අපිව එතනට එකතු කරන්න එපා. මොකද අපි සවේච්ඡා මැදිහත්විමකින් දේශපාලනය කරන්නේ අපි මහජන මුදල්වලින් රක්ෂණය විම පිළිබදව අදහසක් නැ.එ අපේ අදහස ප්‍රතිපත්තිය අපිට තියෙන්නේ පළාත් පාලන මන්ත්‍රීවරයා ශක්තිමත් කරන්න ඔන එකට අපි විරුද්ධ නෑ.අර ඉන්ධන දීමනාවේ වගේම තමයි.අපි යම් දවසක මේවා ලබාගන්න දසවක් එනවානම් මම පැහැදිලි ප්‍රකාශයක් එවිට කරනවා. එතෙක් ජනතාවගෙන් ලබා ගන්න මොනවාහරි දීමනාවක් තියෙනවානම් අපි එය ලබාගන්නේ නෑ. නිත්‍යානුකූල ආකාරයෙන් මිස.හරි නගරාධිපතිතුමණි.එක තමයි පැහැදිලි කිරිම ඊලගට මේ ලූනාව කලපු සේවකයන්ගේ කාලය දිර්ඝ කිරිම එවලා තියෙනවා බජට් එකට ගියොත් බජට් එකේ ඉතා පැහැදිලිව අපේ කාඩර් එකේ ප්‍රමාණය සේවා නියුක්තිය වැඩ කරන ප්‍රමාණය පුරප්පාඩු කොන්ත්‍රාත් ඔය පදනම්වලින් අපි කියනවා.හැබැයි දැන් එය බොරුවක් වෙනවා දැන් මේ විටින් විට මේ කොන්ත්‍රාත්මේ පදනමින් බදවා ගත්ත සේවකයන්ගේ කාලය දිර්ඝ කරන්න ඉල්ලන්නේ මේ ගැටුමත් දිර්ඝ කාලයක් තිස්සේ තියෙනවා.මේක පරස්පරයක්.එනිසා මේ ආයතනයේ මොකක්හරි සිස්ටම් එකකින් මේ තත්වය වෙනස් කරන්න ඔන. නැත්නම් ලේඛන එකක් සත්‍ය නම් එකක් බොරුවෙනවා.එක බොරුවුනොත් මේක සත්‍ය වෙනවා. මම කියන්නේ මේන්න මෙහෙම එකක් තියෙනවා ඊළගට ඔබතුමාට කියන්න ඔන ලූනාව කලපු ව්‍යාපෘතියට අපි බදවාගත්ත ප්‍රමාණය එකතු කරොතින් විශාල ගානක්වෙයි.ලූනාව

කලපු ව්‍යාපෘතිය පාවිච්චි කරගෙන සැලකිය යුතු ප්‍රමාණයක් අපි බඳවා ගැනිම් කලා.හැබැයි ඔබ දන්නවාද ලූනාව කලපු ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු වෙනුවෙනුත් අපි සැලකිය යුතු මුදලක් වැය කලා අදත් අර මන්දැක්කා තිබ්ච්ච එ ගල් අයින් කරලා අලුතින් ගල් අල්ලන අලුත් ව්‍යාපෘතියක් යනවා හැබැයි ගරු නගරාධිපතිතුමණි මේ ව්‍යාපෘතියට එන ඇල මාර්ග ගණනාවක් තියෙනවා.මේ හැම ඇලමාර්ගයකයම ආරක්ෂිත වැටවල් දැන් දිරාපත්වෙලා වැටේමින් තියෙනවා.එ නිසා අපි සේවකයෝ බඳවා ගැනිමම පමණක් ප්‍රමාණවත් වෙන්නේ නෑ මෙය අපි ගන්නේ ලූනාව කලපු ව්‍යාපෘතියට හැබැයි ලූනාව කලපු ව්‍යාපෘතියම තමයි සංවර්ධන කටයුතු අර මතුපිට ජේන පොඩි ප්‍රමාණයක සිද්ධ වුනාට මේක පතුලට යනකොට සැහෙන්න විනාශයක් සිදුවෙමින් තියෙනවා.එනිසා අපි හැම තිස්සේම ලූනාව කලපු ව්‍යාපෘතියේ සේවකයෝ බඳවා ගැනිමත් එක්කම බලන්න ඕන ඇත්තටම ලූනාව කලපු ව්‍යාපෘතියේ සේවාද සිද්ධවෙන්නේ අපි හිතනවා කලපු ව්‍යාපෘතියේ සේවාව නෙමෙයි කලපු ව්‍යාපෘතියේ නමින් බඳවා ගත්තාට සිද්ධ වෙන්නේ වෙන වෙන තැන්වල ස්ථානගත වෙලා තියෙන්නේ එ ස්ථානගතවිම ඇතුලේ ඔබට අවශ්‍යතාවයක් ඇති මේ ආයතනයේ සේවාවල් පවත්වාගෙන යැමට තියෙන සෙවක ප්‍රශ්ණය නිසා මේක පැහැදිලිව කියවගන්න එපැයි හැබැයි කවදාහරි දවසක ඉතිහාසයේ මේ බඳවා ගැනිම් තියෙන්නේ ලූනාව කලපු ව්‍යාපෘතියට නිසා අර විනාශය සිද්ධ වෙනකොට එය වලක්ව ගන්න අසමත්විම පිළිබඳව අපි කාටත් දෝෂාරෝපණයක් එනවා.එනිසා කරුණාකරලා හොයන්න මේ ලූනාව කලපු ව්‍යාපෘතියේ දැනට ඇල මාර්ගවල තියෙන නඩත්තු කටයුතු එවා අපි අත් හැරලා තියෙන්නේ.එ කටයුතු ටිකත් කරන්න එකක් මේ සේවක කොන්ත්‍රාත් කියන පදනම දැක්කා තුනද කොහෙද ඉන්නේ ලේඛනයේ මං හිතන්නේ සැලකිය යුතු ප්‍රමාණයක් ආයතනය ඇතුලේ ඉන්නවා.එනිසා මෙය නිවැරදි කරන්නේ කෙහොමද කියලා මට තේරෙන්නේ නෑ.කොහොමද එක කරන්නේ කියලා

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි එතුන තියෙන්නේ නිශාන්ත මන්ත්‍රිතුමා එඹ මහත්තයාගෙයි එහෙම කොන්ත්‍රාත් පදනම මත තියෙන තුනක් එ තියෙන්නේ.එ කියන්නේ පුස්ථකාලාධිපතිනිය එතකොට අපේ කිත්සිරි මහත්තයා එ කියන තුන තියෙන්නේ කොන්ත්‍රාත් පදනමේ ගත්ත තුනක්.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

මේ සේවා කාලය දිර්ඝ කරන්න ඉල්ලන්නේ මොන පදනමෙන්ද එගොල්ලෝ එක්කෝ අනියම් නැත්නම් ආදේශ එක්කෝ කොන්ත්‍රාත් පදනමෙන්

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්- සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මනත්‍රිවරුනි ඔවුන්ගේ සේවා කාලය දිර්ඝ කරන්න වෙන්නේ කොන්ත්‍රාත් පදනමෙන්. මේ තියෙන්නේ කොන්ත්‍රාත් පදනමෙන් ගත්ත ස්ථිර සේවකයෙක්නේ

මේ සේවාව දිගු වෙන්නේ කොන්ත්‍රාත් පදනමෙන්ම ගත්ත ප්‍රමාණය අරක කොන්ත්‍රාත් පදනමේ කියන්නේ ස්ථිර සේවකයෙකු කොන්ත්‍රාත් පදනමේ දිගුව ගන්නවා.එකයි.ඔහුට දිගුව ගැනිමට තියෙන අයිතිවාසිකමත් එක්ක දිගුව ගන්නවා.මේක තියෙන්නේ කොන්ත්‍රාත් පදනමේ මතම ඉදලා දිගුව ගන්නවා.මාස 6 න් 6 ට අපි ගන්න ඔන.එ දිගුව මේකයි.කඩර් එකේ නොවන එක මේ අර කාඩර් එකේ එකක් කාඩර් එකේ ඇතුලේ තියෙන්නාවූ දිගුව.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමණි ඔකේ අර්ථය තියෙන්නේ සථිර කියන එකේදි ඔබට ඔවුන්ගේ සේවා කාලයේ දිර්ඝ කිරිමක් ඔන නැහැනේ.සථිර වුනාට පස්සේ.නමුත් මේ ව්‍යාපෘතියට

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මනත්‍රිවරුනි ඔවුන්ගේ කාලය දැන් අවුරුදු 60 සම්පුර්ණ වුනාම ඔවුන් සේවාවෙන් යන්න එපැයි සේවා අවශ්‍යතාවය පදනම් කරගෙන ඔහුව කොන්ත්‍රාත් පදනමෙන් අපි ඉල්ලනවා තියන්න කියලා.එතකොට අපිට වැටුප් එක්ක එක දෙන්නේ එක තමයි එ තුන.

<u>**මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා**</u>

ගරු නගරාධිපතිතුමණි අංක 4 කියන්නේ ආයතන හා නිතිය සම්බන්ධව අපේ අනුරසිරි මන්ත්‍රීතුමා විපක්ෂ සංවිධායකතුමා එ කියපු කථාව සම්බන්ධව පොඩි නිවැරදි කිරිමක් කරන්න.මේකේ සේවකයින් බඳවා ගැනිමට විරුද්ධ නෑ.මොකද අහිංසක සේවකයින්ට රැකියාවක් ලබාදිමට අපි විරුද්ධත්වයක් නෑ.අපිට තියෙන ප්‍රශ්ණය මේකයි.එ සේවා දිගුව සම්බන්ධව ප්‍රශ්ණයක් නෑ.නමුත් මේ සේවකයින් ඇත්තවශයෙන්ම ලුනාව කලපුව ව්‍යාපෘතියට වැඩ කරනවාද එ අය වැඩ කරනවානම් එ අයගෙන් අපි දකින ප්‍රගතියත් ලුනාව කලපුව ආශ්‍රිතව දකින්නේ නෑ.එ යන මං මාවතේ ඇවිදින මංතිරු ක්ලින් කරලා එ අවට පිළිබඳව අපිට සැහිමකට පත්වෙන්න බෑ.මෙන්න මේකයි ඔබතුමාට අවධාරනය කරන්න වුවමනා වුනේ.එ 30 දෙනාගේ සේවා දිගුව ගැන විරුද්ධත්වයක් නෑ.අපි මේකට එකගයි.නමුත් ඔබතුමාගේ අවධානයට යොමුකරනවා මේ අය කොහෙද ස්ථානගත වේලා ඉන්නේ කියලා අපිට පොඩ්ඩක් දැනුම් දෙන්න.අඩුගානේ වෙන වෙන තැන්වල යොදවලා ඉන්නවානම් මේකට අවශ්‍ය ප්‍රමාණයක්වත් මෙතනට දාලා එ කලපුව වටේ පොඩ්ඩක් පිරිසිදු කරනවානම් මිට වඩා හොදයි කියන එක කියනවා.නමුත් අපි එකට එකගයි විපක්ෂය හැටියට.

2021.11.08 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටේ වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

6(02) 2021.11.09 දින පැවති ඉඩම් හා නගර සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපත්තුමණි 02(1) මාවිසින් ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් ඉඩම් කමිටුවේ 2018 ඉදිරිපත් කරපු යෝජනාව අපේ සභාව සතු ඉඩම් පිළිබඳව නිවැරදි දත්ත තොරතුරු පිළිබඳ වාර්තාවක් ලබාගෙන සභාව යටතේ තියෙන ඉඩම්වල එ පදිංචි කරුවන්ට එ ඔප්පු ලබාදිමේ ක්‍රියාවලිය දැන් සැලකිය යුතු ප්‍රමාණයකින් සිද්ධ වෙනවා.විශේෂයෙන් එ පිළිබඳ ස්තුතිවන්ත වෙන ගමන් අපේ චූලරත්න මහත්තයා මැදිහත්විමක් මේ සම්බන්ධයෙන් කරනවා.එතුමාටත් ස්තුතිවන්ත වෙනවා.අපේ මේ ඉල්ලිම තියෙන්නේ මේකේ විවෙචනයකට වඩා දැන්මේ අවසාන අවුරුද්ද කාලේත් අවසන් එනිසා මෙහි තව ඉතිරිවේච්ච ප්‍රමාණයත් එ තියෙන ගැටලු සහගත තත්වය නිරාකරනය කරගෙන මේ කටයුත්ත අඩුම තරමේ අපේ කාලසිමාව ඉවරවෙන්න කලින් අවසන් කරගන්න. අවසන් කරගෙන මේ කටයුත්ත වඩාත් සාර්ථක ලෙස මේ සභාවටම ලැබෙන ගෞරවයක් සහ මේය වඩාත් සාර්ථක කරගන්න මැදිහත්වෙන්න අපි යෝජනා කරාට මේක ක්‍රියාත්මක වෙන්නේ සභාවේ විධියට අපි කාගේත් ජයග්‍රහනයක් බවට පත්කරගන්න මේ කටයුත්ත සම්පූර්ණ කරගන්න ඉක්මන් කරන්න කියන ඉල්ලිම ඉදිරිපත් කරනවා.

2021.11.09 දින පැවති ඉඩම් හා නගර සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(3) 2021.11.09 දින පැවති මහජන උපයෝගිතා ප්‍රජා සංවර්ධන ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා

බැලිම.

2021.11.09 දින පැවති මහජන උපයෝගිතා ප්‍රජා සංවර්ධන ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

6(4) 2021.11.10 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන්

සලකා බැලිම.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමණි, ලුනාව ළමා උද්‍යානයට අද පත්වී තිබෙන ඉරණම ගැන උයන කොට්ඨාශයේ නාගරික මන්ත්‍රීතුමිය වශයෙන් මම මේ කථා කරනවා.ඉතින් නගරාධිපතිතුමණි අද ලුනාව ළමා උද්‍යානය කැලයක් බවට පත්වෙලා.ඔබතුමාගේ අවධානය යොමුකරන්න කැමතියි මම මෙකේ තියෙන එකක් නෙමෙයි සෞඛ්‍ය සම්බන්ධව කථාකරන්නේ.අයිතමයේ නෑ ගරු නගරාධිපතිතුමණි.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය අපි සභාව 9.40ට පටන් අරගෙන සභාව හරියටම 12.50 වෙනකම් කරේ ඔබතුමිය ඔය කියන්න යන එක ගැන මේ අයිතමය හැරවෙන එකක් කථා කරනවානම් කරුණාකරලා නවත්වන්න. මේ සභාව යන්නම් වාලේ යන්න දෙන්න බෑ.ඔබතුමිය කරුණාකරලා මේක බැලන්ස් කරන්න.

2021.11.10 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු

තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(5) 2021.11.10 දින පැවති ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ

තිරණයක් සලකා බැලිම.

**<u>මහ නගර සභා මන්ත්‍රි - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි, 02(7) කාරණාව සොයිසාපුර ක්‍රිඩා පිටියේ අපි පැතිවිකට්වු තුනක් ඉදිකරා එක රයකින් කොන්ක්‍රිට් දාලා මං හිතන්නේ ලක්ෂ 6 කට වැඩිය දරන්න වුනා.අපි කවුරුත් එකට විරුද්ධ නෑ.එක හොද වැඩක් හැබැයි දැන් එතනට ගිහිල්ලා බැලුවාම මේ ස්ථානයේ වල් බිහිවෙලා එහි තව කටයුතු ගණනාවක් සිදුකරන්න වෙනවා කිසිවක් සම්පුර්ණවෙලා නෑ.අර වියදම් කරපු මුදලත් අපතේ යන මට්ටමට ඔබතුමා ගිහිල්ලා බැලුවොත් ඔබතුමාට පෙනෙයි සහ අපේ මේ ඉල්ලිම තියෙන්නේ හැකි ඉක්මණින් එම ස්ථානය වඩාත් ප්‍රයෝජනවත් ස්ථානයක් බවට දරුවන්ට ක්‍රිඩාකල හැකි ස්ථානයක් බවට එ පැතිවිකේට්වු 3 දැල්ගහලා එ අදාල දැල් ආවරණයන් හදලා වැඩේ ආරම්හ කරන්න පුලුවන් මට්ටමට ඉක්මණින් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමණි, ඊලගට මෙහා පැත්තේ තියෙන ශරිර සුවතා මධ්‍යස්ථානය ඔබතුමා දන්නවා අපේ අනුරකුමාර සහෝදරයාගේ ප්‍රතිපාදන යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරා.එතන දැල් කඩලා කිසියම් පිරිසක් එ ළමයි දැනටත් ක්‍රිඩා කරනවා.එගෝල්ගෝ ලෙදර් බෝල් වලින් ක්‍රිඩා කරනවා.ව්‍යායාම කරන අයට ලොකු අනතුරක් වෙනවා එ දැල් කඩලා බෝල එනවා එ අයගේ ශරිර **සෞඛ්‍ය** තත්වයට විශාල අනතුරු දායක තත්වයක් එ නිසා ඉක්මණින් එ

කටයුත්ත අපේ මේ ව්‍යාපෘතියත් යන අතරතුර එකට සමගාමීව ක්‍රියාත්මක වෙලා ඉවර කරලා ක්‍රීඩා පිටිය ඉක්මණින් තනකොල ටික කපලා දෙන්න ලගදි කිහිපදෙනෙක් ඇවිල්ලා තණකොල ටිකක් කපලා ගියා තරගයක් තිබ්බ නිසා නමුත් මේක කැලෑ වැදිලා තියෙනනේ ඉක්මණින් සුද්ද කරලා දෙන්න කියන ඉල්ලීමත් කරනවා.

**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු කොමසාරිස්තුමා මේ සම්බන්ධව අපේ ට්‍රැක්ටරයකට සවිකරන්න පුලුවන් ඔය වගේ ගවුන්ඩ් එකක් සම්පූර්ණයෙන්ම පැය එකාමාරක් දෙකක් ඇතුලත කපන්න පුලුවන් යන්ත්‍රයක් ගන්න දැන් මිලගණන් කැඳවලා තියෙන්නේ. කරුණාකරලා එය ගෙනල්ලා මේ කටයුත්ත කරන්න. අපේ ක්‍රිඩාංගන තියෙනවා සම්පූර්ණයෙන්ම 8,10 ක් විතර. මේ තත්වයෙන් පවත්වාගෙන යන්න බැහැ.තණකොල කපන මැෂින් වලින් අතින් කපන මැෂින් වලින් එක කරන්න පුලුවන් කමක් නෑ.කරුණාකරලා මැෂින් එක ඉක්මණින්ම ඇණවුම් කරගන්න සම්පූර්ණයෙන් මිල ගණන් කැඳවලා තියෙන්නේ. එක හෙට දිනයේ නැත්නම් එන සතියේ ගෙනල්ලා මොකද මේ කියන දේ ඇත්ත සොයිසා මහල් නිවාසයට දිලා තියෙන ක්‍රිඩාංගනය මං හිතන්නේ මිල ගණනින් තොරව ඔවුන්ට ක්‍රීඩා කිරිමට හැකිවෙන්නා වූ අවස්ථාවන් ඔනෑ තරම් තියෙනවා. ඔවුන්ගේ අයිතියක් මහල් නිවාස වල පදිංචිකරුවන්ගේ අයිතියක් ක්‍රිඩාංගනයේ ක්‍රිඩා කිරිම එ අයිතිය නැතිවෙලා තියෙනවා මේ තත්වය මත එ හින්දා කරුණාකරලා මේ තණකොල කපන මැෂින් ගෙන්න. එතකොට අපිට මෙක ප්‍රායෝගිකව යම් යම් පාසල්වලට පවා දෙන්න පුලුවන්. මේ තණකොල කපන මැෂින් එක ගෙනාවාම කැඩෙන්නෑ ලෙසියෙන්.මේක ට්‍රැක්ටරයට හයිකරන එකක් එන්ජින් එකට ඉබෙම කැපි කැපි යනවා.කවදාවත් විනාශයට පත්වෙන්නෑ කැඩෙන්නෑ පැය 10-15 එක දිගට වැඩ කරත් මුත්කුත්වෙන්නේ නෑ.ඉක්මණින්ම මේක කරන්න මේක සුනිල් මහත්තයාට දිලා බලාගෙන ඉන්න එපා.සුනිල් මහත්තයාට මේක හෙට ගෙනාවත් එකයි ඊළග ටර්ම් එකේ ගෙනාවත් එකයි.මොකද සුනිල් මහත්තයා කරන්නේ මේකේ රාජකාරියක්.අපට තමයි වුවමනාව තියෙන්නේ.එක නිසා කරුණාකරලා මේක ලබන සතියේ ගෙනල්ලා මේ කටයුත්ත නිමකරන්න.

**මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමණි කොරලවැල්ල ක්‍රිඩාංගන මාවතේ අත්පන්දු ක්‍රිඩාපිටිය සම්බන්ධව මම ක්‍රිඩා කමිටුවට යොමු කරලා තිබුණා.නමුත් එක අවසාන වශයෙන් තියෙන්නේ වාර්තාවේ එ කටයුතු දැනට සිදු කරමින් පවතින බව නාගරික ඉංජිනේරු කමිටුවට පැවසුවා කියලා. නමුත් එහෙම දෙයක් මේ වෙනකම් සිද්ධවෙන්නෑ නගරාධිපතිතුමා.මම හිතන්නේ ඔබතුමත් දන්නවා මේ වෙනකොට මොරටුවේ සක්‍රියව දිවා රාත්‍රී ක්‍රිඩාකරන ක්‍රිඩාංගනයක් තියෙනවානම් අත්පන්දු කොරළවැල්ල ක්‍රිඩාංගන මාවතේ එක හින්දා මේ වාර්තාව බොරු.එහෙම දෙයක් වෙන්නේ නෑ මේ මොහොත වෙන කොට එනිසා කරුණාකරලා මෙකට මැදිහත්වෙන්න.නැත්නම් අපිට රවිනාත් මහත්තයාට කියලා තමයි ආයි කියවන්න වෙන්නේ එතකොට ඉක්මනට කෙරෙන හින්දා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි ඊයේ පෙරේදා මෙන්ඩිස් පාරේ තිබෙන සිගිති උයන මොකද මෙයට අපි ප්‍රතිපාදන වෙන් කලා වගේම නගර සභාවෙත් මැදිහත්වීමක් ඇතුලේ ගොඩනැගුණු එකක්.එතකොට එහි කුමණහෝ අකරතැබ්බයක් එකට සිද්ධවෙනවා කියන ආරංචියක් ආවා.එ තියෙන මොනවාහරි භාණ්ඩ ගලවගෙන යන එකක් හරි මොනවා හරි එහෙම එකක් ආවා. මේක කොමසාරිස්තුමාගෙන් ඇහුවා කොමසාරිස්තුමා දන්නේ නෑ කිවුවා.සහ නගර සභාවෙන් වෙනවද කියලා බලලා කියන්නම් කිවුවා.තව ටික වෙලාවකින් කොමසාරිස්තුමා එහෙම බලලා කිව්වා.එ කියන කොට කිව්වේ නගරාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් තමයි ඔබතුමාගේ අනු දැනුමෙන් එක සිද්ධවෙන්නේ.දැන් මට තියෙන ප්‍රශ්ණය තමයි ගරු නගරාධිපතිතුමණි එතකොට අපි සතු දේපලක අපි සතු ළමා ක්‍රිඩාංගණයක එවැනි කටයුත්තක් සිදුවෙන කොට සිදුකලයුත්තේ අපේ කර්මාන්ත අංශය ඉංජිනේරු අංශය අදාල මැදිහත්වීමෙන් ඊට පෙර මේ සභාවේ මේක සාකච්ඡා වෙලා මේක පිළිබඳව යම් එකගතාවක් අනුමැතියක් ගත යුතුයි. එතකොට මේක කොමසාරිස්තුමත් දන්නවා.දැන් කොමසාරිස්තුමත් දන්නේ නැතිව මේ සිද්ධවෙනකොට මෙන්න මේකේ ගැටලුවක් තියෙනවා.එ කියන්නේ කෙමසාරිස්තුමාට මම චෝදනා කරන්නේ වගකියන්න ඕන මේ දේපල වලට මොකක් හරි වෙනවානම් ඔබතුමා හොදක් කරනවා වෙන්න පුලුවන් හැබැයි දැනගෙන ඉන්න එපැයි මොකක්ද සිද්ධවෙන්නේ කියලා.එනිසා කොමසාරිස්තුමාගේ අනුමැතියක් අවබෝධයක් නැතුව ඉංජිනේරු අංශය පාවිච්චිකරන්න බෑ කියන එකයි මගේ අදහස ඉංජිනේරු අංශය ක්‍රියාත්මක වෙන්න ඕන කොමසාරිස්තුමාගේ නියෝගයෙන්.

**<u>ගරු නගරාධිපති ඩබ්ලිව් සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

නිශාන්ත මන්ත්‍රීතුමා ඔබතුමාටත් තිබුනේ මේක ආයතන හා පෙත්සම් පැමිලිණි හමුවේ තමයි කියන්න මේකේ නෑ අයිතමයක්.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි එතන වෙන්නේ මොකක්ද කියලා අපිට දැනගන්න ඕන.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමණි ඔබතුමා මගේන් එක ඇහුවානම් මම කියනවා. මේ අයිතමය අර මන්තිතුමියට අසාධාරණයක් වෙනවා මේ අයිතමයක් නෑ මේක විශෙෂයෙන්ම මොරටුවේ දැව ආශ්‍රිත වෙන්නාවූ අයගේ ගරු නිශාන්ත මන්ත්‍රීතුමා මේවෙනකොට ලක්ෂ 97 ක මුදල් වැය දරමින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් වඩු කාර්මික ආශ්‍රිතව මේවලම් ලබා දිම ඉදිබැද්ද, මොරටුමුල්ල, විල්ලෝරාවත්ත, මෝල්පේ කියන වසම ලෙස විල්ලෝරාවත්ත බටහිර යොදාගෙන නමුත් එ සියලුම අයට මොරටුවේ

මෝදර අයට වුනත් රුපියල් 300 විතර ගන්න කම්ප්‍රේෂර් එකක් තියෙනවා 100 කට විතර දෙන තැනක් නිසා එක අපිට ස්ථානයක් ඉල්ලුවාම අපි ස්ථානය දුන්නා.එකේ තට්ටු දෙකේ උඩ තට්ටුවට හදලා ලක්ෂ 30 ක ව්‍යාපෘතියක් එ උඩ තට්ටුවේ සම්පූර්ණයෙන්ම ඔය කියන දරුවෝ සෙල්ලම් කරන එක හදන්න අවශ්‍ය කරන අනුමැතිය අපි දුන්නා ප්‍රාදේශිය ලේකම්ට. ප්‍රාදේශිය ලේකම්ගේ ඇස්තමේන්තුව අනුව තමයි ඉදිකිරිම පවත්වාගෙන යන්නේ මෙන්න මේ කාරණය තමයි එතන සිද්ධවෙන්නේ. මීට වඩා මම මුදල් වෙන් කරා මේ තියන අයිටම් ටික වෙනත් ස්ථානයකට ගෙනයන්නත් එකට සරිලන විධියට ෆයිබර් වලින් හදන අයිතම ගෙනල්ලා එක උඩ සවි කරලා ළමා උද්‍යානය සකස් කලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

නගරාධිපතිතුමණි දැන් තියෙන ප්‍රශ්ණය තමයි කවුද ඔය වැඩෙට විරුද්ධ?

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි කවුරුත් විරුද්ධ නෑ.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි ඇයි එහෙමනම් ඔබතුමා මේච්චර හොද වැඩක් අපි කවුරුත් එකගයි. මේ කරන වැඩේට විරුද්ධ නැනේ.හැබැයි සිද්ධ වෙන්නේ දැන් මේ වැඩේ කොමසාරිස්තුමත් දන්නැතිව සිද්ධවෙන එකනේ.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි හරියටම දවස් දෙකයි කාලේ තියෙන්නේ.එතුමන්ලාට අනුමැතිය දිලා එතුමා පටන්ගන්න කියන කොට දවස් දෙකයි.අපිටවත් කාලයක් නෑ.අපි මේක දන්නවා සභාව එකගවෙන්නේ නැති එකක් නෙමෙයි මේක කරන්න ඕන හොද යෝජනාවක්.එක නිසා මට සභාවේ ආවරණ අනුමැතිය යටතේ මේවගේ සභාවට එලදායිවිධියට වෙන්නාවු දෙයක් ලබා දිමේදි මට කොමසාරිස්තුමාගෙන් විමසිමක් කරන්න ඕන නෑ.මං එ අනුමැතිය දුන්නා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි මම දන්නවා අවසානයේ ඔබ ඉන්නේ ඔතන කියලා.නමුත් කෝල් එකක් දිලා මේ නිතර කථාකරන කොමසාරිස්තුමාට හරි කිව්වානම්

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා කොමසාරිස්තුමා ඇහුවා ඇහුවාම කිවුවා.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නිශාන්ත මන්ත්‍රීතුමා සමහර විට ඔබතුමා දන්නවත් ඇති ජනාධිපති පරික්ෂණ පැවැත්වුවා ලක්ෂ 2000 ක් ලූනාවේ කලපුවෙන් යන්න ගියා.එ ලක්ෂ 2000 වැඩ කරලා ටෙන්ඩර් කිරිම ටෙන්ඩර් ප්‍රදානය මුදල් ගෙවිම එක දවසේම මේ සභාවට ආවා.හැබැයි එකේ අවසානයේ ජනාධිපති විමර්ශනයෙන් කිව්වේ එක දවසේ සියලු දේ ආවත් වෙන්න ඔන කාර්යය සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදනය සභාව සතුකරගෙන කරලා තියෙනවා කියලා.එවගේ දැන් මේක මේ එකපාරටම මාසයයි තිබුනේ ගරු නිශාන්ත මන්ත්‍රීතුමා සමාවෙන්න ඕනෑ. මට දින දෙකයි තිබ්බේ දින දෙකේදි කුමන දේකටවත් කරන්න කාලයක් මට නෑ.කර්මාන්ත කමිටුවට දාන්න කාලයකුත් නෑ.මුදල් කමිටුවට දාන්න කාලයක් නෑ ඔක්කෝම කමිටුත් ඉවරයි. මට තිබුණු එකම දේ තමයි ඵලදායි ව්‍යාපෘතිය කිරිම සඳහා සභාවේ ආවරණ අනුමැතිය යටතේ මේය ලබාදිමේ කටයුත්ත කරන්න.මං එක කලා වරදක් කලා නෙමෙයි තව ප්‍රතිපාදනයක් ලබාගැනිම සඳහා කරපු කාර්යයක්.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා 02(1) සඳහන් වෙනවා ඩික්සන් ජේ ක්‍රිඩාංගනය සම්බන්ධව. මේ අපි දන්නවා ඔබතුමත් දන්නවා වර්තමාන තත්වය වල් බිහිවෙලා විනාශ වෙලා වැසිකිලි පද්ධතිය විනාශවෙලා සිගිති උද්‍යානය පාවිච්චිකරන්න බැහැ.ලොකු ප්‍රශ්ණයක් තියෙන ක්‍රිඩාංගනයක් මේ ක්‍රිඩාංගනය සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියත් සමග සාකච්ඡාවක් 11.23 දින තිබිලා තියෙනවා.මෙහි මොනවා හරි

**<u>ගරු නගරාධිපති ඩබ්ලිව් සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා රැස්විමට ආවේ නෑ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - තිසර මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා ඔබතුමා මේකක්ද මේ සම්බන්ධව ඉදිරියේදි?

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා ලබන පාර අනිවාර්යෙන්ම මට ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණයක් තියෙනවා. ලක්ෂ 200 ක් සාමාන්‍යයෙන් කොට්ඨාශයට එන්නේ නැතිව ලැබිච්ච මුදල් වලින් අපි මේ සියලු සංවර්ධන කටයුතු කරනවා. ක්‍රිඩා රාජ්‍ය අමාත්‍යංශයෙනුත් අපිට සැලකිය යුතු විධියට ක්‍රිඩාංගන නවිකරනය කිරිම සඳහා නඩත්තුකර ගැනිම සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රතිපාදනය 2022 අවුරුද්දේ දේන්න අපිට සාකච්ඡා කරලා තියෙනවා.මේ ක්‍රිඩාංගන සියලුම දේ වගේ නවිකරනය කිරිමේ කටයුත්ත කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - තිසර මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා බොහෝම ස්තුතියි.එවගේම ක්‍රිඩාංගන වල තියෙන ලොකුම ප්‍රශ්ණයක් තමයි තණකොල ටික කැපිමේ ප්‍රශ්ණය

**<u>ගරු නගරාධිපති ඩබ්ලිව් සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා එ මැෂින් එක තමයි ලබන සුමානේ ගන්නේ.

**මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමණි 2(9) අයිතමය සොයිසාපුර ක්‍රීඩාපිටියට බාස්කට් බෝල් ක්‍රීඩාංගනයක් ලබා ගැනිම සම්බන්ධව දැන් මේකේ තියෙනවා බාස්කට් බොල් ක්‍රීඩාපිටිය සකස්කිරිම කඩිනමින් ආරම්භ කිරිමට අවශ්‍ය කටයුතු කරනවා කියලා.මම 2006 සිට නියෝජනය කරලා මට තිබ්බ එකම අවශ්‍යතාවය තමයි පැසිපන්දු ක්‍රිඩකයෝ හැටියට ගරු නගරාධිපතිතුමා පැසිපන්දු ක්‍රීඩාංගනයක් මොරටුවේ කොහෙ හරි තැනක දාන්න ඕන ඔබතුමාට යෝජනා කරා දැන් මේ දක්වා ශ්‍රී ලංකා පැසිපන්දු පිලේ ක්‍රිඩකයෝ ගොඩක් මොරටුවේ ඉන්නවා.අපි කට්ටිය ගෙනල්ලා සාකච්ඡාවක් තියලා හොඳ තැනක මේ වැඩේ ආරම්භ කරමු.මේක නිකම් මේ කොලයකට සිමා වේලා මන් හිතන්නේ ඔබතුමා කඩිනමින් ආරම්භ කරන්න කටයුතු කරනවා කියලා තියෙනවා.

**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා අපිට වුනේ එකතමයි එකපාරටම ලහි ලහියේ මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා මුල්ගල තිබ්බා.එ තිබුණු සල්ලිටික ලහි ලහියේ ගෙනල්ලා මුල්ගල තිබ්බා අපේ පොල්වත්තේ. එය අපි කරන්න ගියේ එතන දැන් එකට අපේ ප්‍රතිපාදන ලබාගැනිමට පුලුවන් 2022 වර්ෂයේ ආරම්භයේ එක්කම අපි එක කරමු.

අනිවාර්යෙන්ම ඔබතුමාගේ මුලිකත්වයෙන් මොකද ඔබතුමා දක්ෂ පැසිපන්දු ක්‍රිඩකයෙක් කියලා මම හොදින් දන්න නිසා එයට ඔබතුමාට නායකත්වය දෙනවා.

**මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමණි, මම කථා කරන්න ගියේ 02(1) යෝජනාව ගැන තිසර මෙන්ඩිස් මන්ත්‍රීතුමා කථා කලා. එවගේම ගරු නගරාධිපතිතුමණි ක්‍රිඩා කමිටු වාර්තාවේ 1.3.2 යටතේ තියෙන කථාවට අදාලව මම කථාකරන්නේ. මොරටුව වේල්ස්කුමර විදුහලේ ආදිශිෂ්‍ය කමිටුවේ කමිටු සාමාජිකයෙක් හැටියටත් එවගේම මගේ හිතවත් රවි මන්ත්‍රීතුමා ඉන්නවා කමිටු සාමාජිකයෙක් හැටියටත් මා දන්නවා ඉදිරියේදි අපේ මහා ක්‍රිකට් තරගය පැවැත්වෙන්න කටයුතු සුදානම් වෙලා තියෙනවා. මම ඇත්තටම මේ සම්බන්ධව යම්කිසි දේයක් ආදිශෂ්‍ය සංගමයේ නිසා දන්නවා.මේ ක්‍රිඩා තරගය සුදානම් කිරිමට ආදිශිෂ්‍ය සංගමයෙන් සිසිර චන්ද්‍රපාල මහතා, ප්‍රිති කුමාර මහතා නගර සභාවට ඇවිල්ලා අපේ ක්‍රිඩා කමිටු සභාපතිතුමා එක්ක එකතුවෙලා සාකච්ඡාවක් පැවැත්තුවා.මම හිතන්නේ ක්‍රිඩා තරගය පැවැත්විමට සියලු සංවිධාන කටයුතුවලට සහය නගරාධිපතිතුමාගෙන් ලැබෙන බව විශ්වාසයි.කමිටු රැස්විමෙන් මට පෙනි ගියා.දැන් මම කථා කරන්නේ ගරු නගරාධිපතිතුමණි දිගින් දිගටම ක්‍රිඩා කමිටුවේ සාමාජිකයෙක් නොවී සිටියේ මම එ කියන්නේ මම පත්වේච්ච දා සිට කුමාර රාජරත්න මන්ත්‍රීතුමා ක්‍රිඩා කමිටු සභාපතිවරයා විදියට ඉන්න කාලේ සිට කිසිම දවසක ක්‍රිඩාකමිටුවට සහභාගිනොවි හිටියේ නෑ.මා දැක්කා 2021-03-08 වන දින දි අපේ ගරු කේ.ඩි.අනුර ප්‍රනාන්දු මන්ත්‍රීතුමා අපි විසින් ගොඩක් සොයිසා ක්‍රිඩාංගනයේ අඩුපාඩු සම්බන්ධව

යෝජනා කරා.ඒ යෝජනා සියලුම දේ එකතුකරලා මං හිතන්නේ මම කියපු ගොඩක් එවා එකතු කරලා එතුමා යෝජනාවක් එකතු කරලා ගෘහස්ථ ක්‍රිඩාංගනයේ ඉදලා සොයිසා ක්‍රිඩාංගනයේ අඩුපාඩු වාර්තාවක් ක්‍රිඩා කමිටු වාර්තාවේ තිබෙනවා.ගරු නගරාධිපතිතුමණි දැන්මේ කටයුතුවලට තියෙන්නේ අවසාන තැන මට පෙනවා පැහැදිලිව මේක දකින්න තියෙනවා සැම නාගරික මන්ත්‍රිවරයෙක්ටම මේ ක්‍රිඩා කමිටුවාර්තාව බැලුවාම මොකක්ද මේ තත්වය කියලා පෙනවා පැහැදිලිවම. ඉතින් දැන් තියෙන්නේ නාගරික ගණකාධිකාරිතුමාගේ මේතනට මුදල් සැපයිම පමණයි.මම හිතන්නේ ඉදිරියේදි මේ ක්‍රිඩාංගනයේ අඩුපාඩු ටික හැකි ඉක්මණින් සපයලා අපේ බිව්මැච්වෙක හොදට කරන්න පුලුවන් සභය ඔබතුමා ලබාදෙයි කියලා මේ කටයුතුත් ඉක්මණින් ක්‍රියාකරලා සොයිසා ක්‍රිඩාංගනයේ අඩුපාඩු ටිකත් සකස්කර දෙනමෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

2021.11.10 දින පැවති කිඩා කටයුතු හා පොදු විනෝද කමිටු පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(6) 2021.11.11 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා

බැලිම.

**<u>මහ නගර සභා මන්ත්‍රි - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි, කර්මාන්ත කමිටුවේ 3(19) මෝල්පේ සායන ගොඩනැගිල්ල සිවිලිම අලුත්වැඩියා කිරිම. ගරු නගරාධිපතිතුමණි මට දැනගන්න ඔන ඒ නව සායන ගොඩනැගිල්ලද නැත්නම් පැරණි සායන ගොඩනැගිල්ලේ සිවිලිමද එසේනම් මම පැරණි ගොඩනැගිල්ල ගැන කථා කරන්නම් එකේ අඩුපාඩු ගැන අපේ හිතවත් නිශාන්ත මන්ත්‍රිතුමා ඔසද මන්ත්‍රිතුමා කථා කලා මත්ද්‍රව්‍ය ප්‍රශණයක් පැරණි සායන ගොඩනැගිල්ලේ තිබුණා.ලොකු ප්‍රශණයක් නමුත් මේවන විට එය නිල නිවසක් බවට පත්කරලා තියෙනවා.ඒ ගැනත් අපි කලින් කථා කරලා තියෙනවා. නගරාධිපතිතුමණි මට දැනගන්න ඔන මේ නිල නිවස අපි ලබා දෙන කොට යම් කිසි මුදලක් ඒ ඔවුන්ගේන් අය කරගෙන යනවාද?

**<u>ගරු නගරාධිපති ඩබ්ලිව් සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා ඔවුන්ගේ වැටුපෙන් කපනවා.

2021.11.11 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු

තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(07) 2021.11.11 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරනය පිළිබඳ ස්ථාවර කමිටු

වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

2021.11.11 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරනය පිළිබඳ ස්ථාවර කමිටු

වාර්තාවේ සියලුම කමිටු තිරණයන් එකමතිකව සහා සම්මත විය.

06(8) 2021.11.12 දින පැවති ඵලදායිතාව සහ මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන්

සලකා බැලිම.

2021.11.12 දින පැවති ඵලදායිතාව සහ මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම

තිරණයන් එකමතිකව සහා සම්මත විය.

06(9) 2021.11.12 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

<u>මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමණි, මට ප්‍රශ්ණයක් තියෙනවා මුදල් කමිටුවේ සේවක අර්ථසාධක අරමුදල අධිභාරය. අපි දන්නවා මිලියන 1.1ක් වාරික 78 කින් ගෙවා නිම කිරිමට නියමිතයි.එ ස්ටේට්මන්ට් එක මේ මාසයේ සටේට්මන්ට් එකේ ඇතුලත් නෑ.මේ මාසෙට ඔක්තොබර් මාසේට ගෙවිමක් කරන්නේ නැද්ද.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි ගිය ගමන ගෙවන්නට තියෙන අධිභාරය අපි අනිවාර්යෙන්ම මාස් පතා අවුරුදු ගානක සිට ගෙවාගෙන එන නිසා ගියවර අපි අනුමැතිය ගත්තේ ගෙවන්නට තියෙන සියලුම අධිභාරයේ කොටස්වලටම එකපාරම අනුමැතිය ගත්තා ඉතිරි වාරික 10 සම්පුර්ණයෙන්ම ගෙවන්න කියලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමණි පිටු අංක42 හි අංක22(2) 22(3) විදුලිය සම්බන්ධව එම පෙමන්ට් දෙකම එකම ලිපිගොනු අංකයෙන් තමයි යන්නේ එවගේම එකම මාසෙටම තමයි සඳහන් වෙන්නේ බොහෝදුරට මේක දෙපාර්තමේන්තු දෙකක බිලක්ද නැත්නම් එකම දේ රිපිට්වෙනවාද?

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය අපේ විදුලි බිල් ලැබෙන්නේ දින දෙකකදි එකපාර ලැබෙන්නේ නෑ.එ ලැබෙන්නේ නැතිවුනාම මෙතන තියෙන්නේ මේ විදුලි බිල්වල කොතන්ටද කොතන්ටද කොතන්ටද ලැබෙන්න කියන එක අපිට නිවැරදිව සටහනක් එන්නේ නෑ.එ නිසා තමයි මේ විධියට මේක ලබාදිලා තියෙන්නේ මේ එන්නේ දින දෙකකදි

**<u>මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමණි එන්නේ දින දෙකකදි හැබැයි එකම යුනිට් එකට තමයි එන්නේ සම්පුර්ණයෙන්ම නමුත් මෙතන මාස ගත්තෝත් ගරු නගරාධිපතිතුමණි මෙතන මුල් එක තියෙනවා 22(2) එක මුලින්ම පටන්ගන්නේ පෙබරවාරි සිට ජුලි දක්වා යනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනේගෙවිම් කරන කොට දෙක එකට ආවෝත් ගෙවිම් කරන කොට එකට කරනවා. එකට කරනකොට සමහර වේලාවට වැඩියෙන් පෙනවා.අපිට එනකොට අපි එකතුකරලා ගෙවනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි මුදල් කමිටුවේ ප්‍රධාන වශයෙන්ම ප්‍රශ්ණ කිරිමකට ලක්කරනවා වියදම් පැත්තේ තියෙන ගැටලුව විශේෂයෙන් ඔබගේ අයවැය ප්‍රකාශයේ ඔබ ඉතා පැහැදිලිව කියනවා මාර්ග සහ කාණු ඇතුලු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 182 ක් පමණ රුපියල් මිලියන 189 ක ප්‍රතිපාදන යොදා ක්‍රියාත්මක කිරිමට කටයුතු කර ඇති බව මිලියන 189 ක් එතකොට තියෙන ගැටලුව තමයි දැන් ගරු නගරාධිපතිතුමණි මේ අපට දෙන මුදල් කමිටුවේ එනවා ඔක්තෝබර් දක්වා වැය විශ්ලේෂණ මාස්පතා වියදම් කරපු විධිය.මාස්පතා වියදම් කරපු විධියට අනුව ඉතාම පැහැදිලියි වැය ශිර්ෂ සම්බන්ධව

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමාඔබතුමාට මම උදව්වක් කරන්න යන්නේ මගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තියෙන්නේ මිලියන 189 කියලා.හරිනෙද මම කියන එක මේක අපි මෙතෙක්කල් ප්‍රතිපත්ති ප්‍රකාශනයයි බජට් එකයි කියන්නේ දෙකක් මේ රජයෙන් අපිට ලබාදුන්න කාපට් මාර්ග ටික ඔක්කෝම ඔකට ඇතුලත්.එතකොට අපේ වැය ශිර්ෂය එකක් අපි කියලා තියෙන්නේ අපිට අයිති දේපලවලට වියදම් කරපුවා තමයි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියලා තියෙන්නේ.වැයශිර්ෂ වලින් වියදම් කරපුවා එකක් එකට එකතුවෙනවා රජයෙන් අපිට ලබාදිපු කාපට් සදහා කිලෝමිටර් 18 ක් කලෝත් ලක්ෂ 1800යි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි ඔබේ පැහැදිලි කිරිම ඔබ කරන්න.මේ පිළිබදව ඉතාම හොද අවබෝධයකින් තමයි ප්‍රශ්ණ කිරිම් කරන්නේ මම හිතන්නේ දිගින් දිගටම මම සංවාදයක් කරන්නේ නෑ.ඔබ අඩුම තරමේ ඔබේ අයවැය ප්‍රකාශයවත් ඔබ

කියවගත්තේ නෑ කියලා මගේ විවේචනය.ඔය189 කියන්නේ ඔබම කියනවා 2021 තුල වර්ෂයේ රජය මගින් ක්‍රියාත්මක මාර්ග කාපට් කිරිමේ ව්‍යාපෘති රුපියල් මිලියන 180 ක පමණ ඔබ එක වෙන් කරලා පෙන්නනවා.මට තියෙන ගැටලුව තමයි එපමණ මුදලක් මේ සභාව අනුමත කලේ නෑ අනුමත කරපුවා තියෙන්නේ මේ වැය විශ්ලේශන වලට අනුව ඉතාම පැහැදිලියි .

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා තව පොඩි පැහැදිලි කිරිමක් කරන්න ඕනා මෙකට තව එකතුවෙන්න තියෙනවා ගොඩනැගිලි උදාහරණයකට ගත්තතෝත් අපිට එනවා පළාත් සභාවෙන් එනවා ගොඩනැගිලි හදන්න.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි මට හොදටම පැහැදිලි.එ කියන්නේ අපිට දිලා තිබෙන්නේ මිලියන 4යි ලක්ෂ 48 යි එක වැය ශිර්ෂයක් එ වැය ශිර්ෂය තමයි 312 රොම ඉලක්කමෙන් 1 අපිවෙන් කලා ලක්ෂ 400ක්.ලක්ෂ 400 න් මිලියන 4 යි මේවෙනකම් අපිට දිලා තියෙන වියදම්.එ වියදම් අතරත් ජනවාරි නෑ.පෙබරවාරි නෑ.ජුනි නෑ.ජුලි නෑ.මාස ගාණක ව්‍යාපෘති වියදම් නෑ. මේ වැය ශිර්ෂයේ හැබැයි ඔබ දන්නවාද ඔක්තෝබර් මාසේ ලක්ෂ 36 ක් වියද්ම කියලා පෙන්නනවා.මිලියන 3.6ක් එ නිසා දැන් අපි දිර්ස අයවැය ලේකනය විශ්ලේශනය කරපුවාම පැහැදිලියි අපට සත්‍ය පෙන්වන නමවන මාසේවෙනකොට මිලියනයක් වැය කල බව පෙන්වන වැය ශිර්ෂය එ අවුරුද්ද අවසාන වෙනකොට හිතාගන්න බැරි ප්‍රමාණයකින් ඉහල යනවා. මේක තමයි මේ ක්‍රමවේදය ගරු නගරාධිපතිතුමණි අදත් මේ සභාවේ අර අනුර සහෝදරයා කියනවා අහගෙන හිටියා මම අපිට ප්‍රශ්ණ මල්ලක් තියෙනවා අපිට මුදල් පොඩ්ඩක් තියෙනවා.එ ප්‍රශණ මල්ලේ ඇත්තටම අපි ප්‍රමිතියක් ප්‍රමුඛතාවයක් සහිත වියදම් කිරිම තමයි මේ වේලාවේ ඉතාම අසිරු තැනකට ගමන් කරමින් ඉන්නේ.මම මේ කරපු ව්‍යාපෘතිවලට ගිහිල්ලා බැලුවා මන් දැක්කා තෙලවල මම කියනවා පුස්ප්කාලේ වැසිකිලියට යන්න බෑ.වහල තෙමෙනවා අර තිබ්බ්ච යකඩ වැට ගලවලා එකේ තාප්පයක් ඉදිකරනවා යකඩ වැට ගහනවාලු තාප්පය උඩින්.දැන්මේ ක්‍රියාත්මකයි.එවැනි මම දැකපු ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා එවා ඵලදායික නෑ.එනිසා මේ වෙලාවේ ඔබේ අවධානය යොමු කරනවා මිට වැඩිය මේක ගන්නේ නෑ.මම හොදටම දන්නවා මේ ඇයි මොකක්ද මේ කරන්නේ කියලා මේ ප්‍රතිපාදන ඇස්තමේන්තුවට ඉක්මවා යනවා වර්ෂය අවසානේ එකම මාර්ග කානු මේ ඉදිකිරිම් මේක ඉහල සිට පහලටම වැඩිපුර මුදල් වැය වෙන්නේ මෙතනට එනිසා ඔබෙන් ඉතාම ඕනැකමින් ඉල්ලා සිටිනවා මේ ඉදිකිරිම් අතිශය ප්‍රමිතියෙන් තොරයි.මුලික අවශ්‍යතා නෙමෙයි එ නිසා හෙට දවසේ අපි කරා එමින් තිබෙන මහා ආර්ථික අවපාතය මේ සභාවට මුහුණ දෙන්න වෙනවා.එ නිසා අපි දැන් සිට වියදම් කරන්න ඔන මොනවාද එපා මොනවාද මන් දන්නෑ ඔබට ලාභ මොනවාද අලාභ මොනවාද කියන එකනම් ලාභ ඉදිකිරිම් හැබැයි සභාවට එකනෙවෙයි ගරු නගරාධිපතිතුමණි එ කියන්නේ අපි හෙට දවසේ අපිට ලැබෙන මේ ජනතාවගේ බදු මුදල් ටික ඉතාම හොදින් යෙදෙව්වෝත් මේ ව්‍යාපෘති ඔබ

හදන්න පුලුවන්නම් මේ කරපු ව්‍යාපෘති අධීක්ෂණය කරන්න මේ මන්ත්‍රීවරුන්ගේ කමිටුවක් ගිහිල්ලා මොනතරම් මේ ව්‍යාපෘති අතිශය ප්‍රමිතියෙන් තොරද කියලා අපි එතනට වැය කරන්න ඔන නෑ ඔබට මට අපි කාටත් තේරේනවා වැය කලයුතු වැඩ ප්‍රමාණයක් තියෙනවා එ නිසා ඉදිරියේ එන්නේ අනතුරු දායක තත්වයක් එය නෑ කියන්න ඔබටත් බැ මටත් බැ.අපි කවුරුත් එ තත්වයට මුහුණ දෙමින් ඉන්නවා එනිසා අපේ සභාවේ මුදල් ටික හරි අර වැඩදායි ඵලදායිතාවයක් ඇතුලේ ව්‍යාපෘතිවලට වියදම් කරමු.එ නිසා මේ වියදම් කරන සහ මේ ලේකනවල තියෙන පරස්පරතාවය මේ වැය ශිර්ෂවල වැය විශ්ලේශනවල සහ අපිට දෙන මාසික එවායේ විශාල පරස්පරතාවයන් තියෙනවා මන් දැන් එවා එකින් එක අරගෙන කථාකරන්න යන්නේ නෑ.එ නිසා අවසාන වශයෙන් අපිට එකගවෙන්න බැ.නමුත් අවාසනාවකට වගේ අපේ ව්‍යාපෘති දෙකකුත් තියෙනවා එකග නොවි බැ.එ නිසා විගණනයට බය නෑ.විගණනයට ගරු කිරිමක් තියෙනවා.මුදල් වියදම් කිරිම වැරදි ලෙස සිද්ධවුනොතින් අපි විගණනයට ලක්වෙනවා.අපි එකට යටත් ගරු කරනවා එ නිසා මේ මුදල් වියදම් කිරිම පිළිබදව ඉතා බරපතල ප්‍රශ්ණ තියෙනවා. අපි 15(1),15( 2) ට පක්ෂ වෙනගමන් අනික්ටිකට විරුද්ධවෙනවා.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නිශාන්ත මන්ත්‍රීතුමා පොඩි පැහැදිලි කිරිමක් කරන්න ඔන. ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරලා තියෙන 2022 වියදම් පිළිබදව කිසිම කසු කුසුවක් නෑ. එ පිළිබදව සත්‍ය තොරතුරු හැබැයි 2023 බජට් එකේදි අපට 2021 දි අපිට මිටත් වඩා දරලා තියෙන කියලා මිලියන 94 ක් අපේ පස්සේන් එනවා.ගරු මන්ත්‍රීවරුන්ට එවලා තියෙනවා ගමට මිලියන 2 බැගින් යෝජනාවලියක් දැන් ක්‍රියාත්මක වෙමින් එනවා සැම ග්‍රාමසේවා වසමකටම මිලියන 2 ක් ඇවිල්ලා තියෙන්නේ.එවයේ ව්‍යාපෘති දැන් ක්‍රියාත්මක වෙනවා.එ ව්‍යාපෘති ක්‍රියාත්මක විම සදහා ගිය මාසේ තමයි ආර්ඩ් එකෙන් අපිට දෙන්නේ මෙන්න ගයිඩ් ලයින් එක මොන මොනවටද මෙන්න මේ මුදල් වැය වෙන්න ඔන විධිය මොකක්ද කියන එක ආවේ.හැබැයි මම 2021 එකකටවත් දාලා නෑ.තවත් ලක්ෂ 940 ක් එකතුවෙනවා.මට එක් කියන්න වෙන්නේ 2023 අයවැයේදි.තාම එක කිව්වේම නෑ.හැබැයි එක කියන්නැතුව කරන්න බැ.හැබැයි ඔය කියපුවා ඔක්කොම කරපුවා.බිල්ඩින් හදපුවා ආණ්ඩුවෙන් එවපුවා පළාත් සභාවෙන් එවපුවා කාපට් කරපුවා.කාපට් කරපුවා වෙනම තියෙනවා ගොඩනැගිලිවල දැන් මේ පිටිපස්සේ තියෙන ලක්ෂ 70 ක් ගෙවලා තියෙන්නේ පළාත් සභාවෙන් තාම විවෘත කරපු නැති එවගේ එවපු ඔන තරම් මුදල් තියෙනවා. ඉතින් එවා එකතු කරන්න ඔන ඉතින් එක අපිට ලැබිලා තියෙන ආයතනය මොකක් ද කියන එක නෙමෙයි කරලා තියෙන්නේ අපි නිසා අපි එකතුකරන්න කිසිම සාවද්‍යයක් නෑ.හැබැයි හෙට මම අපේ මොන විධියටවත් නගර සභාවේ බජට් එක කියන්නේ ජනවාරි 01 දා සිට දෙසැම්බර් 31 න් අවසන්විමේද නගර සභාව ණය නෑ.අපිට විවිධ ණය හිමි ලේඛනයට අරගෙන ගිහිල්ලත් වැඩ කරන්න පුලුවන් ලබන අවුරුද්දට.එතකොට අපි ණය නෑ.එ අපේ බජට් එකේ තියෙන ප්‍රතිපාදනත් එක්ක කළමනාකරනය කරගෙන අපි ගිහිල්ලා තියෙනවා.ණය වෙන්න ඔනෙ අපි ලබන

අවුරුද්දේ තියෙන සල්ලිවලින් කටයුතු කරන්න ප්‍රතිපාදන සභාවට වෙන් වෙන්නේ නෑ.එහෙම ප්‍රතිපාදනයක් ගන්න බෑ.වර්ෂය තුල අවසන්වෙන්නාවූ බජට් විතරයි සභාවකට කරන්න පුලුවන්.එ බජට් එක තුල අපි ඉන්නවා.එ බජට් එකෙන් පරිභාහිරව ගිහිල්ලා නෑ.අපි එ බජට් එක තුල කළමණාකරනය කරගත්ත මන්ත්‍රී කොට්ඨාශයකට වෙන් කරන්න පුලුවන් මුදල ලක්ෂ 15 ද 10 ද 20ද මෙදාපාර අපිට 10 න් නවතින්න වුනා.හේතුව ලැබෙන්නාවූ ප්‍රතිපාදන අඩුනිසා.හැබැයි ඊට වඩා ලොකු ප්‍රමාණයක් අපිට පළාත් සභාවෙන් මධ්‍යම ආණ්ඩුවෙන් අපිට ලැබුණා. එ ලැබෙන එවා මොන විධිය කින්වත් සතපහකවත් එහාට මෙහාට යන්නැතිව කරගෙන දැන් ලඟි ලඟියේ අපි නොවැම්බර් අවසානයේ පටන්ගත්තේ දෙසැම්බර් මාසේ පටන් ගන්නවා. අපි හිතනවා අපිට කාලය ලබාදෙයි කියලා කාලය ලබාදීමත් එක්කම අපි ඉතාමත්ම වේගයෙන් දුවනවා. ලබන අවුරුද්දේ ඊටත් වඩා වේගයෙන් දුවන්න වෙනවා.ඊළග අවුරුද්ද වෙන කොට වේගයෙන් දුවන්න පාරවල් නැතිවෙනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඞී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමණි 2020 ගත්තොත් 2020 සත්‍යානේ අපිට එන්නේ මේ අවුරුද්දේ බජට් එකෙන් 2020 සම්පුර්ණ වියදම් කරපු සත්‍ය අපිට ගෙනවා 2022 බජට් එකෙන් දැන් එවික අපි හරියට බලපුවාම හිතාගන්න බැරි විධියට මේ 2020 3344 නැත්නම් 1312 වැය ශිර්ෂ ඇස්තමේන්තුව ලක්ෂ 60යි.සැප්තැම්බර් වෙනකොට වියදම් ලක්ෂ 6 මිලියනයක්වත් නෑ.හැබැයි මට කියාගන්න ඕන මුලුවියදම ලක්ෂ 574 නැත්නම් මිලියන 56 ක් අවසාන කාර්තුවේ.අන්තිම කාර්තුවේ මිලියන 56 ක් වියදම් කරලා එ අවුරුද්දේම 212 අවසාන කාර්තුවේ මිලියන 72 ක් සරල නෑ.දැන් මේක කරපු විධිය හිතාගන්න බෑ.මේ අවසාන කාර්තුවේ තමයි මේ යන්නේ එතකොට අනිවාර්යයෙන් වෙන දේ තමයි මේ ව්‍යාපෘතිවල ප්‍රමිතිය සැලකිය යුතුලෙස දූර්වල වෙනවා.මේක තමයි ඔබ කොච්චර තර්ක ගොඩනැගුවත් මම එකින් එක කියලා හැප්පේනන්නේ නෑ.මේක තමයි මේ මුදල් විශාල ලෙස හානි කරන තත්වය. මේ ව්‍යාපෘති ආයි බලන්න ඔබ එක්කගෙන යන්නම් පාරක් පාරක් ගානේ එක්කරගෙන යන්නම් අපි හදපු ඇස්තමේන්තුවට පිළිගත හැකි ලෙස මේ ව්‍යාපෘති කරලාද නැද්ද කියලා හොඳින් බලන්න.කමක් නෑ එවා ජනතාවගේ ප්‍රයෝජන ගත හැකි ලෙසනම් එ ව්‍යාපෘති පාරවල් ගොඩක් තියෙනවා හදපු පාරවල් සති 2-3 යනකොට ගල් ගැලවිලා විශාල විනාශයක් එනිසා ගරු නගරාධිපතිතුමණි එහෙම නොකර මේවා අවුරුද්දේ මුල ඉදලා අන්තිම වෙනකම් කමක් නෑ ඔබ පාරවල්නම් හදන්නේ ඔබ ජනතාවටනම් වැඩ කරන්නේ අපි කියන්නේ එ වියදම් කරන මුදලින් ඉතාම හොද ප්‍රතිඵලදායක ප්‍රමිතියක් සහිත ව්‍යාපෘතියක් වෙන්න ඕනෑ.

විඩියෝ එකක් ආවා. වැස්සට දිනපොලේ ඔබ බලන්න ඇති වහින වේලාවේ පිල්ල හෝගාලා මේ ඊයේ පෙරේදා දාපු පීල්ල වතුර හෝ ගාලා වැක්කේරේන්න පටන්ගත්තා.අතිවිශාල මුදලක් දිලා හදපු පීල්ල.මං හිතන්නේ එතන හිටපු ඔබේ දන්න හිතවත් කෙනෙක් තමයි ඔහු මට කිව්වා ඔබට විඩියෝ එක දැම්මා කියලා.මම කියන්නේ දැන් මේ නිළධාරින්ටත් වගකිමක් තියෙනවා ඔබට පමණක් නෙමෙයි දේශපාලඥයා විධියට ව්‍යාපෘති සකස් කරලා යනකොට නිළධාරි තමයි

මූලික වගකීම තියෙන්නේ මේ වැඩ හොඳ ප්‍රමිතියක් සහිතව කරන්න.හැබැයි අපි ඔබට ඉදිරිපත් කරන්නම් වාර්තාවක් මේ 2020 2021 අවුරුද්දේ වියදම් කරපු විශාල ධනස්කන්ධයක් නිස්කාරනේ වැය කරලා .

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නිශාන්ත මන්ත්‍රීතුමා අපි මාර්තු ඉදලා මේ කටයුත්ත කරන්න හැදුවා.මේ කොවිඩ් තියෙන රටක අපි මේ වැඩේ කරන්නේ දැන් අපිට මාර්තුවල හරි එහෙම නැත්තම් කරන්න වෙයිද නොවැම්බර් හරි දෙසැම්බර් හරි අපි කරන්න ඕන.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා කොවිඩ්වලදී සෞඛ්‍ය පැත්තට නෙමෙයි වැඩි වියදම් කරලා තියෙන්නේ ඉදිකිරීම් පැත්තට

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි නැහැ ඔබතුමාට සෞඛ්‍ය පැත්ත ගැන කථා කරන්නේ නෑනේ. ඔබතුමන්ලා මේකේ තියෙන නරක දේ ඔබතුමන්ලා හැමදේම නරකෙන් බලන එක ඔබතුමාටත් සාපෙක්ෂව කියන්න පුලුවන්නේ.මම ඉන්න සභාවේ මමත් එකගවේලා මමත් කථා කරලා අනික් ලංකාවේ කවුරුත් නොකරපු එකක් අපේ සභාවේ කලා කියලා ඔබතුමාට කියන්න බෑනේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා මේකේ සිකියුරිටි එක ගත්තානම් ජවිපේ තමයි ඒ මැදිහත්විම කලේ. මේ ආරක්ෂක අංශයට අදාල යෝජනා ගෙනල්ලා.අර රසාගනාගාරයට ගත්තානම් ජවිපෙ තමයි යෝජනා ගෙනල්ලා ඔබව අපි එතනට ගෙනල්ලා ඔබත් කැමති වුනා. හැබැයි අපි කොවිඩ්වලට අදාල මියයන අයට නොමිලේ කටයුතු කරන්න ජවිපෙ තමයි යොජනාව කලේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි අපි මුදල් කමිටුවේ අංක 11, 13, 17 (25), 18 (1) සිට 18(7) දක්වා, 32 හා 33 ට අපි විරුද්ධයි.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි අංක 11, 13 (1) ,17( 25) 18 (1)සිට 18(7) දක්වා 32 හා 33 යන කාරණාවලට අපි විරුද්ධයි.

2021.11.12 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | යු.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 13 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 14 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 15 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 16 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 17 | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 18 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 19 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 20 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 21 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 22 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 23 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උපීත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 25 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |

2021.11.12 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 11, 13, 17 (25), 18 (1) සිට 18(7) දක්වා, 32 හා 33 ට විරුද්ධවත් අනෙකුත්.සියලුම කමිටු තිරණයන්ට පක්ෂවත්පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01 මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා

02 මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා

03 මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණි පීරිස් මහතා

04 මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය

05 මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

06 මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය

2021.11.12 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 11, 13(1), 17 (25), 18 (1) සිට 18(7) දක්වා, 32 හා 33 ට විරුද්ධවත් අනෙකුත්.සියලුම කමිටු තිරණයන්ට පක්ෂවත්පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01 මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා

02 මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා

03 මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය

04 මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

05 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය

06 මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය

2021.11.12 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 15(1) සහ 15(2) කරුණුවලට පක්ෂවත්, අනෙකුත්සියලුම කමිටු තිරණයන්ට විරුද්ධවත් පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01 මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා

02 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය

03 මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

04 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

2021.11.12 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.

(මෙම අවස්ථාවේදී පහත නම් සදහන් මන්ත්‍රිවරු සභාගැබෙහි නොසිටියහ.

01 නියෝජ්‍ය නගරාධිපති - ඩී .සමන්ත සිල්වා

02 මහා නගර සභා මන්ත්‍රී - ඩී එම් සුජිත් පුෂ්පකුමාර

03 මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා

04 මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා

05 මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා

06 මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා)

## 07 ලැබීම් ගෙවීම් පිළිබද මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තා

**ගරු නගරාධිපති - ඩබ්ලිව් .සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි 2021.11.12 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021 ඔක්තෝබර් මාසයට අදාල මුල්‍ය වාර්තාව ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

## 08 පුද්ගලික ස්භාවයේ කරුණු

**මහ නගර සභා මන්ත්‍රි - එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය**

ගරු නගරාධිපතිතුමණි, ලුනාව ළමා උද්‍යානයට අද පත්වෙලා තියෙන ඉරණම සම්බන්ධයෙන් උයන කොට්ඨාශයේ නාගරික මන්ත්‍රිවරිය වශයෙන් කලකිරිමට පත්වෙනවා.ගරු නගරාධිපතිතුමණි අද එය කැලයක් බවට පත්වෙලා.අපි ළමා උද්‍යානයක් සාදා නිමකරන්නේ දරුවන්ගේ මානසික සුවය, විනෝදය සතුට ආකල්ප සංවර්ධනය කරගන්න. ඉතින් නගරාධිපතිතුමණි මේ ළමා උද්‍යානය සැරෙන් සැරේ අගාදයට පත්කරන්නේ ඇයි?

**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය ඔබතුමිය කථාකරන්නේ මොකක් ගැනද? කොහේ එකක් ගැනද කථාකරන්නේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා ලුනාව ළමා උද්‍යානය උයන කොට්ඨාශයේ

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ඔබතුමිය වරද්දගෙන කථා කරන්නේ.උයන ළමා උද්‍යානයක් කිව්වාම මම කල්පනා කරනවා උයනේ ළමා උද්‍යානයක් කොහේද තියෙන්නේ කියලා.උයන කියලා කොට්ඨාශ එකක් තියෙනවා ඉඩම කියලා එකක් තියෙනවා.ඔය ඉඩමේ එකක් ගැන කථාකරන්නේ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමණි සමාවෙන්න ඉඩම කොට්ඨාශය කියලා අපි සඳහන් කරමු.නගරාධිපතිතුමණ ගිය පෙබරවාරි මාසයේ මේ ළමා උද්‍යානයට යාබද කලපුවට ඩයි වර්ගයක් දාලා මුලු කලපුවම දුගන්දයක් හැමුවා.

**<u>ගරු නගරාධිපති ඩබ්ලිව් සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය බොරු කියන්න එපා.ඩයි නෙමෙයි ඇල්ගී කියන විශේෂ ශාක වර්ගයක්

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමණි දුගන්දයක් හැමුවා එ ළමා උද්‍යානයේ. ඔබතුමා හැම වේලවේම අපි දෙයක් කථා කරන්න ගියෝත් කථා කරන්න දෙන්නේ නෑ.ඇයි එහෙම කරන්නේ.ළමා උද්‍යානයට මොනවාහරි දෙයක් දැම්මානේ.මම අහන්නේ ළමා උද්‍යානයක් කියන්නේ අපි දරුවෝ වෙනුවෙන් නිර්මාණය කරන දෙයක්. ළමා උද්‍යානයට වේලා තියෙන තත්වය ගැනයි කථා කරන්නේ.ඔබතුමා විවේචනය කරන්න නෙමෙයි ඔබතුමාට මේ පැහැදිලි කරන්නේ දරුවන් වෙනුවෙන් එය සුද්ධ පවිත්‍ර කරලා දෙන්න දරුවන්ගේ මානසික සුවය ලබන්න කරලා දෙන්න. නගරාධිපතිතුමා ඔබතුමා ඇහුන්කන් දෙන්න ඕන ඔබතුමා හැමවෙලේම අපිට දෙයක් කථාකරන්න දෙන්නේනෑ.එ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනවා.

.ගරු නගරාධිපතිතුමණි මාස 04 ක කාලයක සිට ඉදන් මගේ නම සඳහන් ශිර්ෂ ලිපි ලේඛන ඉල්ලලා ඉල්ලිමක් කරා. මට තාම ලැබිලා නැහැ.හැකි ඉක්මණින් එය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. ගරු නගරාධිපතිතුමණි සභාවෙන් ලිපිද්‍රව්‍ය දෙනවානේ ඉතින් ලිපිද්‍රව්‍ය වලත් ගරු නගරාධිපතිතුමණි අපි ඉල්ලිම කරනවා මේ මේ අවශ්‍ය දේ දෙන්න කියලා.එ වුනාට අපි ලිපිවලින් ඉල්ලුවාට අපිට හම්බවෙන්නේ සුලු ප්‍රමාණයයි. නමුත් සභාවේ සල්ලි නෑ කියලා ඉල්ලන දේ ලැබෙන්නේ නැහැ.එතකොට අපි ලියුම්වලින් හැමදේම අපේ අත්සන සහිතව ගන්නේ එතකොට අපි ගත්තාවෙනවා.එවුනාට අපිට ගිය මාසේ ලැබුණේ හාප්ෂිටුයි, පෑන් 04 යි, ෆයිල්

කවර පමණයි. අපි අත්සනක් සහිතවනේ දෙන්නේ එනිසා ඔබතුමාගේ අවධානය යොමුකරනවා. සභාවේ අවතක්සේරු කරන්න නෙමෙයි කියන්නේ

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි පුද්ගලික ස්භාවයේ කරුණක් තියෙනවා ඉදිරිපත් කරන්න කල්දේමුල්ල ර්බට් පටුමගේ වරිපණම් අංක 85 එ අතුරු මාර්ගයක් තියෙන්නේ එක සංවරධනය කරලා දෙන්නත් එ වගේම කල්දමුල්ල දහම්පුර 271/2 මාර්ගයත් සංවර්ධනය කරලා දෙන්න.

**<u>ගරු නගරාධිපති ඩබ්ලිව් සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා ලක්ෂ 15 දෙනවානේ ලබන අවුරුද්දට එකෙන් කරගන්නකෝ.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා මේ අවුරුද්දේ කරලා දෙන්න කියලා කියන්නේ.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමිය ඔබතුමිය ලිපිද්‍රව්‍ය ඉල්ලුවත් එ ලිපිද්‍රව්‍ය ගබඩාවේ නැත්නම් ගබඩාවේ නැහැයි කියන එකත්, ලිපිද්‍රව්‍ය ගන්නවා කියන එකත්, හැමතිස්සේම ගල් නැතිවේලාවල් තියෙනවා තාර නැති වේලාවල් තියෙනවා. ලිපිද්‍රව්‍ය නැතිවෙලාවල් තියෙනවා. එහෙම වෙච්ච අවස්ථා ඔන තරම් තියෙනවා.එ හැර හිතාමතාම මන්ත්‍රිවරියක් මන්ත්‍රිවරයෙක් මුල් කරගෙන ලිපිද්‍රව්‍ය නොදී ඉන්න තත්වයක් නැහැ.එ අවස්ථාවලට ගලපගෙන තමයි එ දේවල් කරන්නේ. මන්හිතන්නේ නෑ ආණ්ඩු පක්ෂය, විපක්ෂය කියලා ඉල්ලන සියලු දේම දෙන්නේ නැහැ.යම් ප්‍රමාණයක් දෙනවා.

ගරු මන්ත්‍රිතුමිය ඔබතුමිය කියන ළමා උද්‍යානය කවදාවත් එතන හැදෙන්නේ නැහැ.ලබන අවුරුද්දේ ළමයි 12000 කට කියවීම් ශාලාවක් එතන තට්ටු දෙකට හැදෙනවා. එ ළමා උද්‍යානය ඉස්සහාට එනවා.හෝජුන් හලක් හැදෙනවා. අපි එය සැලසුම් කරලා ඉවරයි. 2022 දි ඔය ළමා උද්‍යානය ඔතනින් අයින්වෙලා වේල්ස් කුමරි, වේල්ස් කුමර, ශාන්ත සේබස්තියන්, මෙතෝදිස්ථ විද්‍යාලවල දරුවන්ට කියවීම් ශාලාවක් අංග සම්පුර්ණ තට්ටු දෙකේ කියවීම් ශාලාවක් ඔය ස්ථිනයේ හදනවා. ළමා උද්‍යානය ඉස්සරහට ගෙනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - සුදර්ශණි පියන්තිකා</u>**

ගරු නගරාධිපතිතුමණි එම දේවල් වෙනවානම් අපි සංතෝශයි.

09 වෙනත් කරුණු නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු

නගරාධිපති,

මොරටුව මහා නගර සභාව,

මොරටුව.

2021.12.02 දින,

මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.